
# මෙයයි ඉස්ලාමය

ඉතා වේගයෙන් වර්ධනයවන
ආගම් පිළිබඳ දැක්මක්





මෙය අල්ලාහ් තම දූතයා ඉබ්රාහීම් අලයිහිස් සලාම් තුමානන්ට සාදා නිම කරන ලෙස අණකර ලද.තවද මුස්ලිම්වරුන් ලොවෙහි කොතනක සිටියත් තම සලාතයන්හි එම දිසාවටම මුහුණලා සිටින්න යනුවෙන් අණ කරන ලද කංබාවේ අහසින් දිස්වන ජායාරූපයකි.

THIS IS ISLAM

ح دار الدليل المعاصر للنشر والتوزيع ، ١٤٤٣هـ

***فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر***

باهمام ، فهد بن سالم

هذا هو الإسلام باللغة السنهالية. / فهد بن سالم باهمام - الرياض ،١٤٤٣هـ

١٥٦ ص ، ٢٢ X ١٥ سم

ردمك: ٩-٤-٩١٤٠٨-٦٠٣-٩٧٨

١- الاسلام - مبادئ عامة أ.العنوان

ديوي ٢١١ ١٤٤٣/١٦١٥

رقم الإيداع : ١٤٤٣/١٦١٥

ردمك: ٩-٤-٩١٤٠٨-٦٠٣-٩٧٨

පළමු වන මුද්‍රණය
**2023**

සෑම වර්ගයේ මුද්‍රණ, පරිවර්ථන කිරීමා මා බෙදා හැරීමේ
අයිතිය අද් දලීලුල් මුආසිර් සමාගමට පැවරිනි.

# මෙයයි ඉස්ලාමය

පහද් සාලිම් බාහම්මාම්



- ඔබ අවට ඇති මාධ්‍යයන්ගෙන් ඉතා තර්කානුකූල ධර්මය වඩාත් පැහැදිලි රූපයකින් දැකීම අනවශ්‍ය යනුවෙන් ඔබ සිතන්නේද?
- ජාත්‍යන්තර සංඛ්‍යාලේඛන අනුව ඉතා වේගයෙන් වර්ධනය වන හා පුළුල්තම ධර්මය පැහැදිලිවම හැදෑරීමට මොහොතක් වෙන් කිරිම නුසුදුසු යැයි ඔබ සිතන්නේද?
- අන් ආගමිකයින්ගේ සංස්කෘති හා දර්ශන පිළිබඳ දැනුවත් වීමෙහි තෘප්තියක් ඔබ නොලබන්නේද?
- ඉස්ලාම් ධර්මය හා සම්බන්ධ ඔබ දැන සිටින කරුනු සත්‍ය දැයි බැලීම පිණිස ඉස්ලාමයේ සනාථ මූලාශ්‍රයන් වෙත ඔබේ බැල්ම යොමු නොකරන්නේ මන්ද? එසේ ඔබ කළ විට ඔබට ඔබේ බුද්ධියෙන්ම ඒ පිළිබඳ තීන්දුවක් ගත හැකිය.

එසේ දැන ගැනීමට ඔබ සූදානම්ව සිටින්නේ නම් මෙම ග්‍රන්ථය ඔබගේ රන ගවේෂණයට උපකාරී වනවා නිසැකයි

# ශුද්ධ කුර්ආනයේ පැමිණායේ කොතැනින්ද?

# 84

මුස්ලිම් වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වන ශුද්ධ කුරආන් පුස්ථකය හා ඔවුන්ගේ දූතයා වන මුහම්මද් නබි (සල්) තුමානන් පිළිබඳව මුස්ලිම් ජනයින් පවසන දේ විශ්වාස කළ හැක්කේ කෙසේද යන ප්‍රශනය බොහෝ දෙනෙකුට ඇති විය හැකිය



# ග්‍රන්ථයේ මාතෘකා


අප සියළු දෙනාට ඇති විය හැකි ප්‍රශ්න — 12

- ඉස්ලාම් ධර්මය
- ඉස්ලාම් යන වචනයෙහි අර්ථය
- ඉස්ලාමය සෑම දූතයින්ගේම ධර්මයයි

ඉස්ලාමය ලොවේ සියල්ලන්ටම සතුය — 16

- පරිසරය රැකබලා ගැනීම ඊමානයේ අංගයකි
- දැනුමේ ධර්මයයි
- මිනිසාගේ ජීවිතයේ සෑම පැතිකඩක්ම ඉස්ලාමයෙහි අන්තර්ගත වෙයි
- ඉස්ලාමය යනු බෙදාහදා ගැනීමේ දහමයි

එකම මැවුම් කරුවා හා එකම දෙවියා — 32

- ස්වභාව ධර්මයේ නීතිය හා ෂරීආ නීතිය අතර වෙනස
- යම් පුද්ගලෙයකු උදෙසා කරන නැමදීම්වලට ඉස්ලාමෙයේ අනුමැතිය නැත.
- ඉස්ලාමයට ඇතුල් වීමට විශේෂ චාරිත්‍රයක් තිබේද?

සත්‍යයෙන්ම  දූතයින් කවුරුන්ද? — 40

- දූතියින් මිනිසුන්ය
- දූතයින්ගේ තත්වයෙහි මධ්‍යස්ථබව
- දූතයින් පිළිබඳ ඉසලාමයේ බැල්ම

ඊසා තුමානන් පිළිබඳි ඉස්ලාමයේ බැල්ම — 44

ඉස්ලෙමයේ දූතයා කවුරුන්ද ? — 50

- ඉස්ලාමයේ දූතයා වන මුහම්මද් (සල්) තුමානන් ගැන හඳුනා ගැනීමට ඉක්මන් ගමනක්

මධ්‍යස්ථ මතෙහි ඇත්තන්ගේ බැල්මෙහි ශුද්ධලාගේ දූතයා පිළිබඳ මතය — 56

මුහම්මද් (සල්) තුමානන්ගේ ඇතැම් චෘතාන් හා ඔහුගේ ගුණාංග කිහිපයක් ______ 62

- ඔහුගේ නිහතමානීබව
- දයාව
- යුක්තිගරුක බව
- ඔහුගේ උදාරත්වය හා උපහාරය
- ඔහුගේ ඉවසීම
- ලොවෙහි දෑ කෙරෙහි කිසි ආශාවක් නොදැක්වීම
- පොරොන්දුව ඉටු කිරීම

නබි මුහම්මද් (සල්) තුමානන්ගේ ඇතැම් වදන්- ______ 72

ශුද්ධ කුර්ආනය ඉස්ලාමයේ නිරන්තර ආශ්චර්‍යයයි ______ 78

- ශුද්ධ කුර්ආනය ආරක්ෂා කිරීමේ ආශ්චර්‍යය
- ශුද්ධ කුර්ආනයේ ඇති අධ්‍යාත්මික ආශ්චර්‍යයන්

ශුද්ධ කුර්ආනයේ පැමිණයේ කොතැනින්ද? ______ 84

- කුර්ආනයට විටින් විට ඇති වන චෝදනා
- මෙම ශුද්ධ කුර්ආනය අපද සුහදතාවයෙන් බැලිය යුතු නොවවේද?
- සමහර විට එය නැවත සකස් කරන ලද ග්‍රන්ථයක් නිය හැකිද?
- ඉතිහාසික සථ්‍යය
- ශුද්ධ ඟාතිහා පරිච්චේදය

ඉස්ලාමයේ ඇති නැමදුම් හා එවායේ යථාර්තය ______ 94

- ඉස්ලාමයේ කුළුනු
- පැවරුම් හා පරීක්ෂණයන් තබා ඇත්තේ මන්ද?
- සලාතය
- සලාතය
- උපවාසය
- හජ් වන්දනාව

ඉස්ලාමයේ බැල්මෙහි පවුල ______ 110


- විවාහ කර පවුල් ජීවිතය ආරම්භ කිරීම ඉස්ලාමය අනිවාරය කර ඇත
- ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂයටම ඉස්ලාම් පරිපූර්න අයිතිය හා ගෟරවය ලබා දී ඇත
- දෙමව් පියන්ට ගෟරවය කර ඔවුන්ව රැතබලා ඔවුන්ගේ මනය තෙක් ඔවුනන්ට අවනත විය යුතු යැයි ඉස්ලාම් දිරිගන්වා ඇත
- දරුවන්ගේ වගකීම ආරක්ෂා කර ඔහුන් අතර සමානව කටයුතු කරන මෙන්ද ඉස්ලාමිය අනිවාර්‍ය කර ඇත
- ඥාති සම්බන්ධතා රැක ගැනීම මුස්ලිම් වරයාගේ වගකීමයි



# ඉස්ලාමයේ බැල්මෙහි පවුල

110

පවුලක් යනු එකම නිවසක විවිධ ආකාරයෙන් සමන්විත සාමාජිකයින් යන අර්ථය දේ.



# ධර්මය හා බුද්ධිය

136

ඉස්ලාම් ධර්මය හා එහි ජීවන රටාව බුද්ධියට පටහැනි වන බව ඇතැමුන් සිතති. මන්දයත් ඔවුන්ගේ දසුන අනුව ධර්මයක් යනු මිත්‍යා මත ගොඩ නැගුනු විශ්වාසයකි. අත්දෑකීම් හා චින්තනයන් මාර්ගයෙන් නිසි ජීවන පරිපාලනයක් ඇති කළ හැක්කේ මිනිසාගේ බුද්ධියෙන් හා දර්ශනය මගින් පමනි. ඇතැම් අවස්ථාවන්හි ධර්ම විෂයයන් මිනිසාගේ වැටහීමට ගෝචර වන අවස්ථාද තිබෙන බැවින් මෙම මතය වැරදි මතයක් යැයි එකහෙලා පැවසිය නොහැකිය.

## ස්ත්‍රීන්ට ඉස්ලාමය දී ඇති ස්ථානය —— 116

- ස්ත්‍රීන්ව ඉස්ලාම් ගව්රය කර ඇති බව පැහැදිලි කර ඇති ඇතැම් රීතීන්
- විශේෂ අවදානමක් යොමු කල යුතු යැයි ඉසලාම් පවසන ස්ත්‍රීන්
- මොවුන් දෙපිරිස අතර කිසි ගැටලුවක් තිබිය නොහැකිය
- ස්ත්‍රී හා පුරුෂයා අතර ඇති බැඳීම
- ස්ත්‍රී පැරුෂයින් අතර සම්බන්ධතාවයෙහි ඉස්ලාමයේ බැල්ම
- අන්‍ය පුරුෂයින් ඉදිරියේ ස්ත්‍රීන් හිජාබය පැළඳිය යුත්තේ මන්ද?
- ස්ත්‍රී පුරුෂයින් අතර සැළකිය යුතු ඇතැම් කරුනු

## ආහාර පානයන්හි ඉස්ලාම් නීති —— 126

- ඌරා
- මත් පැන් හා මද්‍යසාර
- මද්‍යසාර හා මත් ද්‍රව්‍ය සමඟ ඉස්ලාමහි මත කෙසේද?

## පාපය හා පාපොච්චාරනය —— 132

## ධර්මය හා බුද්ධිය —— 136

- සත්‍යය වටහා ගැනීමට බාධාවක් විය හැකි කරුණු යැයි ශුද්ධ කුර්ආනය අනතුරු අඟවන කරුනු

## ඉස්ලාමය සාමයේ ධර්මයයි —— 142


- ලොවෙහි වේගෙයන් පැතිරෙන ධර්මය ඉස්ලාමයයි
- මිනිසුන් ඉස්ලාමය පිළිගත යුතු යැයි ඉස්ලාමය බල කරයිද?

## ඉස්ලාමය හා ඇතැම් මුස්ලිම් වරුන්ගේ තත්වය —— 148

- නව කෝනයක්



# අප සියළු දෙනාට ඇති විය හැකි ප්‍රශ්න



අපි කවුරුත් අප ජීවිතයේ ඇතැම් අවස්ථාවන්හි කල්පනා කරන කරුනු ඇත. මා හාදාරන දේ කුමක්ද? මා කවුද? මා පැමිණියේ කොතැනින්ද? මරණින් පසු මා යන්නේ කොතැනද? මෙම මුළු විශ්වයේ පැවැත්වීමේ අරමුණ කුමක්ද? මේ සියල්ල හුදෙක් මරණයත් සමග පස් බවට පත් වී නැති වී යන්නක්ද ?

මුස්ලිම්වරුන් මෙන්ම අනෙකුත් දිව්‍යමය ධර්ම අදහන්නන්ගේ විශ්වාසය නම්, සත්‍ය මැවුම්කරුවෙකු සිටින බව හා සිල්වතුන් තම යහ ක්‍රියා වෙනුවෙන් එයට නිසි කුසල ලබා ගැනීම පිණිස හා පාපපතරයින් තමන්ගේ පාපයේ දඬුවම ලබනු පිණිස මරණින් පසු නිරන්තර ජීවිතයක් ඇත යන්නයි. තවද එසේ මරණින් මතු නිරන්තර ජීවිතයක් නොමැති නම්, ලොවේ අසිරු ජීවිතයේ කිසි අර්ථයක් නැත යන්න ඔවුන්ගේ විශ්වාසයයි.

> කෙසේ වෙතත් මෙම ධර්මයේ යථාර්තය හා එහි තීක්ෂණය දැනගැනීමට නම් සත්‍ය සර්ව බලධාරියාව විශ්වාස කළ යුතුයි.

යුක්ති ගරුක සත්‍ය දෙවියෙකු නොමැති විට ලොවේ ජීවිතයෙහි යහපත කුමක්ද සහ අයහපතද කමක්ද යන්න පිළිබඳ තීරණය කිරීමට නොහැකි ලොවෙහි ජීවිතයේ සෑම කරුනක්ම පැහැදිලි කර එහි ප්‍රතිඵලය මරණින් මතු ඇති නොවේ යැයි විශ්වාස කළ විට ලොවේ ජීවිතය සම්පුර්ණ වන්නේද නැත

ඉවසීම, සත්‍ය කථා කිරීම, දයාවෙන් හා කරුණාවෙන් කටයුතු කිරීම යනාදී යහක්‍රියාවන්හි ඇති ආශාව මගින් පෙන්නුම් කරන්නේ මරණින් මතු ඇති නිරන්තර ජීවිතයයි. නැතිනම් මේවායෙහි නිසි අර්ථයක් තිබිය නොහැකියි.

අති විශාල විශ්වය මවා ඇත්තේ මෙවැනි ඉමහත් අවශ්‍යතාවයක් පිණිසයි.මේ සියළු මැවීම් දෙස බලා ගැඹුරින් කල්පනා කරන්නන් ගැන පරිශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:'තවද අහස හා පොළොව මැවීම් පිළිබඳද ඔවුන් සිතති ඕ අපගේ හිමියනි ඔබ මෙය නිකරුණේ නොමැවුවෙහියි ඔබ සුවිශුද්ධය' (යැයි පවසා ප්‍රාර්ථනා කරති (ආලු ඉම්රාන් ඃ 191)

## ඉස්ලාම් ධර්මය :

ලොවේ සෑම ආගමක්ම නම් කරනු ලැබී ඇත්තේ යම් පුද්ගලයකු හා සම්බන්ධ නමකින් හෝ එම ආගම පැතිරී ඇති රට හෝ ස්ථානයේ නමින්යි උදාහරන වශයෙන්, ක්‍රිස්තියානි ආගම ජේසුස් වහන්සේ හා සම්බන්ධ නාමයකි. හින්දු ආගමින් අදහස් වන්නේ ඉන්දියාවයි කතෝලික ආගමේ නම එක් ගෝත්‍රිකයක නමකි. බෞද්ධාගම යන වචනයද බුද්ධ යන වචනයෙන් උපුටා ගනු ලැබූ නමකි.

කෙසේ වෙතත් ඉස්ලාම් යන වචනය කිසි පුද්ගලයකුට හෝ ස්ථානයකට අයත් නමක් හෝ එක් පාර්ශවයක් සඳහන් කරන වචනයක් නොවේ.

මෙය යම් කිසි පිරිසකට පමණක් ආවේනික වූ දහමක් නොවීම එයට හේතුව වේ. එසේත් නොමැති නම් මෙය මිනිසුන් විසින් පත් කරනු ලැබූ ආගමක් නොවීම තවත් හේතුවකී මේ සියල්ලටම පොදු නාමයක් ලෙස ඉස්ලාම් යැයි නම් කෙරිනි.

ඉස්ලාම් යන අරාබි වචනයේ මුල් පදය බැලූ කල එයට අර්ථ කිහිපයක්ම ඇත ශාන්තිය,අවනත වීම, යටහත් වීම, විශ්වාසය, සැනසිල්ල හා අවංක වීම යන අර්ථ දැක්විය හැකියි.

## ඉස්ලාම් යන වචනයෙහි අර්ථය :

ඉස්ලාම් යන අරාබි වචනයේ මුල් පදය බැලූ කල එයට අර්ථ කිහිපයක්ම ඇත ශාන්තිය,අවනත වීම, යටහත් වීම, විශ්වාසය, සැනසිල්ල හා අවංක වීම යන අර්ථ දැක්විය හැකිය.

ඒ අනුව ඉස්ලාම් යැයි පවසන විට එහි අර්ථය නම්, සර්ව බලධාරියාට යටහත් වී පරිපූර්ණයෙන්ම අවනත වී ඔහු නොවන කිසි කෙනෙකුට නැමදීමෙන් වැලකී සිටීමයි.

නොයෙක් ශුද්ධ කුර්ආන් වැකිවලින් තහවුරු කර ඇති අර්ථය මෙයයි.

පහත ශුද්ධ කුර්ආන් වැකිය ඉන් එකකි:

'තවද කවුරුන් යහක්‍රියා කරන්නෙක්ව තමාගේ මුහුණ අල්ලාහ්ට භාර කරන්නේද නිශ්චය වශයෙන්ම ඔහු සවිමත් කඹය අල්ලා ගත්තේය තවද

සෑම කාරියකම අවසානය අල්ලාහ් වෙතය' (සූරා ලුක්මාන් 22)

එබැවින් මුස්ලිමෙකු යනු අල්ලාහ් නොවන අන් කිසි කෙනෙකුට කිසිම නැමදීමක් නොකර අල්ලාහ්ට පමණක් අවංක වී ඔහුට නැමදුම් කරන අතර අන් අයට කිසි හිරිහැරයක් නොකර ඔවුන්ට ශාන්තිය ඇති වන සේ ජීවත් වන්නායි.

ඉස්ලාම් ධර්මය සෑම දූතයින්ගේම ධර්මයද?

## ඉස්ලාමය සෑම දූතයින්ගේම ධර්මයයි :

විවිධ වකවානුවල වාසය කළ ජන සමූහයන් කරා අල්ලාහ්ගේ ධර්මය දේශනා කරන දූතයින් පැමිණ ඇත මේ බව අල්ලාහ් ශුද්ධ කුර්ආනයෙහි මෙසේ පවයි:සත්‍යය මගින් සුබාරංචි පවසන්නෙකු ලෙසින් හා අවවාද කරන්නෙකු ලෙසින්ම නිශ්චය වශයෙන්ම අප ඔබව එවා ඇත්තෙමු අවවාද කරන්නෙකු තමන් වෙත පැමිණ මිස කිසිදු සමූහයක් (ලොව සිටියේ) නැත (ෆාතිර්:24)

ඔවුන් සියල්ලන්ම පැමිණියේ සත්‍ය ධර්මය රැගෙනයි අල්ලාහ්ව විශ්වාස කිරීම, ප්‍රධාන නීති රීතින් හා ගතිගුණ හා සම්බන්ධ රීතින් ධර්මයේ මූලික කරුනුවල ඔවුන් අතර කිසි භේදයක් තිබුනේ නැත.වසර එක්දහස් හාරසීයට පෙර මුහම්ද් ﷺ තුමානන් ගෙන ආ ඉස්ලාම් ධර්මයේ මූලික හරය ඔහුට පෙර පැමිණි දූතයින් විසින් දේශනා කළ එම ධර්මයේ මූලික හරයමයි.වෙනස් වුයේ කාලන නීති රීති පමණි.ශුද්ධ කුර්ආනය අපට උගන්වන්නේ, මුහම්මද් (සල්) තුමානන්ව පමණක් නොව, ඉබ්රාහීම්, ඉස්හාක් මූසා හා ඊසා වැනි සෑම දූතයින්වම විශ්වාස කර ගෞරවය කරන ලෙසයි.

"අපි අල්ලාහ්වද,අප වෙත පහළ කරන ලද දෙය (වන කුර්ආනය)ද ඉබ්‍රාහීම්, ඉස්මායීල්,ඉස්හාක් හා යඃකූබ් (හා ඔවුන්ගේ) දරුකැළට පහළ කරන ලද දෙයද, මූසා හා ඊසාට දෙන ලද දෙය (එනම් තව්රාතය හා ඉන්ජීලය) හා (අනෙකුත් සියළු) දූතයන්ට ඔවුන්ට හිමි විසින් දෙනු ලැබූ දේද විශ්වාස කරමු ඔවුන්ගෙන් කිසි කෙනෙකු අතර අප වෙනසක් නොදක්වමු තවද අප ඔහුට යටහත් වන්නන්ය'යයි (ඕ මුහම්මද්!) පවසන්න" (සූරා බකරා 136)

ඉබ්රාහීම් හා ඉස්හාක් වැනි නබිවරුන් තම මරණාසන්නයෙහි සිය පුතුන්ට ඉස්ලාම් ධර්මය අත් නොහරින ලෙස උපදෙස් කරනු ශුද්ධ කුර්ආනයෙහි සඳහන් වී තිබෙනු දැක ගත හැකිය.

"ඉබ්‍රාහීම් සිය පුත්‍රයන්ටද, යඃකූබ් සිය පුත්‍රයන්ටද 'මාගේ පුත්‍රයිනි! නිශ්චය වශයෙන්ම අල්ලාහ් ඔබට (ඉස්ලාම්) ධර්මය තෝරා ඇත්තේය එබැවින් ඔබ මුස්ලිම්වරුන් ලෙසින් මිස මරණයට පත් නොවනු' යයි (එකසේ) අනුශාසනා කළහ" (සූරා බකරහ් 132)

එබැවින් සෑම දූතයින්ගේම ධර්මය ඉස්ලාමය වු අතර ඔවුන්ගේ ධර්මයේ ඒක දේවවාදය යන ප්‍රධාන ප්‍රතිපත්තියෙහි කිසිදු වෙනසක් තිබුනේ නැත. කෙසේ වෙතත් නබි මුහම්මද් ﷺ තුමානන් පැමිණෙන තුරු විවිධ දූතයින් ඔවුන්ගේ ජනසමූහයන්ට දෙසූ නිර්දේශ හා ඔවුන්ගේ කාලයට අවේනික නැමදුමෙහි රටාවන් එක් එක් ආකාරයට තිබුනි.

එබැවින් ශුද්ධ කුර්ආනය අපට පැහැදිලි කරන්නේ සෑම දිව්‍යමය ධර්මයක්ම එකක් යනුවෙනි එනම් එය ඉස්ලාමයයි. කෙසේ වෙතත් සත්‍ය ධර්මයන් අතර අප දකින වෙනස්කම් මිනිසුන් පසුව ගෙතූ දේ මිස එය සත්‍යයක් නොවේ.මෙම ශුද්ධ කුර්ආන් වැකිය පැහැදිලි කරන්නේද මෙයයි:

"නිශ්චය වශයෙන්ම අල්ලාහ් වෙත (පිළිගැනුනු එකම) ධර්මය ඉස්ලාමයයි. තවද පුස්තකය දෙනු ලැබූවන් ඔවුන් අතර ඇති ඊර්ෂ්‍යාව නිසා ඔවුන්ට (සත්‍යය පිළිබඳ) දැනුම පැමිණියාට පසුව මිස ඔවුන් මතභේද ඇති කර ගත්තේ නැත තවද කවුරුන් අල්ලාහ්ගේ සාධක ප්‍රතික්ෂේප කරන්නේද, නිශ්චය වශයෙන්ම අල්ලාහ් (ඔවුන්ව) පනිසය කිරීමෙහි ඉතා සීඝ්‍රය" (ආලු ඉම්රාන් 19)

# ඉස්ලාමය ලොවේ සියල්ලන් සතුය





ශුද්ධ කුර්ආනය පහල වූයේ අරාබි බසින් වුවද හා අවසාන නබි මුහම්මද් (සල්) තුමානන්ද අරාබින් වෙත යවනු ලැබූ තිබුනද ශුද්ධ කුර්ආන්හි “අරාබි” යන වචනය සඳහන් නොවී තිබීම විශ්ම ජනක දෙයකි.තවද සමස්ත මුස්ලිම්වරුන් අතුරින් ආරාබි මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යයව 20% ට වඩා අධික නොවේ. එපමණක් නොව, දකුණු ආසියාවේ අති විශාල ඉස්ලාම් රාජ්‍යය ඉන්දුනේසියාවයි.ඉන්දියාවේ සුළුතර මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව පවා, අරාබි රටවල් අතුරින් විශාලතම රටෙහි මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාවට වඩා දෙගුණයට ආසන්න වේ.

මෙයින් පැහැදිලි වන්නේ ඉස්ලාමය අරාබිවරුන්ට පමණක් අයත් ආගමක් නොවන බවයි පහත ශුද්ධ කුර්ආන් වැකිය මෙය සනාථ කරයි.


"(ඕ මුහම්මද්!) ඔබව ලෝවැසියාට ආශිර්වාදයක් ලෙසින් මිස අප නොඑවුවෙමු" (සූරා අන්බියා 107).

ඉස්ලාම් ධර්මය මිනිසුන් අතර විවිධ තරාතිරම් දෙසන තබන ධර්මයක් නොවේ යැයි අපි නොකියමු එනමුත් මිනිසුන්ගේ තරාතිරම් ඇති කිරීමට ඉස්ලාමය, ලොවේ අන් කිසිම ධර්මයක් හෝ දර්ශනයන්ට වඩා සහමුලින්ම වෙනස් ක්‍රමයක් අනුමනය කරනු දැකිය හැකිය.

පහත ශුද්ධ කුර්ආන් වැකිය බැලූ විට එය කුමක්දැයි පැහැදිලි වනු ඇත."මිනිසුනි නිශ්චය වශයෙන්ම අප ඔබව එක් පුරුෂයෙක් හා එක් ස්ත්‍රියකින් මැවුවෙමු.තවද ඔබ එකිනෙකා හඳුනාගනු පිණිස ඔබව ජාතීන් හා ගෝත්‍ර බවට පත් කළෙමු නිශ්චය වශයෙන්ම අල්ලාහ් වෙත ඔබ අතුරින් උසස් වන්තයා බියබැතියන්ය.නිශ්චය වශයෙන්ම අල්ලාහ් මනාව දන්නා සංවේදියා" (සුරා අල් හුජ්රාත් 13)

මෙම ශුද්ධ කුර්ආන් වැකිය අපට උගන්වන කරුන නම්, මිනිසා කුමන වර්ණයක වුවද, කුමන් ගෝත්‍රයට අයත් කෙනෙකු වුවද ඔහුට එය අනුව කිසිදු උස් පහත් කමක් නැත යනුවෙනි. මන්දයත් මොවුන් සියල්ලන්ම ආදම් හා හව්වා යන දෙදෙනාගේ දරුවන්ය. ඔවුන් අතර ඇති වර්ණ හා කුල වෙනසකම් තරාතිරම් මිණීමට ඇති නිර්ණායකකය නොවේ එහි අරමුණ වන්නේ එකිනෙකා හඳුනා ගැනීමය එබැවින් කෙනෙකුගේ ගෞරවය රැඳී ඇත්තේ ඔහු අල්ලාහ්ට බියබැති වීමේ මට්ටමෙහිය.

> මිනිසුන්ගේ උස් පහත් භාවය ඇති කිරීමට ඉස්ලාමය, ලොවේ අන් කිසිම ධර්මයක් හෝ දර්ශනයන්ට වඩා සහමුලින්ම වෙනස් නිර්ණායකයක් පෙන්නුම් කර දී ඇත.



ඉස්ලාමයේ දූතයා මුහම්ද් (සල්)

"මිනිසුනි! මා හට හොඳින් සවන් දෙන්න. නියතවශයෙන්ම ඔබගේ දෙවියා එකම දෙවියාය. ඔබ සියල්ලන්ගේම පියා එකම පියාය. නියතවශයෙන්ම අරාබි නොවන්නෙකුට වඩා අරාබි වරයෙකුට හෝ අරාබි වරයෙකුට වඩා අරාබි නොවන්නෙකුටද සුදු ජාතිකයකුට වඩා කළු ජාතිකයකුටද කළු ජාතිකයකුට වඩා සුදු ජාතිකයකුටද කිසිම උසස් බවක් නැත.උසස් බව ඇති වන්නේ බියබැතිබවින්ය"

මානව හිමිකම් පිළිබඳ ලොවෙහි පළමු හා ශ්‍රේෂ්ඨතම වගන්තිය නිල වශයෙන් දැනුම් දීම...

මිනිසුන් අතර නිදහස, සමාන අයිතිවාසිකම හා ගරුත්වය තහවුරු කරනු ලැබුනේ...

630 වන වසරෙහි.

1948 වන වසරෙහි.

මෙසේ මිනිසුන් අතර විවිධ වර්ණ, පෙනුම් හා විවිධ සංස්කෘතියන් ඇති කර තිබීම අල්ලාහ්ගේ දායාදයක් යායි ශුද්ධ කුර්ආන් වැකියක් අපට අවධාරනය කරයි:

"අහස් හා පොළොව මවා තිබීමද ඔබගේ බාසා හා (සමෙහි) වර්ණ විවිධාකාරයෙන් තිබීමද ඔහුගේ සාධක අතුරින් වේ දැන ගන්නන්ට මෙහි නිශ්චය වශයෙන්ම සාධක ඇත " (සුරා අර් රූම් 22)

මිනිසුන් අතර නිදහස, සමාන අයිතිවාසිකම් හා ගරුත්වය තහවුරු කරන මිනිසුන් අතර සමානතාවය පිළිබඳ ලොවෙහි පළමු ප්‍රකාශය නිල වශයෙන් දැනුම් දෙනු ලැබුවේ 1948 වන වසරේයි ඉන් පසුවයි එය ක්‍රියාත්මක වූයේ එනමුත් නබි මුහම්මද් (සල්) තුමානන් වසර 1400ට පෙරම මේ පිළිබඳව හඬ නගා මානව හිමිකම් සංකල්පය සඳහා නව ආරම්භයක් ඇති කළේයි මිනිසාගේ පොදු අයිතිය පිළිබඳව ඔහු එක් දේශනාවක මෙසේ පැවසුවේය:

"මිනිසුනි! මාහට හොඳින් සවන් දෙන්නී නියතවශයෙන්ම ඔබගේ දෙවියා එකම දෙවියායි ඔබ සියල්ලන්ගේම පියා එකම පියායි නියත වශයෙන්ම අරාබි නොවන්නෙකුට වඩා අරාබි වරයෙකුට හෝ අරාබිවරයෙකුට වඩා අරාබි නොවන්නෙකුටද සුදු ජාතිකයකුට වඩා කළු ජාතිකයකුටද කළු ජාතිකයකුට වඩා සුදු ජාතිකයකුටද කිසිම උසස් බවක් නැති උසස් බව ඇති වන්නේ බියබැති බවෙහිය" (අහ්මද් 23489)



## පරිසරය රැකබලා ගැනීම ඊමානයේ අංගයකි :

ඇතැම් දාර්ශනිකයින්, විශ්වයේ පැවැත්මෙහි මිනිසාට විශාල නායකත්වයක් ඇත යැයි විශ්වාස කරත මෙයට පටහැනිව තවත් පිරිසක්, මිනිසාට අන් ජීවීන්ට වඩා කිසිඳු සුවිශේෂිත්වයක් නොමැත යනුවෙන් හා ඔහුද අන් මැවීම් මෙන් එක් සමාන මැවීමක් යැයි පවසති මේ හා සම්බන්ධ ඉස්ලාමයේ බැල්ම කුමක්ද?

මේ පිළිබඳ ඉස්ලාමයේ ඍෂ්ධී කෝණය ඊමාන් හා න්‍යාය දෙක අතර ඇති සංකල්පයකි එනම් මිනිසාට විශ්වයේ පැවැත්මෙහි පරිපූර්න ශක්තියක් නොතිබුනද යම් අන්දමින් ඔහුට එහි වගකීමක් ඇත ඉස්ලාමීය ස්ථාවරයයි

මිනිසා අන් ජීවීන් මෙන්ම එක් මැවීමක් හා ඔහුට විශ්වයේ පැවැත්මෙහි කිසිම වගකීමක් නැත යැයි පවසන තර්කයට ශුද්ධ කුර්ආනය මෙසේ පිළිතුරු දෙයි

"තවද අප ආදම්ගේ දරුවන් නිශ්චය වශයෙන්ම ගෞරවයට පත් කර ගොඩ බිමෙහි හා මුහුදෙහි ඔවුන්ව අප උසුලමින් යන්නෙමු හොඳ දෙයින් අප ඔවුන්ට ආහාර දී අප මැවූ දේවලින් බොහෝමයකට වඩා අප ඔවුන්ව ඉතා උසස් කර ඇත්තෙමු" (සූරා අල් ඉස්රා 70)

"අල්ලාහ් කෙබන්දෙක්ද යත් අහස් හා පොළොව මැවූවේ ඔහුය තවද අහසින් ජලය පහළ කර එමගින් ඔබට ආහාර වශයෙන් ගෙඩි වර්ග පිට කරන්නේය තවද නෞකාව ඔහුගේ අණ පිරිදි මුහුදෙහි ගමන් කරන්නක් ලෙසින් එය ඔබ වසයට පත් කර ඇත්තේය තවද ගංගාද ඔහු ඔබ වසයට පත් කර ඇත්තේය(32) තවද ඉරු හා සඳ යන එම දෙකම (එහි ගමන් පථයේ නියමිත පරිදි) ගමන් කරන්නා සේ එයද ඔහු ඔබ වසයට පත් කර ඇත්තේයි තවද රාත්‍රිය දහවලද ඔහු ඔබ වසයට පත් කර දී ඇත්තේය"(33) (සූරා - ඉබ්රාහීම් 32 සහ 33)

"පොළොවෙහි ඇති සියල්ල ඔබ වෙනුවෙන් මැවුවේ ඔහුමයි පසුව ඔහු අහස දෙසට යොමු වී එය අහස් හතක් ලෙසින් සැකසුවේයි තවද ඔහු සියලු දේ ගැන දන්නාය" (සූරා අල් බකරා 29)

ඉහත වැකියෙන් පැහැදිලි වන්නේ මැවීම් අතුරින් ශ්‍රේෂ්ඨතම මැවිල්ල මිනිසා බව හා විශ්වයේ සියලු පහසුකම් මවා ඇත්තේ මිනිසා වෙනුවෙන් යන්නයි



කෙසේ වෙතත් මෙහි පාලන ශක්තියක් ඔහුට නැත යනුවෙන් ඉස්ලාමය තහවුරු කරයි එනම් ඔහු අන් මැවීම්වලට වඩා ශ්‍රේෂ්ඨ වීම නිසා ඔහුට විශ්වයේ පැවැත්මෙහි පරිපූර්ණ ශක්තියක් ඇත යනුවෙන් අර්ථය නොවේ මන්දයත් මේ සියල්ල ඇති වන්නේ සර්වබලධාරියා වෙතිනි එබැවින් මිනිසාට මේවායෙහි ඇති සම්බන්ධය නම්, විශ්වයේ නියෝජිතයකු ලෙස අල්ලාහ් ඔහුව පත්කර සියළු මැවීම් ඔහුගේ ප්‍රයෝජනය වෙනුවෙන් තබ තිබීමයි ශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:

තවද සමූද්(වරුන්) වෙත ඔවුන්ගේ සොහොයුරා වන සාලිහ්ව අප එවුවෙමු මගේ සමූහයනි! අල්ලාහ්වම ඔබ නමදින්නි ඔහු හැර ඔබට අන් දෙවියෙක් නොමැති ඔබව පොළොවේ සිට ඇති කර එහිම ඔබ වාසය කරවූයේ ඔහුය හෙයින් ඔබ ඔහුගෙන්ම සමාව අයදින්නි පසුව (ඔබගේ පාප ක්‍රියා වෙනුවෙන්) පසුතැවිලි වී ඔහු වෙතම හැරෙන්නි නිශ්චය වශයෙන්ම මාගේ හිමි සමීපයායි පිළිගන්නායි යැයි (ඔහු) කීවේය (සූරා- හූද් 61)

(ඕ මුහම්මද්!) 'මා නියෝජිතයෙකු පෘතුවියෙහි පත් කරන්නෙක් වෙ(න්නට ය)මි' යයි මලාඉකාවරුන්ට ඔබගේ හිමි කී මොහොත (මෙනෙහි කරන්න) (එයට) ඔවුන් 'අප ඔබගේ ප්‍රශංසාව මගින් ආඩම්බරවෙන්නෙමු තවද ඔබගේ සුවිශුද්ධ බවින් ඔබ ආනිසංශනයද කරන්නෙමු (එසේ කිරීමට අප සිටින විට) එහි කෝලාහල ඇති කර රුධිරය වගුරන කෙනෙකු එහි ඔබ පත් කරන්නේද?' යයි ඇසූහ (එයට අල්ලාහ්) 'ඔබ නොදන්නා දේ මා දනිමි' යයි කීවේය (සූරා අල් බකරා 30)

මෙසේ මිනිසාට විශ්වයේ පැවැත්මෙහි යම් සම්බන්ධයක් තිබෙන බැවින් එය රැක බලා ගැනීමේ වගකීම ඔහු සතුය මෙම මතය තහවුරු කරන උදාහරන කිහිපයක් පහත සඳහන් වේ



## 1- සතුන් රැකබලා ගැනීම :

සතුන් රැක බලා ගැනීම විෂයයෙහි හා එහි ඇති කුසල් පිළිබඳවද ඒවාට හිංසන කිරීමෙන් වැළකීම හා එසේ හිංසා කිරීමෙන් ඇති වන අකුසල හා දරුණු දඬුවම් ගැන නබි වදන් බොහෝමයක අවධාරණය කර ඇත

සතුන්ගේ අයිතිවාසිකම රැකීම පිණිස වන පළමු ජගත් සංවිධානය 1824 වන වසර බ්‍රිතාන්‍යයේ පිහිටුවන ලදී සත්ව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහි දඬුවම් නියම කිරීමේ ප්‍රථම පනත බ්‍රිතාන්‍යයේ 1949 වන වසරෙහි නීතිගත කෙරුනි එනමුත් ඉස්ලාමය සියවස් 14 ට පෙරම සතුන්ගේ අයිතිය උල්ලංඝණය කිරීම තහනම් කර සතුන්ව කුස ගින්නේ තැබීම, හිංසනය කිරීම, උගේ ශක්තියට වඩා බර පැටවීම, සතුන්ට හිංසනයක් ඇති වන ආකාරයෙන් උන්ගෙන් විනෝද වීම ගමන් නොකරන විට උන් මත වාඩි වී සිටීම සතුන්ගේ මුහුණට පහර දීම වැනි බොහෝ දෑ නබි මුහම්මද් (සල්) තුමානන් විසින් තහනම් කරන ලද බව පැහැදිලිවම ඉස්ලාම් නීති රීතීන් ග්‍රන්ථවල අපට දැකගත හැකිය

ඉස්ලාමය සත්වයින් විෂයයෙහි කෙතරම් සැලකිල්ලක් දක්වා ඇති යන්න මේවා කියවන්නාට පැහැදිලි වනු ඇත දුරාචාරය ඉස්ලාමයේ ඉතා නින්දිත පවක් වුවද,ගණිකාවක් ගැන මුහම්මද් නබි තුමානන් පැවසූ දෑ ඔබව විශ්මයට පත් කරනු ඇත වරක් නබි (සල්) තුමානන් තම දේශනාවේ මෙම සිද්ධිය පැවසුවේය "දුරාචාරයේ යෙදෙන ස්ත්‍රියක් පිපාසය නිසා මරණාසන්නයේ සිටින සුනඛයකු දුටුවාය උගේ මෙම තත්වය දැක ඇයගේ සිත මොලොක් විය පසුව ඇයගේ පාවහන ගලවා ළිඳට බස්වා එයට වතුර පුරවා එම සුනඛයාට පෙව්වාය මේ හේතුවෙන් අල්ලාහ් ඇගේ පාපයන් කමා කළේය" (බුකාරීඃ3280)



සත්ව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට දඬුවම් නියම කිරීමේ පළමු පනත බ්‍රිතාන්‍යයේ 1949 වන වසරේ නීතිගත කෙරුනී

සත්වයින්ගේ අයිතිවාසිය රැකගත යුතු පිණිස ඇති වූ ප්‍රථම සංවිධානය 1824 වන වසර බ්‍රිතාන්‍යයේ ඇරඹිනි

සතුන්ව කුස ගින්නේ තැබීම, හිංසනය කිරීම, උගේ ශක්තියට වඩා බර පැටවීම, සතුන්ට හිංසනයක් ඇති වන ආකාර-යෙන් උන්ගෙන් විනෝද වීම ගමන් නොකරන විට උන් මත වාඩි වී සිටීම සතුන්ගේ මුහුණට පහර දීම වැනි දෑ ඉස්ලාමය තහනම් කළේ 632 වන වසරේය

## 2- වගා බෝග ආරක්ෂා කිරීම:

ගොයම් හා වගා බෝග ආරක්ෂා කිරීම විෂයයෙහි ඉස්ලාමය අධිකව දිරි ගන්වා ඇත එය තමන්ගේ අවශ්‍යතාවයට වුවද නැතිනම් අනුන් වෙනුවෙන් උවද එය නිසි ලෙස භාවිතා කළ යුතුයි

"කවරෙකු තනිවම හෝ තවත් කෙනෙකු සමඟ එක් වී, ජීවීන්ට ප්‍රයෝජන ඇති වගාවක් වගා කර පසුව එයින් පක්ෂියකු, සත්වයකු හෝ මිනිසෙකු අනුභව කරන සෑම මොහොතකම ඔහුට එය එක් දන්දීමක් ලෙස වන්නේය" (අල් බුකාරීඃ 2320)

එපමණක් නොව, ගොයම් හා ගස් වගාව මගින් පොළව සාරවත් කර පරිසරය සුරැකීමේ මෙහෙයුමෙහි කිසි අඩුවක් නොකළ යුතු යැයි අප නායක මුහම්මද් (සල්) තුමානන් අපට උගන්වා ඇත කෙතරම්දයත්, තම කටයුත්ත නිසා ප්‍රයෝජනයක් ඇති වේ යන්නෙහි තමන්ට සැකයක් ඇති වුවද එය නතර කළ නොයුතුයි මේ බව නබි තුමානන් මෙසේ පවසා ඇත: කියාමත් (විශ්වයේ දරුණුම සිදුවීම) ඇති වන විට ඔබගෙන් කෙනෙකු ළඟ රටඉඳි බීජයක් තිබුනද ඔහුට හැකිනම් උහු එය පැළ කිරීමට විහිසුළු විය යුතුයි එය ඔහුගේ දන්දීමක් ලෙස සැලකේ (අහ්මද්: 12981)

ගොයම් වගා ඇති කර පොළව සාරවත් කිරීමේ ක්‍රියා වන්දනයක් හා සමාන යැයිද ඒවාට කුසල් ඇත යැයිද ඉස්ලාමය පවසයි

## 3- සොබාදහම හා පරිසරය සුරැකීම:


පරිසරය සුරැකීම, එහි අංගයන් ආරක්ෂා කිරීම හා පරිසර දූෂණයෙන් වැළකී සිටීම ඉස්ලාම් අවධාරණය කර ඇත මේ සඳහා වන මගපෙන්වීම්ද ඉස්ලාමය අපට පැහැදිලි කර ඇත සෑම කෙනෙකුම තමා අවට පරිසරය රැක ගැනීම මෙන්ම ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම හා ඒවා අවභාවිතා නොකිරීම වැනි දෑ කෙරෙහි ඉස්ලාමය දැඩි සැලකිල්ලක් යොමු කරයි ඇතැම් උදාහරන පහත දැක්වේ:

- ස්වභාවික සම්පත් අපයෝජනය කිරීම තහනම් කරන ඉස්ලාමය ජල සම්පත සුරැකීම ගැන අවධාරනයෙන් පවසා ඇති කෙතරම් දුරටදයත්, අල්ලාහ් නැමදීම සඳහා "වුළු" නම් අරධ දෝවනය කිරීමේදී පවා ජලය නාස්ති කිරීම ඉස්ලාමය තරයේ වළකා ඇති
- යම් කෙනෙකු වෙත ස්වභාවික සම්පතක් හෝ වෙදකම් කිරීම වැනි යම් කිසි හැකියාවක් තිබී මිනිසුන්ට යම් ප්‍රතිකාර අවශ්‍යතාවයක් ඇති වන විට එයින් උපකාර නොකිරීම ඉස්ලාමය තහනම් කර ඇත ජලය, ගින්න හා තණකොල වැනි දෑ මිනිසුන්ට නොදී ගබඩා කිරීම තහනම් යැයි ඉස්ලාමය පවසයි (අබූ දාවූද්: 3477)

> පරිසරය ආරක්ෂා කිරීම හා එය සුරැකීමට හා පිරිසිදු කිරීමට දායක වීම ඊමානයේ නම් විශ්වාසයේ අංගයක් යැයි ඉස්ලාමය පවසයි.

- විශේෂයෙන්ම ගලා නොයන ජලයෙහිද මිනිසුන් ගැවසෙන හා විවේක ගන්නා ස්ථානවල හා ගස් යට ආදි තැන්වල මූත්‍රා කිරීම ඇතුලු පරිසර දූෂණ ඇති විය හැකි සෑම දෙයක්ම ඉස්ලාමය වළක්වා ඇත තවද මගීන් විවේක ගන්නා ස්ථායන් පිරිසිදුව තබා ගැනිම ඉතා වැදගත් කරුනකි

මෙහි අප සඳහන් කර ඇත්තේ නබි තුමානන් පැවසූ දැයින් ඉතා සුළු කොටසක් පමනි සැලකිය යුතු කරුනක් නම්, පාරෙහි ඇති අපවිත්‍රයක් ඉවත් කිරීම පවා හුදෙක් කුසල් සහගත ක්‍රියාවක් යැයි පමණක් ඉස්ලාමය නොසලකයි එනමුත් එය ඊමාන්හි යතාර්ථයේ අංගයක් යැයිද නබි තුමානන් පවසා ඇත (මුස්ලිම්: 35)



## දැනුමේ ධර්මයයි :

මුහම්මද් (සල්) තුමානන් වෙත ශුද්ධ කුර්ආනයෙන් පළමුව පහල වූ වචනය "ඉක්රඃ" එනම් "කියවන්න" යන වචනයයි මිනිසුන්ට ප්‍රයෝජන ගෙන දෙන සෑම දැනුමක්ම හැදෑරීම අවධාරණය කරන ශුද්ධ කුර්ආන් වැකි හා නබි වදන් බොහෝමයක් ඇත දැනුම හැදෑරීමෙ ස්වර්ග යට පිවිසීමට මග පාදන ලෙස මුහම්මද් (සල්) තුමානන් පවසා ඇතඃ"කවුරුන් දැනුම හැදෑරීමේ මගෙහි ගමන් කරන්නේද අල්ලාහ් ඔහුට ස්වර්ගයට යෑමේ මග පහසු කර දෙන්නේය" යැයි එතුමන් පැවසුහ (මුස්ලිම්ඃ 2699)

දැනුමැත්තෙකුව දැනුම නොමැත්තෙකු සමඟ සැසඳීමේදී නබි මුහම්මද් (සල්) තුමානන් මෙසේ පැවසුහඃ"(දැනුම නොමැතිව) නැමදුම් කරන්නෙකුට වඩා දැනුමැත්තෙකුට ඇති ශ්‍රේෂ්ටත්වය නම්, ඔබගෙන් ඉතා පහත් කෙනෙකුට වඩා මා හට ඇති ශ්‍රේෂ්ටත්වය මෙන්ය"(අත් තිර්මිදී 2685)

අනෙක් ආගම්වලට වඩා ඉස්ලාමය දැනුමට වැඩි පිළිගැනීමක් දැක්වුයේ එනිසයි එපණක් නොව, කෙනෙකුගේ ධර්මය කෙතරම් පරිපූර්ණ වන්නේද ඒ සමඟම ඔහුගේ දැනුමද පරිපූර්ණ හා දීප්තිමත් වන්නේය මන්දයත් ඉස්ලාම් ධර්මය මිනිසාව දැනුම හැදෑරීම හා ඉගැන්වීම යනාදී දෙකටම උදව් වන්නක්ව හා පොළඹවන්නක්ව ඇති මස්ජිදයන්ද පවතින්නේ දැනුමේ කේන්ද්‍රස්ථාන ලෙසිනි දැනුමේ විවිධ පීඨවලින් බැබලුනු මුස්ලිම් විද්වතුන් තමන්ගේ දැනුම ආරම්භ කළේ ශුද්ධ කුර්ආනය හැදෑරීම, එය ධාරණය කිරීම හා එතුලින් ඉස්ලාම් නීති රීතීන් අවබෝධ කිරීම මගින්ය ඉන්පසුව ඔවුන් තම තමන්ගේ සුවිශේෂී පීඨයන්හි නියැලුනේ ශුද්ධ කුර්ආන ඇති කළ උනන්දු කිරීම නිසාය

ප්‍රයෝජනවත් දැනුම හදාරා එය අන් අයට උගන්වන්නන්ව අල්ලාහ් කෙතරම දුරට ගෞරවය කර ඔවුන්ව උසස් කර ඇත්තේද යන කරුණ අපට පහත නබි තුමානන්ගේ හදීසයෙන් පැහැදිලි වේඃ"නියත වශයේනම අල්ලාහ් ද, මලාඉකා වරුන්ද අහසේ හා පොළවේ සිටින සෑම කෙනෙකුම, හා ගුලෙහි සිටින කුඹියා මෙන්ම (මුහුදේ ඇති සෑම) මත්ශ්‍යයින් පවා මිනිසුන්ට යහපත උගන්වන්නන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරති" (අත් තිර්මිදී 2685)



“ දැනුමේ විවිධ පීඨවලින් බැබලුනු මුස්ලිම් විද්වතුන් තමන්ගේ දැනුම ආරම්භ කළේ ශුද්ධ කුර්ආනය හැදෑරීම එය ධාරණාය කිරීම හා එතුලින් ඉස්ලාම් නීති රීතීන් අවබෝධ කිරීම මගින්ය. ඉන්පසුව ඔවුන් තම තමන්ගේ සුවිශේෂී පීඨයන්හි නියැලුනේ ශුද්ධ කුර්ආන ඇති කළ උනන්දු කිරීම නිසාය.

## මුස්ලිම් විද්‍යාඥයින් සමහරුන්:



1- "අල් කවාරිස්මී" ඇල්ගොරිට්මි (790-850 බැග්ඩෑඩ්) මොහු ගණිතඥයෙක්වද ඉංජිනේරු හා තාරකා විද්‍යාඥයකුවද සිටියේයි මොහුගේ පොත් අනෙකුත් බාසාවලට ආරාම්භ කාළයේම පරිවර්ථන කරනු ලැබුනි වීජ ගණිතයේ ප්‍රාරම්භකයාද මොහුය " අල් ජබ්ර්"කටැඉර " සිෆ්ර්"උරුද වැනි අරාබි වචන ලතින් භාෂාවට ඇතුළු වූයේද මොහු නිසාය






2- ඉබ්නුල් අයිසම් (965-1040 කෙයිරෝ) මොහු ඉංජිනේරුවරයෙක හා භෞතික විද්‍යාඥයකු විය මොහු අල් අස්හර් විශ්ව විද්‍යාලයෙහි බැඳී අක්ෂි විද්‍යාවට ඉමහත් දායකත්වයක් ලබා දුන්නේය"කැමරාව" යන වචනය මොහුට සම්බනධ වචනයකි බොහෝ ගවේශණයින්ට අනුව කැමරාව යන වචනය උපුටා ගනු ලැබුවේ " අල් කුම්රා" යන නමින්ය එය ඉබ්නුල් අයිසම් සතුව තිබූ එක් ආලෝක කාමරයක නමයි



3- අල් බීරූනී (973-1048 කවාරස්මි) මොහු තාරකා විද්‍යාඥයක් විය පොළව එහි අක්ෂයක් මත පිහිටා ගමන් කරන බව පැවසූ ප්‍රථම විද්‍යාඥයා මොහුය ගුරුත්වාකර්ෂණ බලය ගැන පළමුවෙන් අනාවරණ කළේද මොහුය



4- අල් සහ්රාවී (936-1013 අන්දුලුස්) මොහු වෛද්‍යවරයකු හා ශල්‍ය වෛද්‍ය වරයකු වේ මොහුගේ ශල්‍යක්‍රම ඉතා ප්‍රකට විය මොහු ශල්‍ය වෛද්‍ය පීඨයේ ග්‍රන්ථ බොහෝමයක් ලියා ඇත සියවස් ගනනාවකට ඒවා ප්‍රධාන ග්‍රන්ථ බවට තිබුනි බොහෝ බාසාවලට පවා එය පරිවර්ථන කෙරුනි



5- ඉබ්නු සීනා (980-1037 බුකාරා) විද්‍යා පීඨයේ මොහු "ඩසපැබ්බ යැයි ප්‍රසිද්ධයි මොහු වෛද්‍යවරයකු මෙන්ම ප්‍රසිද්ධ දර්ශනිකයෙකුද විය මොහුගේ වකවානුවේ රෝග රැසක් සඳහා වන ප්‍රතිකාර පැහැදිලි කර දුන්නේය එසේ මොහු විස්තරකර දුන් ප්‍රතිකාරයන් අද වනතුරු ප්‍රයෝජන දෙමින් තිබේ මොහුගේ (අල් කානූන්) නම් වෛද්‍ය ග්‍රන්ථය සියවස් හතකට වෛද්‍ය පීඨයෙහි ප්‍රධාන ග්‍රන්ථයක්ව තිබුනි දාහත්වන සියවස දක්වා යුරෝපයේ විශ්වවිද්‍යාලවල මොහුගේ මෙම ග්‍රන්ථය උගන්වනු ලබමින් තිබුනි



වෛද්‍ය පීඨයේ මොහු ඉතා ප්‍රසිද්ධවූ විට අල්ලාහ්ගෙන් මොහුට ලැබුනු දැනුමෙහි දායාදයට ස්තුතිය පුද කිරීමක් ලෙස මොහු නොමිලේ ප්‍රතිකාර කර මිනිසුන්ට සේවය කළේය



6- ඉබ්නුන් නෆීස් (1213-1288 ඩැමස්කස්) මොහු ධර්ම විද්වතෙකුව සිටීමත් සමඟ ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයකු හා කායික විද්‍යාඥයකුවද සිටියේය මොහු ප්‍රාරම්භකයාව සිටි වෛද්‍ය න්‍යායන් රැසක් අද වනතුරු ප්‍රායෝගිකව ඇත





## මිනිසාගේ ජීවිතයේ සෑම පැතිකඩක්ම ඉස්ලාමයෙහි අන්තර්ගත වෙයි:

ඉස්ලාමය යනු අනෙක් ධර්මයන් මෙන් හුදෙක් වන්දනාමාන හා පොදු ගුණාංග පමණක් දෙසන ධර්මයක් නොවේ යැයි පැවසුවහොත් එය ඉතා නිවැරදිය මෙය ඇතැමුන් විශ්මයටද පත් කළ හැකිය

ඉස්ලාමය ඇතැමුන්ගේ අදහස් හා ප්‍රතිපත්තීන් අනුව එක් සීමිත පිරිසක් පමණක් අදහන ආගමක් නොවේ

ඇතැම් පිරිසක් පමනක් පිළිපැදිය යුතු මතයන් හෝ දර්ශනයන් ඉස්ලාමයේ නොමැත

එය හුදුවේ ආර්ථික හෝ පාරිසරික පද්ධතියක්ද නොවේ

එය හුදුවේ සමාජය ගොඩනැගීමට පමණක් වූ පිළිවෙළක් සහ න්‍යායයක් පමණක්ද නොවේ

එය ආචාර ධර්ම හා හැසිරීම් පිළිබඳ පමණක් වූ ධර්මයක්ද නොවේ ඉස්ලාමය මේ සියල්ලේ සංකලනයකි

ඉස්ලාමය යනු ජීවිතයේ සියලුම පැතිකඩක්ම ආවරණය කරන ජීවන රටාවකි ඉහත සඳහන් දෑ සමගම ඉදි කිරීම් හා ශිෂ්ඨාචාරයන්ට අනුව පමනක් සීමා වූ ප්‍රමාණයට මිනිසුන්ගේ නිදහස සීමා නොකරයි

සල්මාන් අල් ෆාරිසී නැමති සහාබිවරයාට විහිළු කිරීමට සිතූ මුස්ලිම් නොවන්නෙකු "නියත වශයෙන්ම ඔබගේ මිත්‍රයා (මුහම්මද්) මල මූත්‍රා කිරීම වැනි දෑ පවා උගන්වනවා නොවේද?" යැයි ඇසුවේය එයට මෙම සහාබිවරයා "ඔව්" යැයි ආඩම්බරයෙන් පිළිතුරු දී ඔහුට මෙම විෂයයෙහි ඇති විනීතබව උගන්වා දුන්නේය (මුස්ලිම් 262)

## මෙලොව හා එලොව

ඉපැරනි මිසරයේ මළවුන්ගේ දේහය දිරා නොයෑම පිණිස ඒ සමඟ කපුරු වැනි දෑ තබති පසුව එම මළවුන්ගේ සෑම වටිනා වස්තූන් ඒ සමඟ තබති මළවුන්ට මේවා එලොවෙහි ප්‍රයෝජන වනු ඇත යැයි ඔවුන් විශ්වාස කළහ

ටිබෙට් ජාතිකයින් මළකඳ කුඩා කැබලි වලට කපා පක්ෂීන් අනුභව කිරීම පිණිස උස් තැන්වල ඒවා තබති හින්දු භක්තිකයින් මළකඳ ගිනිබත් කරන්නේ එමගින්

ඔවුන්ගේ ආත්මය ආරක්ෂා කළ හැකි යන විශ්වාසයෙනි

මරණින් පසුව කුමක් වේද යන්න පිළිබඳව විවිධ


> ඉස්ලාමය යනු ජීවිතයේ සියලුම පැතිකඩ ආවරණය කරන ජීවන රටාවකි.

ධර්මයන් සතුව තිබුනු විවිධ විශ්වාසයන් සමහරක් පමණකි මේ එසේ නම් සත්‍යයෙන්ම මරණින් පසු ඒ ඒ අයෙගේ විශ්වාස අනුව ඔවුන්ට සිදු වන්නේද නැතිනම් පොදුවේ සෑම කෙනෙකුටම වන්නේ එක් දෙයක්ද? මරණින් පසු තවත් ජීවිතයක් තිබේද? එසේ තිබෙන්නේ නම් එය කෙබන්දක්ද? එහි අපට අවශ්‍ය වන්නේ කුමක්ද?

කුමන ධර්මයක කෙනෙකුට වුවද ප්‍රතික්ෂේප කළ නොහැකි දෙයක් නම් එය මරණයයි ඔබ මරණින් පසු තවත් ජීවිතයක් තිබේ යැයි විශ්වාස කරන්නෙකු වුවද නැතිනම් මරණින්ම අපගේ සියළු කටයුතු අවසන් වේ යැයි ඔබ විශ්වාස කළද ඔබ දැහැමි පුද්ගලයකුව සිටියද නැතිනම් පාපයන්හි ගිලිහී සිටින්නෙකු වුවද ඔබට වැලැක්විය නොහැකි දෙයක් නම් එය මරණයයි එම මරණය නිශ්චිතයි නම් එයින් පසුව කුමක් වේද යන්නෙහි නිසි පිළිතුර කුමක්ද? අප විශ්වාස කරමින් සිටින දෙය ගැන අපට සිතට ප්‍රශ්න පැමිණෙන සෑම විටම අප අපවම රවටා එය නොතකා හරින්නෙමු ලොවෙහි මේවාට නිසි පිළතුරක් නොසොයා මරණයට පත් වන්නන් මරණින් පසු කෙසේ පසුතැවිලි වේද යන්න ශුද්ධ කුර්ආනය මෙසේ පැහැදිලි කරයි: ඇතැමුන් 'මාගේ (එලොව) ජීවිතය උදෙසා මා කුසල් පෙරටු කරන්නට තිබුනි නොවේද? යැයි පවසති' (සුරා අල් ෆජ්ර්: 24)

තවත් ඇතැමුන් 'මා දූවිලි බවට පත් වන්ට තිබුනි නොවේදැ?' යැයි පවසයි (අන් නබඃ: 40)

දිව්‍යමය ධර්ම අදහන්නන් සියල්ලන්ම මරණින් පසුව තවත් ජීවිතයක් ඇති වී එහි තමන්ගේ කුසල් හා අකුසලට කුලිය ලැබේ යැයි විශ්වාස කරනවා යන්න කවුරුත් දන්නා දෙයකි දෙවියන්ගේ සෑම දූතයෙක්ම පැවසූ දැයද මෙයයි මරණින් පසු තවත් ජීවිතයක් නොමැති විට ලොවෙහි ජීවිතයෙහි නිසි අර්ථයක් නොමැත යන කරුණ බුද්ධියට ගෝචර වන දෙයකි රාත්‍රිය හා දහවල එකතු විය නොහැකි මෙන් නැමදීමක් හා ඉපැයීම් සහ ධනය සෙවීම එක් නොවන්නේය යැයි බොහෝ මිනිසුන් සිතති ඔවුන්



> කුමන ධර්මයක කෙනෙකුට වුවද පතික්ෂේප කළ නොහැකි දෙයක් නම් එය මරණයයි.ඔබ මරණින් පසු තවත් ජීවිතයක් තිබේ යැයි විශ්වාස කරන්නෙකු වුවද නැතිනම් මරණින්ම අපගේ සියළු කටයුතු අවසන් වේ යැයි ඔබ විශ්වාස කළද ඔබ දැහැමි පුද්ගලයකුව සිටියද නැතිනම් පාපයන්හි ගිලිහී සිටින්නෙකු වුවද ඔබට වැලැක්විය නොහැකි දෙයක් නම් එය මරණයයි.

සිතන්නේ ඉස්ලාම් ලෞකික සැපත් කිසිවක් ගැන මිනිසුන්ව දිරි නොගන්වන බවයි එය වැරදි සිතුවිල්ලකි

දිව්‍යමය ධර්මය අදහන්නන් සියල්ලන්ම පාහේ මරණින් පසුව තවත් ජීවිතයක් ඇත යැයිද එහි තමන්ගේ කුසල් හා අකුසලට කුලිය ලැබේ යැයිද තරයේ විශ්වාස කරති.

මුහම්මද් (සල්) තුමානන් මෙසේ පැවසුහ:" කෙනෙකු කුමන ආකාරයේ යහක්‍රියාවක් පිරිසිදු චේතනාවෙන් කරන්නේද ඒ සඳහා ඔහුට කුසල් ඇති වේ එය පාරේ ඇති කටුවක් ඉවත් කිරීම හෝ සිය බිරියට කවන කෑම පිඩක් වුවද කම් නැති" (අල් බුකාරීඃ 56)

යහපත් ක්‍රියා වැඳුම් පිදුම් මගින් පමණක් නොව එය අනෙකුත් කරුනු මගින්ද විය හැකි යන්නට නබි (සල්) තුමානන්ගේ මෙම වැකිය සාදකයකි:" ඔබෙන් කෙනෙකු සිය බිරිය සමඟ තම ශාරීරික අවශ්‍යතාවය සපුරා ගැනීම පවා කුසල් ලැබෙනු ඇත" යැයි නබි තුමානන් පැවසූ විට "සිය ශාරීරික අවශ්‍යතාවය සපුරා ගැනීමට කුසල් ලබා දිය යුත්තේ ඇයිද"යැයි සහාබාවරුන් පුදුමයෙන් විමසුවෝය එයට නබි තුමානන් "ඔහු සිය ශාරීරික අවශ්‍යතාවය තහනම් මගකින් ඉටු කර ගන්නා විට ඔහුට පාප ඇති වනවා නොවේද? යැයි ඇසූ විට ඔවුන් "ඔව්" යැයි ඔවුන් පිළිදුන් දුන්හ එවිට " එසේ නම් මොහු නිසි මගින් තම ආශාව ඉටු කිරීමට ඔහුට කුසල් හිමි විය යුතු නොවේද?" යැයි නබි මුහම්මද් (සල්) තුමානන් පැහැදිලි කළහ (මුස්ලිම්ඃ 1006)

ඉස්ලාමය, නැමදීම හා ඉපැයීම යන දෙකටම සමබරතාවයක් ලබා දී ඇත යැයි පැහැදිලිවම වටහා ගත හැකියි මේ බව ශුද්ධ කුර්ආන්හි සුරා අල් ජුම්ආ 9-10 හි සඳහන් වී ඇත

එපමනක් නොව, ඉපැයීමේදී අල්ලාහ් වෙනුවෙන් එය කරනවා යැයි චේතනා කෙළේ නම් ඒ වෙනුවෙන් ඔහුට කුසල් හිමි වේ

නැමදුම් හා යහක්‍රියා කිරීමට මිනිසුන්ව දිරිගන්වන්නා සේම වෙළඳාම් කිරීමට හා ගොවිතැනටද නිසි මංවලින් මුදල් ඉපැයීමටද ඉස්ලාමය දිරිගන්වයි

සෑම මුස්ලිම්වරෙයක්ම සලාතය, උපවාසය ආදිය ඉටු කිරීම සදහා උත්සාහ ගැනීම මෙන්ම සිය පවුල හා තමන්ගේ භාරව සිටින්නන් රැක බලා ගැනීම පිණිස ඉපැයීම, ඔවුන්ගේ සෞඛ්‍යය රැක බලා ගැනීම හා සමාජ යහපතට සහය දීම යනාදිය සඳහා මහන්සි විය යුතුයි ඒ සියල්ලටම කුසල් හිමිවේ

මෙලොව හා එලොව දෙකම සඳහා උත්සහය දරන විට මුස්ලිම් වරුන්ට දැනෙන මානසික සන්සුන් බව හා බාහිර ශාන්ති බව ඇති වන්නේ මෙනිසයි මේ දෙක එකිනෙකට නොගැටී එකක් තවත් එකක් ශක්තිමත් කරන පරිපූර්ණ කරයි මෙයින් පැහැදිලි වන්නේ ඉස්ලාමය දෙසන අලංකාර මගපෙන්වීමයි සෑම මුස්ලිම්වරෙයකුටම නොබියව පැවසිය හැකි කරුනක් තමාගේ ජීවිතය මුලුමනින්ම අල්ලාහ් වෙනුවෙන්මයි මාගේ නැමදීම පමණක් නොව මගේ ජීවිතයේ සියළු අවස්ථා සඳහාම අල්ලාහ් මාහට කුසල් දෙනු ඇත මගේ මරණින් පසුව ඔහු මට පූර්ණ ප්‍රතිඵලය දෙනු ඇත මගේ ජීවිතයේ සියළු අවස්ථාවල මම අල්ලාහ්ගේ ධර්මය පිළිපදින්නෙක් වෙමි (සූරා-අන්ආම් 162)

## ඉස්ලාමය යනු බෙදාහදා ගැනීමේ දහමයි:

අහ්මද් බින් ෆද්ලාන් නැමති මුස්ලිම් සංචාරකයා රුසියාවේ හා ඩෙන්මාර්කයේ බොහෝ ස්ථාවලට සංචාර කර ඇති මොහු එහි වසන ජනයින්ගේ ස්වභාවය හා ඔවුන්ගේ යථාර්තය ගැන ඉතා නිවැරදි ආකාරයට පවසා ඇත

ක්‍රි:ව 921 දී අහ්මද් බින් ෆද්ලාන් ඉතාමත් විශ්මිත සංචාරයක යෙදුනේය සංස්කෘතික සන්නිවේදනය සඳහා ඉතා වැදගත් සංචාරයක් ලෙස මොහුගේ මෙම සංචාරය සැලකේ එකල විද්‍යාවෙහි හා ශිෂ්ඨාචරයන්හි අගනුවරක් ලෙස සැලකුණු බැග්ඩෑඩ් නගරයෙන් මොහුගේ සංචාරය ආරම්භ වී නොයෙක් රටවල මිනිසුන් හමු වු අතර මෙවිට ඔහුට ලැබුනු නිරීක්ෂණය ඔහු ලේඛන ගත කළේයි එම පොත පසුව 1923 වසරෙහි රුසියාවෙන් සොයාගනු ලැබුනි

ඇමරිකානු විද්‍යාඥයකුගේ මතය අනුව අහ්මද් ෆද්ලාන් මෙම පොත ලීවීමට ප්‍රධාන කාරනාව වූයේ එකල බැග්ඩෑඩ් නගරය මුස්ලිම්වරුන් ආගමෙහි ස්ථිරව සිටි අතරම පෙනුමෙන් හා ක්‍රියාවෙන් වෙනස් වු අන්‍ය ආගමිකයින් සමඟද සුහදව කටයුතු කිරීමයි එමෙන්ම විදේශිකයන් ඉතා සුළු පිරිසක් සිටි පෙදෙසද බැග්ඩෑඩයයි

Michael Crichton (Eaters of the Dead මයිකල් ක්‍රිෂ්ටන් ඊටර්ස් ඔෆ් ද ඩෙඩ් (මිනී අනුභව කරන්නන්)



විශිෂ්ට ගිතිගුණයෙන් හා විනීත බවින් ලොවෙහි ඇති විවිධ සංස්කෘතියත් සමඟ එක්ව සුහදව වාසය කිරීම ඉස්ලාමිය පිළිවෙතයි ඒ මිස මිනිසුන්ගෙන් ඈත් වී ජීවත් වීම නිවැරදි ඉස්ලාම් ක්‍රමය නොවේ මෙය නබි (සල්) තුමානන් එක් හදීසයක මෙසේ පැහැදිලි කළේය:

‘මිනිසුන්ගෙන් ඈත් වී තනිවම ජීවත් වන්නාට වඩා ඔවුන්ගෙන් සිදු වන වැරදි හා හිරිහැර ඉවසා ඔවුන් සමඟම සිටින්නා ඉතා උසස්ය’ (ඉබ්නු මාජහ් 4032)

# එකම මැවුම් කරුවා හා එකම දෙවියා



ඉස්ලාම්

ඉස්ලාම් දහමට ඇතුළු වීම සඳහා විශ්වාසය පමණක් ප්‍රමාණවත් නොවන බව ඉස්ලාමය තහවුරු කර ඇත.මැවුම්කරුවා එකෙකු නම් නැමදීමට සුදුසු දෙවියාද එකෙකු විය යුතු යැයි ඉස්ලාමය පවසයි.

## ඉස්ලාම් පවසන එකම දෙවියා අල්ලාහ්ය.
## අල්ලාහ් යන අරාබි වචනය අර්ථ තුනකින් සමන්විත වෙයි.

- සලාතය කිරීම හා උපවාසය රැකීම වැනි සෑම නැමදුමකට සුදුස්සා යන අර්ථය ඉන් පළමු වැන්නයි.
- දෙවැනි අර්ථය නම්, මිනිසුන්ගේ චින්තනයට පරිපූර්ණයෙන් වටහා ගත නොහැකි ඔවුන්ව මවිතයට පත්කරන්නා ඉමහත් පැවැත්මක් හා ගුණාංගයන් ඇත්තා යන්නයි.
- අන් අයගේ සිත් තමන් වෙත නැඹුරු කර ඔහුව සිහි කිරීම තුලින් අන් අයගේ සිත් සන්සුන් කරවන්නා යන්න එහි තෙවැනි අර්ථයයි.

අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨ බවට හා ගෞරවයට නුසුදුසු ගුණාංගයෙන් හා ඔහුගේ නාමයට කරනු ලැබී ඇති විකෘතියෙන් ඔහුව සුවිශුද්ධ කර අල්ලාහ්ව නිසි ලෙස වටහාගත යුතු යැයි ශුද්ධ කුර්ආනය පවසයි.

'අවසාන හෝරාවෙහි දැනුම ඔහු සතුය තවද ඔහු නොදැන පළතුරු එහි වල්ලෙන් පිට වන්නේ නැත. කිසිදු ස්ත්‍රියක් පිළිසිඳ ගන්නේ නැත බිහි කරන්නේද නැත.(අවසාන තීන්දු දිනයෙහි ඔහු)මට සම කරනු ලැබූ දේ කොහිද? යැයි ඔවුන්ගෙන් අසනු ඇත එයට ඔවුන් අප අතර කිසිවෙකු (මෙයට) සාක්ෂි කියන්නන් නොවෙමු යැයි අප ඔබට දන්වා සිටියෙමු යැයි කියති' (සූරා අල් ෆුස්සිලත් 47)

'තවද ගුප්ත දෙයෙහි යතුරු ඔහු ළඟම ඇත.එය ඔහු හැර (අන් කිසිවෙකු) නොදනිති.තවද මුහුදේ හා පොළොවේ ඇති දෙයද ඔහු දන්නේය.ඔහුට නොදැනුවත්ව (ගසකින්) කොළයක් (වුවද) බිම නොවැටේ පොළොවේ ඝණඳුරෙහි තිබෙන බීජයද, එලාවන් මෙන්ම වියලි දෙයද පැහැදිලි පුස්තකයේ (සටහන් කර) නොමැතිව නැත්තේය' (සූරා අල් අන්ආම් 59)

අල්ලාහ්ට ඉතා අලංකාර හා පරිපූර්ණ ගුණාංගයන් ඇත.කිසිවෙකු විසින් අභිබවනු නොලබන ශක්තිවන්තයා ඔහු



"වැසි බිඳු හා ගසින් කොළයයක් වැටීම වැනි දෑ ඇතුළු සෑම දෙයක්ම අල්ලාහ් නොදැනුව සිදු නොවන බව ශුද්ධ කුර්ආනය පවසයි.

> නැමදුම විය යුත්තතේ අල්ලාහ්ට පමණක් යන්න ඉස්ලාමයේ ඉතා පැහැදිලි කරුනක් වේ. සෑම දූතයියෙකුගේ ඇරයුමෙහි මෙය අන්තර්ග වී ඇත.

සෑම දෙයෙහිම ඔහුගේ කරුනාව විහිදා ඇත.කිසිම ආකාරයේ අඩුපාඩුවක් නොමැති ශ්‍රේෂ්ඨයා අල්ලාහ්ය.

අහස් හා පොළව අල්ලාහ් දින හයකින් මවා හත් වන දින මහන්සිය නිසා අල්ලාහ් විවේක ගත්තේය යැයි ඇතැම් මිත්‍යා දුෂ්ඨිකයින් පැවසූ විට එහි අසත්‍යතාවය පැහැදිලි කරන්නා ශුද්ධ කුර්ආන් වැකිය මෙසේ පහල විය:

'තවද නිශ්චය වශයෙන්ම අහස් හා පොළොවද එදෙක අතර ඇති දෙයද දින සහයකින් අප මැවුවෙමු (එසේ කිරීම නිසා) කිසිදු විඩාවක් අප ස්පර්ශ කළේ නැත' (සූරා-කාෆ් 38).

මෙසේ පැවසීමට කාරනාව අල්ලාහ්ව අන් මැවීම සමග සසදා බැලූ නිසාය. අල්ලාහ් මැවුම් කරුවා වන අතර අන් සියල්ලක්ම මැවීම්ව තිබියදී අල්ලාහ්ව අන් අය සමග සැසදීම කෙතරම් අනුවනද?

'ඔහු මෙන් කිසිදු දෙයක් නැත.තවද ඔහු අසන්නාය බලන්නාය' (සූරා අෂ් ෂූරා 11)

අංශු ප්‍රමාණයක් හෝ කිසි කෙනෙකුට අසාධාරණ නොකරන යුක්තිසහගතයා අල්ලාහ්ය.බොහෝ අවස්ථාවන්හි දරුවන්ට සිය දෙමව්පියන් පවසන දැයෙහි සත්‍යය එම දරුවන්ට වටහා ගත නොහැකි වීම අප දකින්නෙමු එසේම මිනිසුන් වන අපටද ඇතැම් විට අල්ලාහ්ගේ විධානයන්හි සාධාරණ බව වටහා ගත් නොහැකි වීම සාමාන්‍ය දෙයකි.එසේ වන නිසා අල්ලාහ් අපට අසාධාරණයක් කර ඇත යැයි අරුත නොවේ.

ඉස්ලාම් දහමට ඇතුළු වීම සඳහා න්‍යායාත්මක විශ්වාසය පමණක් නොසෑහෙන බව ඉස්ලාම් ආගම තහවුරු කර ඇත.මැවුම් කරුවා එක්කෙනෙකු නම් නැමමුදට සුදුසු දෙවියාද එක්කෙනෙකි. කිසිම නැමදුමක් හෝ ප්‍රාර්ථනාවක් අල්ලාහ් නොවන අන් කෙනෙකුට කරනු ලැබිය නොයුතුය.අල්ලාහ්ට නැමදුම් කිරීමේදී කිසිදු කපුවෙකු හෝ අතරමැදියෙකුද අවශ්‍ය නොවේය.

ලොවේ රජුන් වෙත සිය අවශ්‍යතාවයන් සාමාන්‍ය පුරවැසියෙකුට සෘජුවම පැවසිය නොහැකි යන්න සත්‍යකි. මන්දයත් එම රජුට සිය පාලනයේ සිටින සෑම කෙනෙකුගේම අවශ්‍යතාවයන් එකිනෙකාගෙන් ඇසීම අසීරු කරුනකි. සෑම කෙනෙකුම රාජ මන්දිරයට යෑම ඔහුට හිරිහැරයක්ද වනු ඇත.එනමුත් අල්ලාහ්ට මිනිසුන් සියල්ලන්ම එකවරම ඔහුව කැඳවුවද ඒ සියල්ලන්ටම සවන් දී ඔවුන්ට පිළිතුරු දීමට අල්ලාහ්ට හැකිය. එළිපිට දෑ මෙන්ම් රහසිගත් දෑද මැනවින් අල්ලාහ් දන්නේය.ඔහු සෑම දැයක්ම සිය පාලනයෙහි තබා ඇති ශක්තිවන්තයාය. ඔහු යමක් කිරීමට පැතූ විට ඔහු 'වනු' යැයි පැවසූ සැනින් එය එසේ වන්නේය. මෙසේ තිබියදී අල්ලාහ් නොමැතිව අන් කෙනෙකු වෙතු හැරිය යුත්තේ කුමකටද?

මුස්ලිම්වරයාගේ සිතෙහි සන්සුන් බව ඇති වන්නේ ඔහු තමාගේ සෑම අවශ්‍යතාවයක්ම අල්ලාහ් වෙත පවරා ඔහුව සිහි කිරීම තුලින් නිසා යැයි. ශුද්ධ කුර්ආනය පවසයි.අල්ලාහ් කෙබන්දෙක්දයත් ඔහු සෑම දෙයකටම හැකියාව ඇත්තාය.මිනිසුන්ට සමීපව සිට ඔවුන්ගේ ප්‍රාර්ථනා මගින් ඔහු සතුටට පත් වන්නේය.

ඔබ අප්‍රාණිකව සිටි විට ඔහු ඔබට පණ දුන්නේය.පසුව මරණයට පත් කර පසුව (නැවත) පණ දෙන්නේය.එයින් පසුව ඔහු වෙතම නුඹලා ආපසු ගෙන්වනු ලබති.(තත්ත්වය මෙසේ තිබියදී) ඔබ කෙසේ (නම්) අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන්නෙහුද? (සුරා අල් බකරා 28).

(වඩාත් විශිෂ්ඨ ඔබගේ මනඃකල්පිත දෙවිවරුන්ද නැත්නම්) දැඩි ගැහැටට පත් වූවා මොහුව කැඳවූ විට ඔහුට පිළිතුරු දී තවද එම ගැහැට (ඔහුගෙන්) ඉවත් කර පොළොවෙහි ඔබව (සිය) නියෝජිතයා බවට පත් කළ ඔහුද? එහෙයින් අල්ලාහ් සමග අන් දෙවියෙක් සිටියිද? නැත ඔබ ඉතා මඳ වශයෙන්ම උපදෙස් ලබන්නෙහුය.63 (වඩාත් විශිෂ්ඨ ඔබගේ මනඃකල්පිත දෙවිවරුන්ද නැත්නම්) ගොඩබිමෙහි හා සාගරයෙහි ඇති අඳුරුවලදී ඔබට මග පෙන්වා (වර්ෂාව නම්) ඔහුගේ දායාදයට පෙර (සිසිල්) පවන ඔහුගේ සුබාරංචියක් ලෙසින් එවන ඔහුද? එහෙයින් අල්ලාහ් සමග අන් දෙවියෙක් සිටියිද? මොවුන් සම කරන දෙයින් අල්ලාහ් ඉතා උසස්ය.(සුරා අන් නම්ල් 62-63).

'අල්ලාහ්වම නැමද තාගූත් (නම් වන දුෂ්ට සාතාන්) වෙතින් ඉවත්වන්නී (යැයි සිය සමූහයා අමතා උපදෙස් කරන) එක් දූතයෙකු සෑම සමූහයකින්ම තිර වශයෙන්ම අප එවා ඇත්තෙමු.අල්ලාහ් සෘජු මග පෙන්වූවන්ද ඔවුන් අතර සිටිති කවුරුන් වෙත වැරදි මග නියම කරනු ලැබුවෝද ඔවුන් අතර සිටිති.එහෙයින් ඔබ පොලොවෙහි සැරිසරා (සත්‍ය දූතයන්) අසත්‍ය කළවුන්ගේ අවසානය කෙසේ වූයේ දැයි (සොයා) බලන්න(සුරා අන් නහ්ල් 36).

නැමදුම අල්ලාහ්ට පමණක් නිර්මල කරන්නා සිය සිතෙහි සන්සුන්බව නොලබා සිටිය හැක්කේ කෙසේද? මන්දයත් විශ්වාසවන්තයාට කිසිම කිසිදු පැකිලීමක් නැති පරම පාලකයා ඔහුයි මැවුම් කරුවා ඔහුයි එබැවින් සිය සයළු කරුනු හැරවිය යුත්තේ එහු වෙතමයි.

ශුද්ධ කුර්ආනයේ ඇති ඉතා ප්‍රසිද්ධ හා විශිෂ්ට එක් සූරාවක අන්තර්ගත වී ඇත්තේද මෙම අර්ථයයි.

## ඉක්ලාස් අවංකබවෙහි පරිච්ඡේදය.

අල්ලාහ් කවුරුන්දැයි අසන සියළු දෙනාටම පිළිතුරක් වශෙයන් පැහැදිලිවම දැනුම් දෙන මෙන් අල්ලාහ් සිය දූත මුහම්ද් තුමානන්ට අන කරයි.

නියත වශෙයන්ම අල්ලාහ් එකෙනෙකි.නැමුදුමෙහි ඔහුට කිසි හවුල් කරුවෙකු නොමැත.

- සියළු මැවීම් තමන්ගේ අවශ්‍යවතාවයන් ඉටු කර ගැනීමෙහි අල්ලාහ් වෙත ආධීන වෙති.
- දරුවෙකු වැදීම හෝ අන් කෙනෙකු විසින් වදනු ලැබීම ආදියෙන් ඔහු පාරිශුද්ධයි.ඔහු ප්‍රාරම්භකයායි.ඔහුට පෙර හෝ පසු කිසිවෙකු නැත.
- ඔහුගේ වර්නණාවන්ට හා පැවැත්මට සම විය හැකි කිසි කෙනෙකු නැත.ඔහු පමණයි මැවුම් කරුවා ඔහු හැර අන් සියල්ල ඔහුගේ මැවිලිය.




## ස්වභාව ධර්මයේ නීතිය හා ෂරීආ නීතිය අතර වෙනස

අප ජීවත් වන් මෙම විශ්වය හා එහි ඇති සෑම මැවීමක්ම අල්ලාහ් මවා ඇත්තේ ඉතා කුඩා අංශුවකිනි. මෙය අපගේ ශරීරයට මෙන්ම විශාල ග්‍රහලෝකයකට එකසමානයි. මේ සියල්ල පැවැත්වීම පිණිස අල්ලාහ් නිවැරදි හා සූක්ෂම ක්‍රමෝපායක් යොදා ඇති. එම ක්‍රියාවලිය නොමැතිව කිසිම ජීවියෙක් හෝ ස්වභාදහමක් පැවතිය නොහැකියි. මෙම ක්‍රියාවලියෙහි සුළු වෙනසක් ඇති වුවද දැවැන්ත විනාශයකට එය තුඩු දෙනු ඇත යැයි විද්‍යාඥයින් පවසති.

කෙසේ වෙතත් මෙම සියුම් ක්‍රියාදාමය සැලසුම් කළ අල්ලාහ්ට එය ක්‍රියා කරවීමෙහි කිසිදු අපහසුතාවයක් ඇති නොවේ. මිනිසාට යහපත කුමක් යන්න ඔහු දන්නේය. එබැවින් එම ක්‍රියාවලිය නිසි ආකාරයට සිදු වීමට නම් ලෝවැසියන්ට ඔහු දී ඇති යහමග පිළිපැදිය යුතුය. එහි යම් අවුලක් ඇති වූ විට ලොවෙහි පැවැත්මෙහිද අවුලක් ඇති වේ. එබැවින් මිනිසාව මවා ඔහු කෙසේ කටයුතු කිරීම තුලින් ඔහුටද, සමාජයට මෙන්ම මුළු විශ්වයටම යහපත් වන්නේය යන්න අල්ලාහ් දන්නේයි. මේ බව ශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:

(සියල්ල මැවූ) මැවිලිකරු එය නොදන්නේද? ඔහු සූක්ෂමව දන්නාය. සංවේදියාය. (සූරා මුල්ක් 14)



## යම් පුද්ගලයෙකු උදෙසා කරන නැමදීම්වලට ඉස්ලාමයේ අනුමැතිය නැත.

බොහෝමයක් ඇදහීම් ඔවුන්ගේ යම් පාර්ශවයකට ධර්මයෙහි ප්‍රධාන ස්ථානයක් දී ඔවුන්ව විශ්වාස කර ඔවුන්ට අවනත වනු දැකිය හැකිය. මෙවැන්නන් දෙවියන් හා මිනිසුන් අතර වන නියෝජිතයින් ලෙසින් කටයුතු කරතී මොවුන්ට සමාව දීමේ බලය තිබෙන බව හා මොවුන් ගුප්ත දෑ දනී යන්න එය අදහන්නන්ගේ විශ්වාසයයි.

යම් පුද්ගලයකු වෙනුවෙන් නැමදී නමස්කාර කිරීමේ ක්‍රමයක් ඉස්ලාම් ධර්මයෙහි නොමැත.සියළු මිනිසුන්ව අල්ලාහ් උසස් කර ගෞරවවය කර ඇත.ඕනෑම කෙනෙකුට අතරමැදියෙකු නොමැතිවම අල්ලාහ්ට සමීප විය හැකිය.එබැවින් අතරමැදියන් සහිතව කරනු ලබන සියලුම නැමදුම් අල්ලාහ් තහනම් කර ඇත.සෑම කෙනෙකුගේම ජය පිහිටා ඇත්තේ තමන්ගේම ක්‍රියාවෙහි මිස අල්ලාහ් නොවන තවත් කෙනෙකුට අවනත වීමෙහි නොවේ.

තවද ආගමික දැනුම ලැබිය යුත්තේ එක් සුවිශේෂී පිරිසක් පමණක්ය යන ක්‍රමයක් ඉස්ලාමයේ නැත.ධර්මය හැදෑරීම සියළු මුස්ලිම්වරුන්ගේම වගකීම යැයි ශුද්ධ කුර්ආනය අවධාරණය කරයි:

(ඕ මුහම්මද්!) ඔවුන් මෙහි වැකි සිතා බලන්නටද නුවණැතියන් සත්‍යය වටහා ගැනීමටද භාග්‍යසම්පන්න මෙම පුස්තකය අප ඔබට පහළ කළෙමු(සුරා සාද් 29).

> ඕනෑම කෙනෙකුට අතරමැදියෙකු නොමැතිවම අල්ලාහ්ට සමීප විය හැකිය.එබැවින් අතරමැදියන් සහිතව කරනු ලබන සියලුම නැමදුම් අල්ලාහ් තහනම් කර ඇත. සෑම කෙනෙකුගේම ජය පිහිටා ඇත්තේ තමන්ගේම ක්‍රියාවෙහි මිස අල්ලාහ් නොවන තවත් කෙනෙකුට අවනත වීමෙහි නොවේ.

නැමදුම් හා විශ්වාසය යනු මිනිසා හා අල්ලාහ් අතර වූ සමබන්ධ කරුණකි මිස මිනිසුන් හමා මිනිසුන් අතර වන දෙයක් නොවේ.අල්ලාහ් සියළු ගැත්තන්ට සමීපවද ඔවුන්ට සවන් දීමට සුදානමින්ද සිටින්නේය.නිර්මල සිතින් කරන නැමදුම් සියල්ල අතරමදියෙකු නොමැතිවම අල්ලාහ් පිළිගනු ඇත.පාපොච්චාරනෙයේ මුළු අයිතිය හා බලය ඇත්තේ අල්ලාහ් වෙත හෙයින් මිනිසුන්ගෙන් කිසිම කෙනෙකුට අල්ලාහ් එම බලය ලබා දී නොමැත.

අවංක ලෙස අල්ලාහ් වෙත කෙනෙකු අල්ලාහ්ගෙන් පව්සමා අයදින විට ශුද්ධ අල්ලාහ් එය පිළිගැනීමට සූදානම්ව සිටී මිනිසුන් ශුද්ධ අල්ලාහ් වෙත හැරී ඔහුගෙන් ප්රාර්ථනා කරන සෑම විටම ශුද්ධලාහ එයට පිළිතුරු දීමට සමීපව සිටින බව ශුද්ධ කුර්ආනය තහවුරු කරයි  (සුරා අල් බකරා 186)



මිනිසුන් අල්ලාහ් වෙත හැරී ඔහුගෙන් ප්‍රාර්ථනා කරන සෑම විටම අල්ලාහ් එයට ප්‍රතිචාර දැක්වීමට සමීපව සිටින බව ශුද්ධ කුර්ආනය තහවුරු කරයි.

## ඉස්ලාමයට ඇතුල් වීමට විශේෂ චාරිත්‍රයක් තිබේද?

ඉස්ලාමය පිළිගැනීමට කෙනෙකු අදහස් කරන්නේ නම් එයට කිසිදු සුවිශේෂී චාරිත්‍රයක් හෝ යම් හෝරාවන් හෝ නොමැත.එය සඳහා විශේෂ යම් පුද්ගලයෙකුද අවශ්‍ය නැත.එයට කළ යුත්තේ ප්‍රකාශ දෙකක අර්ථය දැන එය පරිපූර්ණයන් විශ්වාස කර එයට යටහත් වීමේ චේතනාවෙන් එය පැවසීම පමණී එම ප්‍රකාශ දෙක පහත දැක්වේ:*වඅෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු* 'නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අනි කිසිකෙනෙකු නොමැත යැයි මා සාක්ෂි දරමි'*වඅෂ්හදු අන්න මුහම්මදන්* රසූලුල්ලාහ් 'තවද මුහම්මද් අල්ලාහගේ දූතයා යැයිද මා සාක්ෂි දරමි'



# සත්‍යයෙන්ම දූතයින් කවුරුන්ද?



තමන්ව නැමදීම පිණිස අල්ලාහ් මිනිසාව මවා ඔවුන් අල්ලාහ්ගේ ධර්මය අමතක වන විට සත්‍ය ධර්මය ඔවුන්ට නැවත උගන්වා අල්ලාහ්ව සිහි කිරීම පිණිස දූතයින්ව අල්ලාහ් යැව්වේය. මෙම දූතයින් තම සමූහයේ යහපත් නායකයකු ලෙස සිට ලොවේ හා ධර්මයේ කරුණු කරා මිනිසුන්ට මග පෙන්වන්නෝය. එබැවන් සත්‍යවය විශ්වාස කිරීම අතහැරීමට මිනිසුන්ට කිසිම කාරනාවක් ඇති නොවේ.

මෙම දූතයින්ගේ යථාර්ථය කුමක්ද?

## දූතයින් මිනිසුන්ය :

සෑම දූතයෙක්ම මමිනිසුන්යැයි ශුද්ධ කුර්ආන්හි බොහෝ ස්ථානයන්හි අල්ලාහ් තහවුරු කර ඇත.අල්ලාහ් ඔවුන්ව දූත මෙහෙයුමට හා ඔහුගේ පණිවිඩය දීමට අල්ලාහ් ඔවුන්ව තෝරා ඇති බැවින් ඔවුන් අන් මිනිසුන්ට වඩා උසස් ස්ථානයක සිටිනවා යන්න පැහැදිලි වේ මේ බව ශුද්ධ කුර්ආනය මේසේ පවසයි:(ඕ මුහම්මද්!) 'මමද ඔබ මෙන්ම මනුෂ්‍යයෙකු පමණි තවද මා හට වහී පණිවිඩ පහල වන්නේය.(කහ්ෆ් 110)

එබැවින් සෑම දූතයෙක්ම මිනිසුන් වේ අන් මිනිසුන් ඉපදී මරනයට පත් වන්නා සේ ඔවුන්ද ඉපදී මරනයට පත් වන්නෝය.ඔවුන්ද රෝගී වන්නෝය. මිනිසාගේ සාමාන්‍ය අවශ්‍යතාවයන්ගෙන් මොවුන්ට කිසි භේදයක් නැත.

දේවත්වයේ කිසිවක් ඔවුන්ට නැත. මන්දයත් දේවත්වය අල්ලාහ්ට පමණක් හිමි දෙයකි.දූතයින්ට මලාඉකාවරුන් විසින් හෝ වෙනත් යම් මාර්ගයකින් අල්ලාහ්ගේ පණිවිඩය පැමිණෙනවා පමණි.

පෙර සමූහයන් පවා අල්ලාහ් ගෙන් වහී පැමිණීම පිළිබඳව පුදුමයට පත් වූ විට ඔවුන්ගේ පුදුයම වැරදි යැයි අල්ලාහ් පවසා මිනිසුන්ව යහමග යොමු කිරීමේ එකම මග වහී පණිවිඩ යැවීම තුලින් යැයි ශුද්ධ කුර්ආන්හි අල්ලාහ් පවසා ඇත:

'මිනිසුන්ට අනතුරු අඟවා අවවාද කරනු (යැයිද) විශ්වාස කළවුන්ට නිශ්චය වශයෙන්ම ඔවුන්ගේ රබ් වෙත උසස් පදවි ඇත යැයි සුබාරංචි කියනු යැයි ඔවුන්ගෙන්ම කෙනෙකුට අපි වහී (මගින් පණිවිඩ) දන්වා තිබීම මිනිසුන්ට ආශ්චර්යයක්ව වී තිබේද? නිශ්චය වශයෙන්ම මොහු පැහැදිලිම භූනියම්කරුවෙකි යැයි මෙම ප්‍රතික්ෂේප කරන්නන් කියන්නෝය' ( සූරා යූනුස් 2)

## දූතයින්ගේ තත්වයෙහි මධ්‍යස්ථබව:

සිය දේව මෙහෙයුම ඉසිලීම පිණිස මිනිසුන් අතුරින් ශ්‍රේෂ්ටයන් අල්ලාහ් තෝරා ඇත.ඔවුන් ධර්මයේ ස්ථාවර ඇත්තන්වහාසැදැහිවන්තයන්ය.අල්ලාහ් විසින් තෝරා ගනු ලැබූ සෑම දූතයෙක්ම යහමග ලැබූ සැදැහිවන්තයන් යැයි ශුද්ධ කුර්ආනය වර්ණනා කර ඇත:

'තවද අප ඔහුට ඉස්හාක් හා යඃකූබ් දයද කළෙමු. (මොවුන්) සියල්ලන්වම අප සෘජු මග යැවුවෙමු. (මෙයට) පෙර නූහ්වද ඔහුගේ පැවතෙන්නන්ගෙන් දවූද්වද, සුලෙයිමාන්වද, අය්යූබ්වද, යූසුෆ්වද, මූසාවද, හාරූන්වද, අප සෘජු මග යැවුවෙමු යහක්‍රියා කළවුන්ට මෙලෙසින්ම අප කුලී දෙන්නෙමු.85 (තවද) සකරියයාවද, යහ්යාවද, ඊසාවද,ඉල්යාස්වද (අප සෘජු මග යැවූ අතර මොවුන්) සියල්ලෝම සිල්වතුන් අතර වන්නන්ය.86(තවද) ඉස්මායීල්වද, ශුද්ධ යසඃවද, යූනුස්වද, ලූත්වද (සෘජු මග යැවූවෙමු ඔවුන්) සියල්ලම ලෝවැසියන් අතුරින් උසස් කළෙමු.87. මොවුන්ගේ පැරැණ්නන් අතරින්ද, මොවුන්ගේ පරම්පරාවෙන්ද, මොවුන්ගේ සොහොයුරන් අතරින්ද, (බොහෝ දෙනෙකු) අප තෝරා, ඔවුන්ව අප සෘජු මාරගයෙහි යැවුවෙමු' (අන්ආම් 84-87)

කෙසේ වෙතත් ඇතැම් අවස්ථාවන්හි නබිවරුන් විසින වැරදි සිදුවිය හැකියි. එසේ උවද අල්ලාහ් ඔවුන්ව එම වරදෙහිම නියලී සිටීමට ඉඩ නොහරී. ඔවුන් එයින් හැරී පැමිණෙන පිණිස ඔවුන්ට විගසින්ම අවවාධ කරනු ඇත. නමුත් එම වරද ඔවුන් උවමනාවෙන් කළ වරදක් හෝ අල්ලාහ්ට පිටු පා යුතු යන චේතනාවෙන් කළ වරදක් නොවේ.

ශුද්ධ කුර්ආනය දූතයින්ව උපුටා පෙන්වන්නේ මෙසේය: සීමාව ඉක්මවා හෝ අවතක්සේරු කර හෝ නැති මහා පාපායන්ගේන ඔවුන් ආරක්ෂා කරනු ලැබුනු මිනිසුන්ය.ඔවුන් දෙවි වරුන් හෝ දෙවියාගේ පුතුනුවන්ද නොවේ.

ඊසා තුමානන්ව මිනිසුන් දෙවියෙකු ලෙස සැලකීමේ වරද ඔහු සතුව නොවේ. යන දෙබස කියාමත් දිනයෙහි ඇති වේ යනුවෙන් ශුද්ධ කුර්ආන්හි මෙසේ සඳහන් වී ඇත :

116. තවද 'ඕ මර්යම්ගේ පුත් ඊසා! ' අල්ලාහ් හැර මා හා මාගේ මවුතුමිය නැමදීමට සුදුසු දෙදෙනෙකු ලෙසින් ගනු' යයි ජනයින්ට ඔබ කීවෙහිද?' යනුවෙන් ( අල්ලාහ් අවසාන දිනයෙහිදී ඊසා වෙතින්) අසනු ඇත.(එයට ඊසා) 'ඔබ ඉතා සුවිශුද්ධයි.මට කිසිසේත් නොගැලපෙන්නක් කීම මට යෝග්‍ය නොවේ. එසේ මා පවසා තිබුනහොත් එය නිශ්චය ලෙසින්ම ඔබ දන්නෙහිය.මාගේ සිතෙහි හට ගන්නා සිතුවිලි ගැන (පවා) ඔබ දන්නෙහිය.(නමුත්) ඔබගේ සිතෙහි තිබෙන දෙය මා නොදනිමි.නිශ්චය වශයෙන්ම ගුප්ත දේ පිළිබඳ (මනාව) දන්නා ඔබමය' යයි කියනු ඇත.117 (තවද) 'මාගේ රබ් හා ඔබගේ රබ් වන අල්ලාහ් නමදින්න' යයි (කියනා මෙන්) ඔබ අණ කළ දෙය හැර අන් කිසිවක් මා ඔවුන්ට නොකීවෙමි.මා ඔවුන් සමග සිටින තාක් ඔවුන්ගේ ක්‍රියාවන් ගැන මා දැන සිටියෙමි.(පසුව) ඔබ මා අත්පත් කළ පසු ඔවුන් පිළිබඳ අධීක්ෂණය කරන්නා ලෙසින් සිටියේ ඔබමයි.ඔබ සියළු දේ සඳහා වන සාක්ෂිකරුවාය. (සූරා මාඉදහ් 116-117)


ශුද්ධ කුර්ආන්හි බොහෝමයක් පරිච්ඡේදයන් ඉබ්රාහීම් යූසුෆ් නබි වරුන්ගේ නාමයෙන් නම් කෙර ඇත. පවිත්‍ර මර්යම් මෑනියගේ නාමයෙන් පවා එක් පරිච්ඡේදයක් ඇත.

## දූතයින් පිළිබඳ ඉසලාමයේ බැල්ම :

ශුද්ධ කුර්ආනය යනු මුහම්මද් (සල්) තුමානන්ගේ වෘතාන්තය හාඑතුමානන්ගේ පුවත් පමණක් අන්තර්ගත කර ඇති පුස්තකයක් යැයි ඇතැමුන් සිතති.එය ඊසා තුමානන්ව ගව්රවය කර එතුමානන්ට ඇති වූ අසත්‍ය අපවාදයන්ගෙන් 25 වතාවත් පරිශුද්ද කරන්නාවූ වැකි සඳහන් කර ඇති යැයි ඔවුන් දැන්ගත් විට මවිතයට පත් වන්නෝය.එපමණක් නොව මූසා තුමානන්ගේ නාමය 136 වතාවක් ශුද්ධ කුර්ආන්හි සඳහන් වී ඇත.එනමත් මුහම්මද් (සල්) තුමානන්ගේ නාමය ශුද්ධ කුර්ආන්හි සඳහන් වී ඇත්තේ පස් වතාවක් පමණී.

මීට පටහැනිව අනෙක් ධර්ම පුස්ථකයන් බැලූ කල, එහි තම තමන්ගේ දූතයන් පමණක් සඳහන් කරනවා පමණක් නොව, එම පුස්ථකයන් පිළිපදින්නා ඇතැමුන් අන් දූතයින් පිළිකුල් කරති.එනමුත් ඉස්ලාමයේ බැල්මෙහි කෙනෙකු මුස්ලිම් වීමට නම් අල්ලාහ් විසින් යවනු ලැබූ සෑම දූතෙයකුවම විශ්වාස කිරීම අනිවාර්ය වන අතර එක් දූතයකුව පවා ප්‍රතික්ෂේප කළේ නම් හෝ ඔහුව සැක කළේ නම් ඔහු ඉස්ලාමයෙන් පිට වන්නේය. එබැවින් දූතයා හා ඔවුව විශ්වාස කළ සෑම කෙනෙකුම ශුද්ධවූ අල්ලාහ් විසින් පවසනු ලැබූ සෑම කරුනක්ම විශ්වාස කළ යුතු යැයි ශුද්ධ කුර්ආනය තහවුරු කර ඇති.එබැවින් සෑම මුස්ලිම් වරයකුම අල්ලාහ්ව මෙන්ම මලාඉකාවරුන්ව හා සෑම දූතයින්වද විශ්වාස කර දූතියින් අතර භේද ඇති නොකළ යුතු යැයි ශුද්ධ කුර්ආන්යේ සඳහන් වී ඇත:

'(අපගේ) දූතයා සිය රබ් වෙතින් තමාට පහළ කර ඇති දෙය (තරයේ) විශ්වාස කරන්නෙකි.එසේම (ඔහු අනුග මනය කරන) විශ්වාසිකයන් සියල්ලෝම අල්ලාහ් වද ඔහුගේ මලාඉකාවරුන්වද, ඔහුගේ ආගම්ද ඔහුගේ දූතයන්වද විශ්වාස කරති.'ඔහුගේ දූතයන් අතර කිසිවෙකුට අප (උස් පහත් යැයි) වෙනස්කම් ඇති නොකරමු.තවද (ඕ අපගේ රබ්! ඔබගේ ආඥා) අප ඇසුවෙමු. තවද (එයට අප) කීකරු වූයෙමු.ඕ අපගේ රබ්! අප ඔබගේ ක්ෂමාව අයදිමු.(අපගේ ආපසු) මිදීමද ඇත්තේ ඔබ වෙතමය' යැයිද ඔවුන් (කන්නලව් කර) පවසති'(සූරා බකරහ් 285)



# ඊසා තුමානන් පිළිබඳ ඉස්ලාමයේ බැල්ම



# ඉතිහාසයේ

ඉතිහාසයේ ඉතා ප්‍රධාන චරිතයක් ලෙසද මානවයාට යහපතක් වූවන්ගෙන් එක් විශිෂ්ටයකු ලෙස ඊසා (අලයි) තුමානන් සැලකේ.ඔහුගේ ස්ථාවරයෙහි මිනිසුන් අතර විවිධ මතයන් ඇත.ඇතමුන් මොහු දෙවියකු ලෙසද තවත් ඇතමුන් මොහු දෙවියන්ගේ පුත්‍රයා යනුවෙන්ද පවසයි.ඊට පටහැනිව තවත් ඇතමුන් මොහුට නොයෙක් අඩුපාඩුන් හා වැරදි චෝදනා විසින් පහර දී ඇත.ඊසා තුමානන් විශයේ ඉස්ලාමයේ ස්ථාවරය කුමක්ද?


Holy
Bible

1- ඊසා (අලයි) එක් ශ්‍රේෂ්ට නබි වරෙයක්ය.

ඊසා (අලයි) තුමානන් ඉතා ශ්‍රේෂ්ට හා ගව්රවාන්විත දූතෙයකු යැයි හා ඔහුගේ මව මර්යම් තුමිය පතිවත රැක දෙවියාට යටහත් වුනු සැදැහි ස්ත්‍රියක් යැයි ශුද්ධ කුර්ආනය තහවුරු කර ඇත.ඇය ඊසා (අලයි) තුමානන්ව ලැබුවේ පියෙකු නොමැතිව අල්ලාහ්ගේ ශක්තියෙන්ය.එබිවන් ඊසා (අලයි) තුමානන්ගේ උපත මව හා පියා දෙදෙනාම නොමැතිව ඉපදුනු ආදම් (අලයි) තුමානන්ගේ උපත මෙන්ම එක් ආශ්චර්‍යයක් වේ.මොවවුන් අල්ලාහ් මැවුවේ-කුන්- (වනු) යන අල්ලාහ්ගේ වචනයෙන්ය. (අලු ඉම්රාන් 59).

2- මුස්ලිම්වරුන් ඔහුගේ ආශ්චර්‍යයන් විශ්වාස කරති:

ලාදුරු රෝගීන්ට හා අන්ධයින්ට ප්‍රතිකාර කිරීම.මළවුන්ට ප්‍රාණය දීම.මිනිසුන් අනුභව කරන හා ඔවුන් ගබඩා කර දෑ ඔවුන්ටම දැන්වීම වැනි ආශ්චර්‍යයන් බොහෝමයක් ඊසා (අලයි) තුමානන් විසින් අල්ලාහ් සිදු කර ඇත.මේ සියල්ල අල්ලාහ්ගේ අනුමැතියෙන් කරනු ලැබුනේ ඊසා (අලයි) තුමානන්ගේ දූතත්වයට පැහැදිලි සාදකයක් ලෙසයි.

3- ශුද්ධවූ උල්ලාහ්ගේ ශුද්ධ ඉන්ජීල් පුස්ථකය ඔහුට පහල වීම:

මිනිසුන්ට යහමගක් වන අලෝකයක් ලෙස හා දායාදයක් ලෙසද ඉන්ජීල පුස්ථකය අල්ලාහ් විසින් ඊසා (අලයි) තුමානන්ට පහල විය යනුවෙන් හා කාලය ගතවීමත් සමගම එහි විකෘතීන් බොහෝමයක් ඇති විය යැයි ශුද්ධ කුර්ආනය පවසා ඇත.

4- ඔවු දෙවියෙකු නොව මිනිසෙකුය:

ඊසා (අලයි) තුමානන් ආදම්ගේ පුතුන් වන මිනිසුන්ගෙන් කෙනෙකු යැයි ශුද්ධ කුර්ආනය තහවුරු කර ඇත.ඔහුව අල්ලාහ් ශ්‍රේෂ්ට කර ඉස්රාඊල් දරුන්ට දූතයකු ලෙස පත් කර ඔවු විසින් ආශ්චර්‍යයන් සිදු කළේය.මේ නිසා ඔහුට දෙවියෙකු වීමේ බලය ඇත යනුවෙන් විශ්වාස කළ නොහැකිය.ඊසා යනු අල්ලාහ් විසින් ආශ්චර්‍යයන් හා දායාදයන් පිරිනමන ලද එක් සැදැහි වන්ත ගැත්තෙකු යැයි ශුද්ධ කුර්ආනයේ සඳහන් වී ඇත.(අස් සුක්රුෆ් 59).

5- ඔහු කුරුසයේ ඇන ගසනු ලැබුවේ නැත.එනමුත් ඔහු අහසට ඔසවනු ලදි:

ඊසා (අලයි) තුමානන් කුරුසයේ ඇන ගසනු ලැබුවේ හෝ ඝාතනය කරනු ලැබුනේ නැත.එනමුත් ඔහු අහසට ඔසවනු ලදී ඊසා (අලයි) තුමානන්ගේ සතුරන් ඔහුව ඝාතනය කිරීමට සැලසුම් කළ විට තවත් කෙනෙකුව ඊසා (අලයි) තුමානන්ගේ ස්වරූපයට අල්ලාහ් පත් කර ඊසා (අලයි) තුමානන්ව අල්ලාහ් අහසට ඔසවා ගත්තේය.ඔහුගේ සතුරන් කුරුසයේ ඇන ගසා ඝාතනය කළේ ඊසා (අලයි) තුමානන්ගේ ස්වරූපයේ සිටි එම පුද්ගලයාවයි.මෙය ශුද්ධ කුර්ආන්හි මෙසේ සඳහන් වී ඇත:157.' අල්ලාහ් ගේ දූතයාද මර්යම්ගේ පුත්‍රයා වන ඊසා මසීහ්ව.නිශ්චය වශයෙන්ම අප ඝාතණය කළෙමු' යැයි ඔවුන් පැවසූ නිසාද ( අල්ලාහ් ඔවුන්ව ශාප කළේය).ඔවුන් ඔහුව ඝාතණය නොකළෝය.ඔහුව කුරුසයේ ඇනද නොගැසුවෝය.නමුත් ඔවුන්ට (ඊසා මෙන්) කෙනෙකුව සමාන කර (පෙන්ව)නු ලැබුනේය.තවද නිශ්චය වශයෙන්ම මෙම විෂයයෙහි මතභේද ඇති වූවන් (තවමත්) අවිනිශ්චිතවම සිටිති.අනුමාන කිරීම හැර ඔවුන්ට මෙය ගැන (අන්) දැනුමක් නැත තවද ඔවුන් ඔහුව (ඝාතණය කරන විටද ඔහු ඊසා යැයි) ස්ථිරවම (සැක හැර) ඝාතණය කළේ නැත.158.එසේ නොව.අල්ලාහ් ඔහුව තමන් වෙත ඔසවා ගත්තේය.තවද අල්ලාහ් බලසම්පන්නයා හා ඥාණවන්විතයා වන්නේය.(අන් නිසා 157-158).

## දූතයින්ගේ වරුක්ෂය

දූතියන්ගේ සංඛ්‍යාව අප්‍රමාණයි.පහත දැක්වෙන්නේ ඔවුන්ගෙන් ප්‍රසිද්ධ දූතයින් වේ:

### ආදම් (අලයි)

මොහු මිනිසාගේ ආරම්භකයාද පියාද වේ.අල්ලාහ් මොහුව පසින් මවා මොහුට සුජූද් කරන මෙන් මලාඉකාවරුන්ට අන කළේය.මොහු ආරම්භයේ ස්වර්ගයේ සිටිය නමුත් පසුව පොළවට යවනු ලැබුවේය.

### නූහ් (අලයි)

සත්‍යයක කරා මොහු මොහුගේ ජනයාව කැඳවුවද ඔවුන් මොහුව ප්‍රතික්ෂේප කළේය.පසුව නූහ් (අලයි) තුමානන් හා ඔහුව විශ්වාස කළවුන් හැර අන් සියල්ලන්වම තූෆාන් නම් ගංවතුරෙන් දඬුවම් කරන ලදි.

### ඉබ්රාහීම් (අලයි)

දූතියින්ගේ පියා හා අල්ලාහ්ගේ ඒක දේවවාදය කරා කැඳවූ ශ්‍රේෂ්ටම දූතයකු වේ.මුස්ලිම් වරුන්ගේ නැමදුම් දිශාව වන කඃබාව ප්‍රථමයෙන් ගොඩනැගුවේ මොහුය.

### ඉස්මාඊල් (අලයි)

ඉබ්රාහීම් (අලයි) තුමානන්ගේ පුත්‍රයා වන මොහු සිය පියානන් කඃබාව ගොඩනැගීමේදී ඔහුට දායක විය.

### ඉස්හාක් (අලයි)

මොහු ඉබ්රාහීම් (අලයි) තුමානන්ගේ තවත් පුතෙක්ය. මලාඉකාවරුන්ගේ සුභාරංචියෙන් පසු මොහු ඉපදුනේය.

### යඃකූබ් (අලයි)

ඉස්හාක් (අලයි) තුමානන්ගේ පුත්‍රයාය.මොහුට ඉස්රාඊල් යැයිද නමක් ඇත.ඉස්රාඊල් ජාතිකයින් ආරම්භ වන්නේ මොහුගෙන්ය.

### යූසුෆ් (අලයි)

මොහු යඃකූබ් (අලයි) තුමානන්ගේ පුත්‍රයාය.මොහු ජීවිතයේ දුක් වේදනාවන් බොහෝමයකට මුහුන දී අවසානයෙහි ඊජිප්තුවේ ආන්ඩාකාරයකු බවට පත් වුනේය.

## මූසා (අලයි)

මොහු ඉස්රාඊල් දරුවන් වෙත් යවනු ලැබූ ශ්‍රේෂ්ට දූතයකු වේ අල්ලාහ් මොහුට තව්රාතය දී ඇතැම් ආශ්චර්‍යයන් මගින් මොහුව ශක්තිමත් කළේයි එකල ඊජිප්තුවේ රජු ෆිර්අවුන් මොහුව ප්‍රතික්ශේප කර හිරිහැර කළේයි එබැවින් ෆිර්අවුන්ව හා ඔහුගේ සේනාව අල්ලාහ් මුහුදෙහි ගිල්වා මූසා (අලයි) තුමානන්ව හා ඔහුගේ අනුගාමිකයින්ව ආරක්ෂා කළේය.

## දාවූද (අලයි)

මොහු සිය සමූහයාගේ පාලනය දෙනු ලැබූ දූතයකු වේ.

## සුලයිමාන් (අලයි)

මොහු දාවූද් (අලයි) තුමානන්ගේ පුත්‍රයාය.මෙම දූතයාට අල්ලාහ් ඉමහත් පාලන බලයක් දී මැවීම රාශියක්ම මොහුට වශී කර දුන්නේය.

## සකරිය්යා (අලයි)

මොහු ඉස්රාඊල් දරුවන්ගේ තවත් එක් දූතයකු වේ ඊසාගේ මෑනිය වන මර්යම් තුමිය ඇති දැඩි කිරීමට භාරව සටියේ මොහුය.මොහුගේ මහලු වියේදී මොහුගේ වඳ වූ බිරිඳට අල්ලාහ් යහ්හා නම් පුත්‍රයකු දුන්නේය.

## ඊසා (අලයි)

මොහු ඉස්රාඊල් දරුවන් වෙත යවනු ලැබූ ශ්‍රේෂ්ට දූතයකු වේ අල්ලාහ් මොහුට ඉන්ජීලය දී ඇතැම් ආශ්චර්‍යයන් මගින් මොහුව ශක්තිමත් කළේය.

## මුහම්මද් (සල්)

මුළු මිනිස් සංහතියටම අවසාන දිනය තෙක් යවනු ලැබූ දූතයින්ගේ මුද්‍රාවයි.මොහුට පෙර පැමිණි සෑම දූතයකුවම සත්‍ය කරන්නෙකු ලෙස මොහු සිටී.කිසිවෙකු විසින් අසත්‍ය කළ නොහැකි ශුද්ධ කුර්ආනය අල්ලාහ් මොහුට දුන්නේය




# ඉස්ලෙමයේ දූතයා කවුරුද ?



ඉස්ලාමයේ

ඉස්ලාමයේ දූතයාගේ නම මුහම්මද් වේ

ලොවෙහි අධිකව පැතිර් ඇති නම මෙයයි සිය ක්‍රියාව හා ගුණාංග නිසා අන් මිනිසුන් විසින් ප්‍රශංසාවට ලක් වන්නා යන්න මුහම්මද් යන්නෙහි අර්ථය වේ

මුහම්මද් යනු කවුරුද?

## මෙය ඉස්ලාමයේ දූතයාගේ නාමයයි.

මුහම්මද් බින් අබ්දුල්ලාහ් බින් අබ්දුල් මුත්තලිබ් බින් හාෂිම් අල් කුරෂි වර්ෂ 570 ඉපදී 632 වන වසර අභාප්රාවප්ත විය.+මෙය සෑම මුස්ලිම් වරයකුම විශ්වාස කරන්නේය.

## සෑම මිනිසෙකුටම මොහු දූතයා වේ:

කුමන වර්ණයක් වූවද කුමන ඝනයට අයත් වූවද සෑම කෙනෙකුටම දූතයකු ලෙස අල්ලාහ් මුහම්ද් (සල්) තුමානන්ව යවා ඔවුන් සියල්ලන්ම මොහුව පිළිපැදීම අනිවාර්යය කර ඇත.මේ  බව ශුද්ධ කුර්ආනහි අල්ලාහ් මෙසේ පවසයි:

‘(ඕ මුහම්මද්!) ‘ජනයිනි! නිශ්චය වශයෙන්ම ඔබ සියල්ලන්ටම අල්ලාහ් ගේ දූතයා මා වෙමි’ (සූරා අහ්රාෆ් 158).


## මොහුට ශුද්ධ කුර්ආනය පහල වී ඇත:

නබි මුහම්ද් (සල්) තුමානන්ට අල්ලාහ් ශ්‍රේෂ්ට හා අවසාන දේව පුස්ථකය වන ශුද්ධ කුර්ආනය පහල කළේය.එය මුහම්මද්  තුමානන් ඉදිරියෙහි හෝ ඔහුගෙන් පසු හෝ එය අසත්‍ය කිරීමට නොහැකිය.

## සෑම දූතයෙකුටම මුද්‍රාවයි:

මුහම්ද් (සල්) තුමානන්ව අල්ලාහ් නබිවරුන්ගේ මුද්‍රාව ලෙසින් යවා ඇති බැවින් ඔහුට පසු තවත් නබි වරයකු පැමිණෙන්නේ නැත.ශුද්ධ කුර්ආනහි මෙය අල්ලාහ් මෙසේ පවසයි:

(ඔහු) අල්ලාහ්ගේ දූතයාවද වකෘවරුන්ට මුද්‍රාවක්වද සිටින්නේය’ ( සූරා අහ්සාබ් 40)



## ඉස්ලාමයේ දූතයා වන මුහම්මද් (සල්) තුමානන් ගැන හඳුනා ගැනීමට ඉක්මන් ගමනක්:

1- ඔහුගේ උපත:

570 වන වසර අරාබි අර්ධද්වීපයේ උපත ලැබුවේය. මොහු ඉපදුනේ පියෙකු නැති අනාතයකු ලෙසයි.ළමා වියෙහිම මොහුට මවද අහිමි විය.පසුව මොහුව රැකබලා ගත්තේ මොහුගේ සීයා අබ්දුල් මුත්තලිබ් වේ.

2- මොහුගේ ජීවිතය:

මොහුගේ දූතත්වයට පෙර අවුරුදු හතලිහක් කුරයිෂ් ගෝත්‍රයෙහි ජීවත් වූහ.යහ ගුණාංග,ස්ථිර බව හා තියුනු බුද්ධියෙහි මොහු උදාහරනයක් විය.සත්‍ය වන්තයා හා විශ්වාස වන්තයා යන පටඹැදි නාමයන් මොහුට දෙනු ලැබුවේද එනිසයි. එඬේරුවෙකුව සිටි මොහු පසුව ව්‍යාපාර කිරීමට ආරම්භ කළේය.

මුහම්මද් (සල්) තුමානන් නබිත්වයට පෙරම පිලිම වන්දනා ප්‍රතික්ෂේප කරමින් ඉබ්රාහීම (අලයි) තුමානන්ගේ ධර්මය පිළිපදිමින් සිටියේය.මොහු ලිවීමට හෝ කියවීමට නොදත් කෙනෙකුව සිටියේය.

3- දූත මෙහෙයුම ලැබීම:



මක්කාවට අසල තිබෙන නූර් නම් කන්දෙහි ඇති හිරා ගුහාවෙහි තනිවම අල්ලාහ්ව සිහි කර නැමදුම් කිරීම මුහම්ද් (සල්) තුමානන්ගේ සිරිතක් විය.මොහුගේ වයස අවුරුදු 40ක් පරිපූර්න විය.දවසක් ඔහු හිරා ගුහාවේ අල්ලාහ්ව මෙනෙහි කරමින් සිටි විට අල්ලාහ්ගෙන් වහී පැමිණ ශුද්ධ කුර්ආනය ඔහුට පහල වීමට ආරම්භ විය.ඔහුට පහල වූ ප්‍රථම ශුද්ධ කුර්ආන් වහී පණිවිඩය මෙයයි: ‘ඔබගේ මැවුම් කරුවාගේ උදව්වෙන් කියවන්න’ (ශුද්ධ අලක් 1)

මෙයින් අල්ලාහ් ඔහුට හැඟවූයේ කියවීම දැනුම ආලෝකය හා මිනිසුන්ගේ යහමගෙහි යුගය ආරම්භ වී ඇත යන්නයි.පසුව වසර විසි තුනක කාලයක් ඔහුට වහී පහල වෙමින් තිබුනි.





4 ඔහු ඇරයුම ආරම්භ කිරීම:

ප්‍රථමයෙහි නබි මුහම්මද් (සල්) තුමානන් අල්ලාහ් ගේ සත්‍ය දහම වෙත මිනිසුන්ව ආරාධනා කිරීම වසර තුනක් රහසිගතව කළේය. තවත් වසර දහයක් මක්කාවෙහිම එලිපිට මිනිසුන්ව ආරධනා කළේය. අනෙක් දූතයින්ට මෙන්ම මුහම්මද් (සල්) තුමානන්ගේ පිළිපදින්නන් අධික දෙනෙකු දුප්පතුන්ය.මෙම කාලයෙහි නබි (සල්) තුමානන් හා මුස්ලිම්වරුන් ඔවුන්ගේ ගොත්‍රිකයින් වන කුරයිෂ් වරුන්ගෙන් බරපතල පීඩාවන් හා අසාධාරනයන්ට මුහුන දුන්නෝය.හජ් වන්දනාවට මක්කාවට පැමිණෙන නොයෙක් ගෝත්‍රිකයින්ට ඔහු ඉස්ලාමය කියා දෙමින් සිටියේය.එයින් මදීනා වැසියන් ඉස්ලාමය පිළිගත් බැවින් මුස්ලිම් වරුන්ට මදීනාවට සංක්‍රමණය කිරීම පහසුවෙන් ආරම්භ විය.

5 ඔහුගේ සංක්‍රමණය:

ඔහුගේ ගෝත්‍රිකයින් වන කුරයිෂ්වරුන් ඔහුව ඝාතනය කිරීමට සැලසුම් කෙළෝය.පසුව 622 වන වසර ඔහු යස්රිබ් නමින්ද හදුනනු ලබන මදීනාවට සංක්‍රමණය කළේය. එවිට ඔහුගේ වයස වූයේ පනස් තුනකි් මදීනාවෙහි වසර දහයක් මිනිසුන්ව ඉස්ලාමය කරා ඇරයුම් කර සලාතය, සකාත් හා යහගුණාංග වැනි ඉස්ලාම් රීතීන් ගැන උපදෙස් දී අන කරමින් සිටියේය.




6 ඔහු ඉස්ලාමය පැතිරීම:

මදීනාවට සංක්‍රමණය කිරීමෙන් පසු එහි වසර දහයක (622 632) ඉස්ලාම් වෙත ඇරයුම් කළ නබි මුහම්මද් (සල්) තුමානන් එහි ඉස්ලාමීය සංසංකෘතයික බීජය පැල කළේය.මදීනාවේ ඉස්ලාමයේ සංස්කෘතියේ අත්තිවාරම දමා ගෝත්‍රික මතය අවලංගු කර දැනුම ව්‍යාප්ත කළේය.මිනිසුන් එකිනෙකා අතර සහෝදරත්වයෙන් උදව් කර ගැනීමේ ගුණාංගයද ඇති කර ඔවුන්තුල එක් පිළිවෙලක්ද නබි තුමානන් ඇති කළේය.මෙසේ සාමයෙන් මිනිසුන් යහමගට නැඹුරුවනු දුටු ඇතැම් ගෝත්‍රිකයින් ඊර්ෂියාවට පත් වී ඉස්ලාමය විනාශ කිරීමට තැත් කළෝය. මුස්ලිම් වරුන්ට මුස්ලිම් නොවන්නන් අතර සටන් බොහෝමයක් ඇති වූයේ මෙයින් පසුවයි.එනමුත් අල්ලාහ් ඔහුගේ ධර්මයට හා ඔහුගේ දූතයාට උදව් කළ නිසා මිනිසුන් ඉස්ලාමයට නැඹුරු වීම අඛන්ඩ විය.අරාබි අර්ධද්වීපයේ ඇති මක්කා ඇතුළු අනෙක් නගරයන්ද ඉස්ලාමයේ මහිමය වටහා සිය කැමැත්තෙන්ම ඉස්ලාමය පිළිගැනීම ආරම්භ විය.

7 ඔහුගේ නික්ම යෑම.

මුහම්මද් (සල්) තුමානන් තම දූත මෙහෙයුම් පරිපූර්ණ කර අල්ලාහ් ගේ ධර්මය මිනිසුන්ට පිරිපූර්ණයෙන් පිරිනැමීමෙන් පසුව හිජ්රි 11 සෆර් මසෙහි  නබි තුමානන් දැඩි ලෙස රෝගයට පත් විය.මෙයින් දැඩි අපහසුතාවෙයන් පෙලුනු නබි (සල්) තුමානන් රබීඋල් අව්වල් 12 වන දින සඳුදා දිනෙහි (632/8/6) මෙලොවින් සමු ගත්තේය.එවිට ඔහුගේ වයස හැටක් විතර විය.ඔහු භූමිධානය කරනු ලැබුනේ මස්ජිදුන් නබවී අසලැති ඔහුගේ බිරිය ආයිෂා (රලි) තුමියගේ නිවසෙහිය.






# මධ්‍යස්ථ මතෙහි ඇත්තන්ගේ බැල්මෙහි ශුද්ධ අල්ලාහ්ගේ දූතයා පිළිබඳ මතය.



කුමන ඝනයේ සංස්කෘතියට අයත් කෙනෙකු වුවද, නබි (සල්) තුමානන්ගේ වෘතාන්තය හදාරන සෑම කෙනෙකුම මවිතයට පත්වේ යන්න නියතයි.

මේ අනුව ලොවෙහි බොහෝ විශිෂ්ටයන් නබි මුහම්ද් (සල්) තුමානන් පිළිබඳව තමන්ගේ පකාශයෙන් පවසනවා පමනක් නොව ඔවුන්ගේ පොතහිද මේ බව සඳහන් කර ඇත.



### 1924 ශදමබටපෂබාස් නැමති ඝන්තයේ ගාන්ධි තුමා මෙසේ පවසා ඇත:

කිසිඳු තර්කයකින් තොරව මිලියන ගනන් මිනිසුන්ගේ සිත් දිනාගත් පුද්ගලයා පිළිබඳ දැනගැනීමට ප්‍රිය කලෙමි. ඔහුට හමුවුනු සෑම බාධාකයක්ම ජය ගත්තේ කඩුව නොවේ යැයි මා මුළුමනින්ම විශ්වාස කළෙමි. නබිවරයාගේ චාම් බව, නිරහංකාර බව, පොරොන්දු ඉටු කිරීම විෂයයෙහි ඔහුට තිබුනු දැඩි ඕනෑකම, ඔහුගේ මිතුරන්ට සහ අනුගාමිකයන්ට දැක්වූ තියුණු කැපවීම, ඔහුගේ වීරත්වය, නිර්භීතකම සහ තම මෙහෙය හා දෙවියන් කෙරෙහි ඔහුට තිබුනු අචල විශ්වාසය ආදිය මිස ඔවුන්ට හමුවුනු සෑම බාධාකයක්ම ජය ගත්තේ කඩුව නොවේ. චක්තෘවරයෙකු වේවා දේව අවතාරයක් වේවා කිසිදු මිනිසෙකු අංග සම්පූර්ණ යැයි මා නොසිතමි. විමර්ශනය කරන්නෙකු සෑහීමට පත් කරනා ආකාරයෙන් මුහම්මද්ගේ ජීවිතයේ සෑම කරුණක්ම විස්තර කිරීම මට අවශ්‍ය නොවේ. නමුත් ඔහු මිනිසුන් දශ ලක්‍ෂයකින් කෙනෙකු බව මා වටහා සිටීම ඔහුව මෙසේ වර්ණනාක කිරීම සඳහා මට ප්‍රමාණවත් වෙයි.දෙවියන්ගේ බියබැති බවෙන්ම ජීවිතය ගෙවූ ඔහු දුගියෙකු ලෙසින්ම මරණයට පත්විය උත්සවාකාරයෙන් සිය අවසන් කටයුතු කිරීම ඔහුට අවශ්‍ය නොවූ අතර මරණ මංචකයේදී පවා තමා ඉතා සුලුවෙන් ණය ගැතිව සිටි පුද්ගලයාව වුවද ඔහු අමතක නොකළේය.

> කිසිඳු තර්කයකින් තොරව මිලියන ගනන් මිනිසුන්ගේ සිත් දිනාගත් පුද්ගලයා පිළිබඳ දැනගැනීමට ප්‍රිය කලෙමි. ඔහුට හමුවුනු සෑම බාධාකයක්ම ජය ගත්තේ කඩුව නොවේ යැයි මා මුළුමනින්ම විශ්වාස කළෙමි.


Mahatma Gandhi, statement published i 'YoungIndia,' 11/ 9 1924



### ශ්‍රේෂ්ටයන් සිය දෙනා යන සිය ග්‍රන්ථයේ මයිකල් හාර්ට් මෙසේ පවසයි:

ලොව වැඩිම බලපෑම ඇති කළ පුද්ගලයන්ගේ ලැයිස්තුවේ මුලින්ම තැබීමට මා මුහම්මද් තෝරා ගෙන තිබීම පාඨකයන් බහුතරයක් විශ්මයට පත් කළ හැකි අතර තවත් අය මගෙන් මෙය ගැන ප්‍රශ්න කරනු ඇත.එනමුත් ලෞකික හා අධ්‍යාත්මික යන ඉසව් දෙකෙහිම උපරිමයෙන් ජය අත් කර ගත් එකම පුද්ගලයා ඉතිහාසයේ මුහම්මද් පමණි.

Michael Hart in 'The 100, A Ranking of the Most Influential Persons In History,' p.33



ප්‍රංශ ජාතික ඇල්ෆෝන්ස් නම් ප්‍රසිද්ධ කවියා 'තුර්කියේ ඉතිහාසය' නම් ග්‍රන්තයේ නබි (සල්) තුමානන් පිළිබඳව මෙසේ පවසා ඇත :

'කෙනෙකුගේ බුද්ධියේ ප්‍රමාණය මැනිය හැක්කේ සුළු වත්කමකින් ඉමහත් ඉලක්කයක් තබා දැවැන්ත ප්‍රතිපලය ලබා ගැනීම යනාදී කරුනු තුනෙන්ය.මේ අනුව ඉතිහාසයේ මුහම්මද්ට සමාන කළ හැකි තවත් ශ්‍රේෂ්ටයකු සිටීද?

(ග්‍රන්ථය Histoire de la Turquie 1 වන වෙළුම 111 වන පිටුව)



රාමක්‍රිශ්ණා නම් ඉන්දීය දාර්ශිකයා මෙසේ පවසයි:

'තත්වයන් වෙනස් වු නමුත් දෙවියන්ගේ වක්තෘවරයා වෙනස් වුයේ නැත ජයග්‍රහණයේ වේවා, පරාජයේ වේවා, බලය තිබෙන විට සහ හිරිහැර විඳින විට වේ, ධනය ලැබෙන විට වේවා දුගී බවේ වේවා ඔහු වෙනස් නොවී එකම එක් චරිතයක් පමණක් පෙන්නුම් කළේය. දෙවියන්ගේ මාර්ග හා නීති මෙන්ම දෙවියන්ගේ වක්තෘවරයාද වෙනස් කළ නොහැකි කෙනෙකු විය'

(ග්‍රන්ථය Mhuhammad The Prophet of Islam පිටුව 24)



ඇල්මේනියාවේ ප්‍රසිද්ධ කවිවරිය සිය සෙනෙහි වන්තයාට තමන් ඉස්ලාමය හා මුහම්මද් තුමානන් පිළිබඳව මවිතයට පත් වී ඇත යැයි පවසා එක් ලිපියක සඳහන් කර ඇත:

'ඔහු වයස හැත්තෑවට සමීප වු විටද ඉස්ලාමය පැතිරීම සෑහේ යැයි දුර්වල වුයේ නැත.එනමුත් ඔහු දිනින් දින ශක්තිමත් විය.

බාත්රිනා මොම්සන් ඇයගේ Goethe und die arabische Welt යන ග්‍රන්ථයේ සඳහන් කර ඇති

ස්ටෝබාට් ජේම්ස් විලියම් මෙසේ පවසයි:

'මේ මිනිසා (මුහම්මද්) තුල බලයේ සහ මානව උදාරත්වයේ සංරචක තිබෙනු ඕනෑම කෙනෙකුට පෙනේ... ඔහු අත් කර ගත් කාරියෙහි සදාකාලික බව සහ එය අත් කර ගැනීම සඳහා ඔහුට තිබුනු පහසුකම්වල ශුද්ධ ප බව බලන කල ලොවේ වෘතාන්ත කිසිවක මක්කාවේ නබිවරයාගේ (මුහම්මද්ගේ) නම තරම් බැබලෙන අන් නාමයක් නොමැත'

(ග්‍රන්ථය Islam and Its Founder පිටුව 227-228)



## සයිමන් ඔකලේ මෙසේ පවසයි:

'ඔහුගේ ප්‍රචාරය නොව අපව විශ්මයට පත්කළ යුත්තේ ඔහු දෙසු ආගමේ සදාතනික බවයි. එදා මක්කාවෙහි සහ මදීනාවෙහි ඔහු ඇති කළ එම පවිත්‍ර හා අංගසම්පූර්ණ පැහැදීම ශත වර්ෂ 12 ක විප්ලවයකින් පසුවද ඉන්දියාවේ, අප්‍රිකාවේ සහ තුර්කියේ ඉස්ලාම් ධර්මය වැළඳ ගන්නා කෙනෙකු කෙරෙහිද පිළිබිඹු විය'

(ග්‍රන්ථය History of the Saracen Empire පිටුව 45)

> එදා මක්කාවෙහි සහ මදීනාවෙහි ඔහු ඇති කළ එම පවිත්‍ර හා අංගසම්පූර්ණ පැහැදීම ශත වර්ෂ 12 ක විප්ලවයකින් පසුවද ඉන්දියාවේI අප්‍රිකාවේ සහ තුර්කියේ ඉස්ලාම් ධර්මය වැළඳ ගන්නා කෙනෙකු කෙරෙහිද පිළිබිඹු විය



## විල් දියුරන්ත් ඔහුගේ ප්‍රසිද්ධ සංසකෘතික ග්‍රන්ථයේ මෙසේ පවසා ඇත :

මිනිසුන් තුල ඉමහත් බලපෑමක් ඇති කළවුන්ගේ ශ්‍රේෂටත්වය ගැන අප තීන්දු දෙන්නේ නම් ඉතිහාසයේ ශ්‍රේෂ්ටම පුද්ගලයා මුහම්ද් යැයි අප පවසන්නෙමු. පිළිමයකට දෙනු ලබන හරසරින් යුතුව, ස්නේහබර කුසලතාවයෙන් හා ප්‍රවේශමෙන් පිටපත් කරනු ලදුව මුස්ලිම්වරුන් අකුරු ඉගෙන ගන්නට හා කියවන්නට යොදා ගන්නා පුස්තකයක් ලෙසින් හා එයිනික්බිති ඔහුගේ අධ්‍යාපනයේ අරටුව හා මුදුන් මල් කඩ ලෙසින්ද පවතින කුරාඅනය, සියවස් 13 ක කාලයක් මුළුල්ලේ කෝටි සංඛ්‍යාවක් මිනිසුන්ගේ මතකය පුරවා, පරිකල්පනය පුබුදා, චරිත නිර්මාණය කර, ඇතැම් විට බුද්ධිය පවා කම්පනයට පත් කරමින් සිටියි. අනෙක් ආගම් සියල්ල හා සසඳන කල පිළිම වැඳුමෙන් හා පූජක ක්‍රමයෙන් තොර ඉතාම චාම් එමෙන්ම ගුප්ත බව සහ වතාවත් ඉතාම අඩු, චාම් ධර්මයක් එය චාම් මිනිසුන්ට හිමි කර දුන්නේය.එහි ගැබ්ව ඇති පණිවිඩ එය අනුගමනය කරන්නන්ගේ සදාචාරාත්මක හා සංස්කෘතික මට්ටම ඉහළ නැංවුයේය. සමාජ චර්යාව ප්‍රවර්ධනය කළේය. සනීපාරක්ෂාව ගැන කියා දුන්නේය.මිත්‍යා විශ්වාසය හා කුරිරුකම් අවම කළේය. වහලුන්ගේ තත්වය නගා සිටුවේය.පීඩනයට ලක්වුවන්ගේ ගරුත්වය හා අභිමානය උසස් කර සුදු මිනිසාගේ ලෝකයේ දැකිය නොහැකි ලෙසින් මුස්ලිම්වරුන් අතර පැහැදිලි මනසේ හා අමද්‍යපානයේ මට්ටම ඉහළ නැංවීය. ජීවිතයේ සීමාවල සහ එහි අසීරුතා විෂයයෙහි මැසිවිලි නොනගන පිළිගැනීමක් එය මිනිසුන් අතර ඇති කළේය.එයත් සමගම ඉතාහාසයේ අතිශය විශ්මයජනක පරිච්ඡේදයක් ඔවුන්ට හිමි කර දුන්නේය.තවද ඕනෑම දැඩි මතධාරී කිතුනුවකු හෝ යුදෙව්වෙකු වුවව පිළිගනු ඇති ආකාරයෙන් ආගම එය නිර්වචනය කළේය.

> 'මිනිසුන් තුල ඉමහත් බලපෑමක් ඇති කළවුන්ගේ ශ්‍රේෂටත්වය ගැන අප තීන්දු දෙන්නේ නම් ඉතිහාසයේ ශ්‍රේෂ්ටම පුද්ගලයා මුහම්ද් යැයි අප පවසන්නෙමු'
>
> විල් දියුරන්ත්

Will Durant, In The Story of Civilization13/47

ඉස්ලාමයේ දරුනු හතුරෙකු ඉස්ලාමය වැළඳ ගැනීමෙන් පසුව පහත සඳහන් විශ්මිත වෘතාන්තය පැවසුවේය : ක්‍රි:ව 628 දී ඉස්ලාමය වෙත ඇරයුම් කර ඇති නබි මුහම්මද් (සල්) ලිපිය රෝමයේ රජු හිරක්ල්ට පැමිණි විට ඔහු එමගින් විශ්මයට පත් විය. පසුව එම දූතයාගේ ඥාතියෙකුව හෝ ඔහුව හඳුනන කෙනෙකුව කැඳෙව්වේය. එවිට අබු සුෆ්යාන් (එසමයෙහි නබි තුමානන්ගේ දරුනු සතුරෙකුව සිටියේය) ව්‍යාපාරය සඳහා සිරියාවට පැමිණ සිටියේය. මෙය දැනගත් මන්ත්‍රිවරුන් ඔහුව හා ඔහු සමඟ සිටිය අරාබි වරුන්ව මාලිගාවට රැගෙන ආවෝය. මෙය සත්‍ය දූතයා දැයි දැනගැනීම පිණිස හිරක්ල් පරිවර්ථකයා හරහා ඔවුන්ගෙන් ප්‍රශ්න ඇතැමක් ඇසුවේය.සෑම ප්‍රශ්නයකටම අබූ සුෆ්යාන් පිළිතුරු දුන් පසු හිරක්ල් අබූ සුෆ්යාන්ට මෙසේ පැවසුවේය :

මා ඔබගෙන් ඔහුගේ පවුල ගැන ඇසූ විට 'ඔහු ගව්රවාන්විත පවුලෙන් ඉපදුනු කෙනෙකි' යැයි ඔබ පැවසුවෙහිය.ඇත්තෙන්ම දූතයින් තෝරනු ලබන්නේ සමාජයේ ඉතා ගව්රවාන්විත් පවුලෙන්ය.(තමන් නබි වරයෙක් යන) වදන මොහුට පෙර කිසිවෙකු පවසා තිබේදැයි මා ඇසූ විට ඔබ 'නැත' යැයි පිළිතුරු දුන්නෙහිය.යමෙකු එසේ පවසා තිබුනේ නම් මුහම්මද් ඔහුව පිළිපදිනවා යැයි ඔබ පවසනු ඇත.

මොහුගේ ප්‍රචාරයට පෙර මොහු බොරු පවසා ඇත යැයි ඔබලා චෝදනා කර තිබේදැයි මා ඔබගෙන් ඇසූ විට ඔබ එවිටද 'නැත' යැයි පිළිතුරු දුන්නෙහි. එමගින් මා වටහා ගත්දෙය කුමක්දයත්, මිනිසුන්ගේ විශයෙහි බොරු පවසා නැති කෙනා අල්ලාහ් ගේ විශයෙහි කිසිවටක බොරු පවසනු නැත යන්නයි.

ඔහුව පිළිපදින්නේ ප්‍රබූවරුන්ද නැතිනම් දුර්වලයින්දැයි මා ඇසූ විට 'ඔහුව පිළි පදින්නේ දුර්වලයින් වේ' යැයි ඔබ පිළිතුරු දුන්නෙහිය සෑම දූතයින්ගේ අනුගාමකයින් වූයේ දුර්වලයින්මයි.ඔවුන්ගේ සංඛ්‍යව අධික වන්නේද නැතිනම් අඩු වන්නේදැය මා ඇසූ විට 'අධික වන්නෝය' යැයි ඔබ පිළිතුරු දුන්නෙහි. විශ්වාසයේ කරුනු පරිපූර්ණ වන තෙක් මෙසේ අධික වෙමින් පවතී.

ඔහුව පිළිගත්තවුන් එම ධර්මයෙහි යම් කරුණක් පිළිකුල් කිරීම හේතුවෙන් ඔහුගෙන් වෙන් වී තිබේදැයි මා ඇසූ විට 'නැත' යැයි ඔබ පිළිතුරු දුන්නෙහි සත්‍ය විශ්වාසය සිතෙහි ඇතුළු වීමෙන් පසු එය පිට නොවේ.

ඔහු රවට්ටන්නේදැයි මා ඔබගෙන් ඇසූ විට 'නැත' යැයි ඔබ පැවසුවෙහි. දූතයින් කිසිවිටෙක රවට්ටන්නේ නැත.

ඔහු ඔබට කුමක් අන කරන්නේදැයි මා ඇසූ විට ' අල්ලාහ්ට කිසිවක් සමාන නොකර ඔහුව නමදින මෙන් අන කර, පිළිම වන්දනාවෙන් අපව වළක්වා සලාතය කරන මෙන්ද සත්‍ය පැවසන මෙන් හා පතිවර රකින මෙන් ඔහු අන කරනවා' යැයි ඔබ පැවසුවේය.

ඔබ පවසන දෑ සත්‍ය නම්, මාගේ පාදය තිබෙන මෙම ස්ථානය ඔහුගේ පාලනයට පැමිණේ් ඇත්තෙන්ම මෙවැනි දූතයකු පැමිණෝ යැයි මා දැන සටියෙමී එනමුත් ඔහු ඔබගෙන් කෙනෙකු යැයි මා නොසිතුවෙමි.ඔහු වෙත යෑමට මාහට හැකි වූයේ නම් ඒ වෙනුවෙන් මා මුළු උත්සයහ දරමී (බුකාරී : 7)



# මුහම්මද් (සල්) තුමානන්ගේ ඇතැම් වෘතාන් හා ඔහුගේ ගුණාංග කිහිපයක්.



නබි

නබි මුහම්මද් (සල්) යහගුණාංගයෙහි උසස්ම උදාහරනයක් වනවාට සාක්ෂි දරන්නේ ධ්‍යම මත දරන්නන් පමනක් නොව, ඔහුගේ සතුරන් පවා එයට සාක්ෂි කරුවන් වී ඇත. නබි තුමාන්ගේ ගතිගුන ශුද්ධ කර්ආනය යැයි වර්ණානා කරනු ලැබී ඇත.

නබි මුහම්මද් (සල්) තුමානන්ගේ ගතිගුන ගැන ආයිෂා (රලි) තුමියගෙන් අසනු ලැබූ විට ඇය මෙසේ පැවසුවාය.(ඔහු ශුද්ධ කුර්ආනයයි).එනම් ශුද්ධ කුර්ආනහි සඳහන් වී ඇති සෑම යහක්‍රියාවක්ම තම ජීවිතෙය් අන්තර්ගත කරන්නෙක්ව ඔහු සිටියේය.

ඔහුගේ ඇතැම් චෘතාන් හා ගුණාංග කිහිපයක්:

## ඔහුගේ නිහතමානීබව :

නබි මුහම්මද් (සල්) තුමන්ව ගව්රවය කිරීම පිණිස සහාබාවරුන් නැගී සිටීම ප්‍රිය නොකළා පමණක් නොව, එසේ කළ සහාබාවරුන්ව නබි තමානන් වලක්වාද ඇත.තමන්ගේ ප්‍රාණයටත් වඩා ඉහලින් සළකන නබි තුමානන් වෙනුවෙන් ඔවුන් නැගී නොසිටියේ එමනිසාය.මන්දයත් එසේ ඔහු පැමිණෙන විට නැගිටීම නබි තුමානන් අප්‍රිය කරන බව ඔවුන් දැන සිටියෝය.(අහ්මද් 12345).

අදී බින් හාතිම් යනු අරාබි වරුන්ගේ ප්‍රධානීන් හා නායකයින්ගෙන් කෙනෙකි. මොහු ඉස්ලාමය වැළඳ ගැනිමට පෙර නබි මුහම්මද් (සල්) තුමානන්ගේ සත්‍යබව පරීක්ෂණය කිරීමට පැමිණි විට ඔහුගේ නිහතමානීබව වටහා ගත්තේය.අරාබියේ මෙතරම් ප්‍රසිද්ධ මොහු කිස්රා හා කයිසර්හි රජුන්ගේ ජීවිතයක් ගත කරනු ඇත යැයි සිතමින් පැමිණි මොහු නබි තුමානන් ඉතා සාධාරන මිනිසෙකුමෙන් සිටීම මොහු දැක මවිතයට පත් විය.නිහතමානීබව සෑම දූතයින් සතුව ඇති ගුණාංගයකි.

සභාවෙහි සිටින විට ඔහුද සහාබාවැන්ගෙන් කෙනෙකු මෙන් ඔවුන් සමඟම වාඩි වෙමින් සිටී ඔවුන්ගේ නායකයා මොහු යැයි පෙන්වා දිමට පවා මොහුට විශේෂ අසුනක් හෝ නොතිබුනි. අමුත්තෙක් නබි මුහම්මද් (සල්) තුමානන්ව මුනගැසීමට පැමිණි විට ඔහු සාමාන්‍ය පුද්ගලයකු මෙන් සිටි නිසා 'ඔබලා අතර මුහම්මද් කවරුන්ද?' යැයි අසා දැනගත යුතුව තිබුනි.(බුකාරී 63).

එතුමානන් කෙතරම් කාර්‍ය බහුලව සිටියද, අන් මිනිසුන්ගේ අවශ්‍යතා හා උදව් පවා කිරීමට ඔහු අසමත් වූයේ නැත යැයි ඇතැම් සහාබාවරුන් දන්වා ඇත.(බුකාරී 5724)

වරක් ශ්‍රේෂ්ට සහාබිවරයා උමර් (රලි) නබි මුහම්මද් (සල්) තුමානන් මුනගැසීමට ගිය විට එතුමානන් නිදා සිටි පැදුරෙහි සලකුණු ඔහුගේ ශරීරයේ පතිත වී තිබුනු දැක අඬන්නට විය.එවිට නබි තුමානන් 'ඔබ අඬන්නේ මන්ද?'යැයි ඇසුවේය. එවිට උමර් (රලි) නබි තුමානනී, කිස්රා හා කයිසර් රජුන් සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන නමුත් ඔබ දුගී ජීවිතයක් ගතකරන්නේය' යැයි පැවසුවේය.එවිට නබි තුමානන් 'මෙය ඔවුන්ට මෙලොවෙහි ලැබී අපට ආකිරාවේ ලැබීම මගින් ඔබ තෘප්තියට පත් නොවන්නේද' යැයි ඇසුවේය.(බුකාරී 3503)

> තමන්ගේ අවශ්‍යතාවයන් තමන්ම ඉටු කර ගන්නවා පමණක් නොව, නිවැසියන්ගේ කාර්‍යයන්හිදී ඔවුන්ට උදව් වන්නෙක්ව සිටියේය.



තමන්ගේ අවශ්‍යතාවයන් තමන්ම ඉටු කර ගන්නවා පමණක් නොව, නිවැසියන්ගේ කාර්‍යයන්හිදී ඔවුන්ට උදව් වන්නෙක්ව සිටියේය.එතුමානන් නිවසෙහි කෙසේ සිටියේය යැයි සිය බිරඳ ආයිෂා (රලි) තුමියගෙන් විමසූ විට 'ඔහු නිවැසියන්ගේ කාර්‍යයන්හි නියැලී සිටි' යැයි පිළිතුරු දුන්නාය. (බුකාරී 644)

තවද ඔහුගේ පාවහන් ඔහුම පිරිසිදු කර ඔහුගේ (ඉරුණු) ඇඳුම් ඔහුම මසා ගන්නේය. (අහ්මද් 24749)

කවුරුන්ගේ සිතෙහි සුළු ප්‍රමාණයක් හෝ ගර්වය ඇත්තේද ඔහු ස්වර්ගයට නොපිවිසේ' යැයි මුහම්ද් (සල්) තමානන් පවසා ඇත.(මුස්ලිම් 91)

### දයාව :

'දයාව දක්වන්නන්ට පරම දයාබරයා දයාව දක්වන්නේය. එබැවින් පොළවෙහි සිටින්නන්ට ඔබ දයාව දක්වන්න, අහසෙහි සිටින්නා වූ ඔබට දයාව දක්වනු ඇත' යැයි මුහම්මද් (සල්) තුමානන් පවසා ඇත.(අබු දාවුද් 4941)

නබි (සල්) තුමානන්ගේ කරුනාව නොයෙක් ආකාරයේ පැහැදිලි වී ඇත. එයින් සමහරක් පහත සඳහන් වී ඇත:

### දරුවන් කෙරෙහි ඔහු දැක්වූ කරුනාව :

- සලාතය යනු ඉස්ලාමයේ ඉතාමත් ප්‍රධාන කුලුනකි.එහිදී කිසිම ආකාරයේ කතාබහ කිරීම හෝ අධිකව සෙලවීම වැනි දෑ සිදුවිය නොහැකිය.මෙසේ තිබියදීත්, වරක් නබි තුමානන් උමාමා බින්තු සයිනබ් ඔහුගේ මිනිබිරිය වඩාගනිමින් සලාතය ඉටු කළේය.ඔහු සුජූදයට යන විට ඇයව පහල තබා නැවිතත් නැගිටින විට ඇයව වඩා ගනිමින් සලාතය ඉටු කළේය.(බුකාරී 494).
- නබි (සල්) තුමානන් සලාතය ඉටු කරමින් සිටින විට දරුවෙකු අඬන ශබ්දයක් ඇසූ විට ඔහු සලාතය කෙටි කර සීඝ්‍රයෙන් ඉටු කළේය.මේ පිළිබඳව නබි තුමානන් මෙසේ පැවසුවේය : මා සලාතයට සිට ගත් විට දීර්ඝව ඉටු කිරීමට සිතමි එනමුත් එවිට මාහට දරුවෙකුගේ ඇඬීමේ ශබ්දයක් ඇසුනු විට එම දරුවාගේ මවට අපහසු විය හැකි බැවින් මා මාගේ සලාතය කෙටි කරගන්නෙමි (බුකාරී 675).



## ස්ත්‍රීන් කෙරෙහි ඔහු දැක්වූ කරුනාව:

- ස්ත්‍රීන් හා දරුවන්ව නිසි ලෙස වගබලා ගන්නට නබි මුහම්ද් (සල්) තුමානන් දිරි ගන්වා ඇත.

'කවරෙකුට හෝ ස්ත්‍රී දරුවෙකු හෝ අධිකව ලැබී ඔහු ඇයව නිසි ලෙස වැඩුවේ නම් ඔවුන් මොහුව නිරයෙන් ආරක්ෂා කරන්නන් වනු ඇත' යැයි නබි (සල්) තුමානන් පවසා ඇත.(බුකාරි 5649).

- එපමණක් නොව, පොදුවේ ස්ත්‍රීන්ට යහපත පතා උපදෙස් දෙන මෙන් හා ඔහුන්ව නිසි ලෙස සැලකිය යුතු යැයි පවසා ඇත යැයි පහත හදීස්හි සඳහන් වී ඇත.'ස්ත්‍රීන්ට යහපතක්ම පතන්න' (බුකාරී 4890)
- නිවසෙහි ස්ත්‍රීන් සමඟ මෘදුව කටයුතු කළ අවස්ථා බොයෝමයක් හදීස්හි සඳහන් වී ඇත.වරක් නබි තුමානන් ඔහුගේ ඔටුවා අබියස සිටියේය. එවිට ඔහුගේ බිරිය සෆියා (රලි) තුමිය ඔටුවා මත වාඩි කිරීම පිණිස ඔහු ඔහුගේ දනහිස නමා උදව් කළේය. එවිට ඇය ඇගේ පාදය නබි තුමානන්ගේ දනහිස මත තබා ඔටුවා මත නැග්ගාය. (බුකාරී 2120).
- ඔහුගේ දැරිය ෆාතිමා (රලි) තුමිය ඔහු වෙත පැමිණෙන විට ඔහු ඇයගේ දෑත් සිපගෙන ඔහු ඉඳගන්නා ස්ථානායෙහි ඇයව තබන්නේය.(අබූ දාවූද් 5217).

"
දුර්වලයින්ට සෙනෙහස දක්වා ඔවුන්ගේ අයිතීන් ඔවුන්ට දීම මගින් සිය අවශ්‍යතා පරිපූර්ණ වන බව හා එය සතුරන් පරාජය කිරීමට හේතු වන බවද නබි (සල්) තුමානන් පවසා ඇත.

## දුර්වලයින් කෙරෙහි ඔහු දැක්වූ කරුණාව:

- අනාතයින් බාරගැනීම පිළිබඳවද නබි (සල්) තුමානන් අධිකව පොළඹවා ඇත

'අනාතයින්ව බාරගන්නන් හා මා ස්වර්ගයේ මෙසේ සිටිමු යැයි පවසා ඔහුගේ ඇඟිලි දෙක එක්කර පෙන්නුවේය' යැයි නබි (සල්) තුමානන් පවසා ඇත. (අල් බුකාරී 4998)

- දුගීදුප්පතුන්ට හා වැන්දඹු ස්ත්‍රීන්ට උදව් කරන්නන්ව අල්ලාහ්ගේ මාර්ග යෙහි වෙහෙසෙන්නන්ට නබි තුමානන් සම කර එක් හදීසයක පවසා ඇත. (ශුද්ධ බුකාරී 5661)
- දුර්වලයින්ට සෙනෙහස දක්වා ඔවුන්ගේ අයිතීන් ඔවුන්ට දීම මගින් සිය අවශ්‍යතා පරිපූර්ණ වන බව හා එය සතුරන් පරාජය කිරීමට හේතු වන බවද නබි (සල්) තුමානන් පවසා ඇත.



'දුර්වලයින්ට උදව් කරන්න, ඔබට (සතුරන්ට) එරෙහිව උදව් ලැබී ඔබේ අවශ්‍යතාවයන් ඉටු කරනු ලබන්නේ ඔබ අතර සිටින දුර්වලයින් නිසා වේ' (අබූ දාවූද් 2594).

### යුක්තිගරුක බව:

- අල්ලාහ්ගේ දූතයා යුක්ති සහගත පුද්ගලයකුව සිටියේය.සිය ඥාතීන්ට එරෙහි වන අවස්ථාවන් වුවද වැරදි ලෙස කටයුතු කර නැත.මන්දයත් අල්ලාහ් මුස්ලිම් වරුන්ට මෙසේ අණ කර ඇත.

'විශ්වාසවන්තයිනි! එය ඔබට හෝ ඔබගේ මව්පියන්ට හෝ සමීප ඥාතීන්ට හෝ හානිකර වුවද, යුක්තිය ස්ථාපිත කරමින් අල්ලාහ් වෙනුවෙන්ම ඔබ සාක්ෂි කියන්නන් වන්න' (අන් නිසා 135).

- කුරයිෂ් ගෝත්‍රයට අයත් එක් ප්‍රභූවරුන්ගේ පවුලකට අයත් ස්ත්‍රියක් සොරකම් කර එයට දඬුවම් නියම වී තිබියදී ඇතැම් සහාබිවරුන් ඇය වෙනුවෙන් කන්නලව් කිරීමට පැමිණි විට නබි (සල්) තුමානන් මෙසේ පැවසුවේය 'මාගේ ප්‍රානය කවුරුන් අතෙහි තිබෙන්නේද ඔහු මත දිව්රා මා පවසමි,මුහම්ද්ගේ දැරිය ෆාතිමා සොරකම් කළ තිබුනද ඇයට වුවද මා දඬුවම නියම කරමි' (බුකාරි 4053)
- පොලිය තහනම් වූ විට එය තහනම් කිරීම ආරම්භ කළේ සිය බාප්පා වන අබ්බාස් (රලි) තුාමගෙන්ය.'මා අහෝසි කළ ප්‍රථම පොලිය අබ්බාස් බින් අබ්දුල් මුත්තලිබ්ගේ පොලියයි.ඔහුගේ සෑම පොලියක්ම අහෝසි වි හමාරයි' යැයි නබි තුමානන් පැවසුවේය.(මුස්ලිම් 1218)
- එක් සමූහයක ශිෂ්ඨාචාරයේ මහගු බව මිනීමට නබි (සල්) තුමානන් භාවිතා කළ මිනුම්දන්ඩ වූයේ ඔවුන් අතර සිටින දුර්වලයින් සිය අයිතීන් කෙතරම් ධෛර්යෙන් ලබා ගන්නේද යන්නෙහිය.

'දුර්වලයින් කිසිම පැකිලීමකින් තොරව සිය අයිතිය ලබා නොගන්නේ නම් එම ජනසමුහයාව මා ගව්රවය කරන්නේ නැත' යැයි නබි මුහම්ද් (සල්) තුමානන් පවසා ඇත. (ඉබ්නු මාජා 2426).

### ඔහුගේ උදාරත්වය හා උපහාරය :

- වරක් එක් පුද්ගලයකු නබි (සල්) තුමානන් වෙත පැමිණ ඔහුගෙන් යම් මුදලක් ඇසුවේය.එවිට නබි (සල්) තුමානන් 'ඔබ ප්‍රිය කරන ඔනෑ දෙයක් මිලදී ගන්න.එම නය මා සතු වේ' යැයි පැවසුවේය.එම නය දීමට නබි තුමානන් සතුව කිසිවක් නැති බව දැනගත් උමර් (රලි)' අල්ලාහ් ගේ දූතයානනී, ඔබට නොහැකි දෙයක් අල්ලාහ් ඔබට පවරා නැත' යැයි පැවසුවේය.මෙසේ ඔහු පැවසීම නබි තුමානන් ප්‍රිය කළේ නැත.මෙය ඇසූ එම පුද්ගලයාද'අර්ෂය හිමි ඔහුගෙ න් මසුරුකමක් ඇති වේ යැයි බිය නොවන්න' යැයි පැවසුවේය.එවිට ඔහුගේ මුහුනෙහි සතුට දුටු නබි (සල්) තුමානන් සිනාසුනේය.(අහාදීසුල් මුක්තාරහ් 88)

> තම ජීවිතයෙහි නබි (සල්) කිසිම මුදල් හෝ වස්තුවක් හෙට දින සඳහා ඉතිරි කර නැත යැයි ග්‍රන්ථයන්හි සඳහන් වි ඇත.



- වරක් නබි (සල්) තුමානන්ට රිදී කාසි අට දහසක් ලැබුනි.ඒ සියල්ල එක් පැදුරක තබා අසා එන සෑම කෙනෙකුටම බෙදා දී (කිසිවක් තමා වෙනුවෙන් නොතබා) ඉවර කළේය.(හාකිම් 5423)

## ඔහුගේ ඉවසීම:

- තාඉෆ් යනු මක්කාවෙන් මදක් ඈතින් ඇති එක් නගරයකි.එහි වැසියන්ව සත්‍යය කරා කැඳවීමේ අදහසින් නබි (සල්) තුමානන් එම නගරයට ගියේය.එහිදී නබි (සල්) තුමානන් සමඟ ඔවුන් ඉතා අසීලාචාරව හැසිරී නබි තුමානන්ට අධිකව හිංසා කළෝය.පසුව ශෝකයෙන් නබි (සල්) තුමානන් මක්කාවට පැමිණෙමින් සිටින විට ශුද්ධවූ අල්ලාහු තආලා ඔහු වෙත එක් මලක් වරයෙකුව යැව්වේය.ඔහු නබි තුමාගෙන් තාඉෆ් නගරය විනාශ කර දමන්නද යැයි ඇසූ විට 'එපා, ඔවුන්ගේ පරම්පරාවෙන් හෝ අල්ලාහ්ට කිසිවක් සම නොකර විශ්වාස කරන්නන් බිහි විය හැකි' යැයි නබි (සල්) තුමානන් පැවසුවේය.(බුකාරී 3059)

- නබි (සල්) තුමානන් මක්කා වැසියන් සමඟ කටයුතු කළ ආකාරය මෙයටත් වඩා ඉමහත් වේ ඔවුන් නබි (සල්) තුමානන්ව ක්‍රියාවෙන් හා මුවින් අප්‍රමාණව හිංසා කර එතුමානන්ව ඔහුගේ මව් බිමෙන් පලවා හැරියෝය.නබි තුමානන් මක්කාවේ සිටී එක් කාල සීමාවකදී, ඔහුව හා ඔහුගේ සහාබාවරුන්ව සියළු ආකාරයේ සබඳතා විසන්දි කර ඔවුන්ව කොන් කර තැබුවෝය.නබි (සල්) තුමානන් මදීනාවේ සිටින විට මක්කාවේ ජය අල්ලාහ් ඔහුට ලබා දී එතුමානන්ව ගව්රවය කළේය. නබි (සල්) තුමානන් සිය සහාබාවරුන් සමඟ මක්කාවට ගොස් තමන්ට අසීමිත ලෙස හිංසා කළ එම මක්කා වැසියන්ව බලා 'මා නුඹලාට කුමක් කරන්නෙමි දැයි නුඹලා සිතන්නේ?' යැයි ඇසුවේය.එවිට ඔවුන් 'ඔබ යහපතක්ම කරනු ඇත.මන්දයත් ඔබ ගව්රවාන්විතයාය. ඔබ ගව්රවාන්විතයාගේ පුත්‍රයාය' යැයි පැවසුවෝය.එවිට නබි (සල්) තුමානන් 'මාගේ සොහොයුරා යූසුෆ් තමන්ට හිරිහැර කළ සිය සොහොයුරන්ට කුමක් පැවසුවේද එයයි මා නුඹලාට පවසන්නි.අද දින නුඹලා මත කිසිඳු දඬුවමක් නැත.අල්ලාහ් නුඹලාට සමාව දෙත්වා. කරුනාවන්තයන්ගෙන් ඔහු ශ්‍රේෂ්ට කරුනා වන්තයාය යැයි යූසුෆ් පැවසුවේය.එබැවින් ඔබ සියල්ල හැරී යන්න.ඔබ සියල්ලන්ම නිදහස්' යැයි පිලිතුරු දුන්නේය. (බයිහකී 18275)

## ලොවෙහි දෑ කෙරෙහි කිසි ආශාවක් නොදැක්වීම:

- නබි (සල්) තුමානන් සෑම අවස්ථාවකම පහත අල්ලාහ්ගේ වැකිය පිළිපදින්නෙකුව සිටියේය :

(ඕ මුහම්මද්!) ඔවුන්ගෙන් ඇතැම් අයට ලොවෙහි ජීවිතයේ අලංකාරයක් ලෙසින් කුමක් මගින් සතුට ලැබෙන්නට අප සලස්වා ඇත්තෙමුද ඒ දෙසට ඔබගේ දෑස කිසිසේත් හරවනු එපා.ඒ ඔවුන්ව පරීක්ෂා කරනු පිණිස (දුන් දෙවල්)ය.(නමුත්) ඔබගේ රබ් දී ඇති දෙය (මෙයට වඩා) අති විශිෂ්ටය සදකාලිකය. (තාහා 131).

- වරක් උමර් (රලි) තුමානන් නබි (සල්) තුමානන්ව මුනගැසීමට ගිය විට නබි (සල්) තුමානන් කිසි ඇතිරිල්ලක් නොමැතිව පැදුරෙහි හාංසි වී සිටියේය.එම පැදුරෙහි සළකුණු පවා නබි (සල්) තුමානන්ගේ ශරීරයේ පතිත වී තිබුනි.පසුව උමර් (රලි) තුමානන් 'නබි තුමානනී,ඔබ අල්ලාහ්ගෙන් ඔබගේ ජනයින්ට අභිවෘධිය කරන මෙන් ප්‍රාර්ථනා කරන්න.අල්ලාහ්ව නොනමදින්නන් වන රෝමානුවන්ට හා ප්‍රංශයින්ට ඔහු කෙතරම් වස්තූන් ලබා දී තිබේද' යැයි පැවසුවේය. 'කත්තාබ්ගේ පුත්‍රයානනි, ඔබ යම් කිසි සැකයකින්ද සිටින්නේ? ඔවුන්ට ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවිතය ලොවෙහිම දෙනු ලැබී ඇත' යැයි පැවසුවේය.(බුකාරී 2336).

- තමන් හා ලව්කික ජීවිතය අතර ඇති සම්බන්ධතාවය නබි (සල්) තුමානන් මෙසේ පැහැදිලි කළේය:'මාහට මෙලොව හා සම්බන්ධ කුමක් විය හැකිද? එක් මගියෙකු මහන්සියට පත් වූ විට ගසක් යට සෙවනැල්ලේ විවේකයක් ගැන (එහිදීම නතර නොවී) එය අතහර යනු ඇත මෙන් මමද මෙලොවට එසේය.(අත් තිර්මිදී 2377)

- නබි (සල්) තුමානන්ගේ නිවසෙහි ලිප පත්තු නොකර මාස එකක්, දෙකක් හා තුනක් පවා ගත වී ඇත.එම සමයෙහි ඔහු ආහාරයට ගත්තේ රටඉඳි හා ජලය පමණී.(බුකාරී 2428).

- තවත් ඇතැම් දිනයන්හි සියකුස පුරා ගැනීමට වේලුනු රටඉඳි කැබැල්ලක් පවා නොමැතිව කුසගින්නෙන්ම දවස ගත කර ඇති අවස්ථාද ඇත.(මුස්ලිම් 2977).

- නබි (සල්) තුමානන් අඛන්ඩව දින තුනක් පොතු ඉවත් කරනු ලද පිටියෙන් සාදන ලද රොටි ආහාරයට ගැන කුසගින්න නිවා නැත.මන්දයත් ඔහු ආහාරයට ගත් රොටිය සාදනු ලද්දේ බොහෝ විට පොතු සහිත පිටියෙන්ය.(මුස්ලිම් 2976).

> විවේක ගැනීමට ගස යට සෙව නැල්ලේ වාඩි වෙන්නෙකුට නබි (සල්) තුමානන් තමන්ව උපමා කර ඇත.



## පොරොන්දු ඉටු කිරීම :

- නබි (සල්) තුමානන්ට තිබුනු තවත් ශ්‍රේෂ්ට ගුනාංගයක් නම් එය පොරොන්දුව ඉටු කිරීමයි.

පොරොන්දු ඉටු කිරීමේදී නබි (සල්) තුමානන් පොරොන්දු වූ දෙයට වඩා ශ්‍රේෂ්ටව කිරීමට උත්සහ කර ඇත.

- කිතුනුවන්ගේ නායක හිරක්ල් කුරයිෂ් වරුන්ගෙන් නබි (සල්) තුමානන්ව ප්‍රතික්ශේප කළවුන්ගෙන් නබි (සල්) තුමානන් ගැන ප්‍රශ්න කිහිපයක් ඇසුවේය.එයින් එක් ප්‍රශ්නයක් නම්, ඔහු රවටන්නේද යනුවෙනි.එවිට ඔවුන් නැත යැයි පිළිතුරු දුන් විට 'එසේය,( අල්ලාහ් ගේ) දූතයින් රවටන්නේ නැත' යැයි පැවසුවේය.(බුකාරී 7)

- ඔහුගේ බිරිඳ කතීජා (රලි) තුමියගේ පොරොන්දුව ඔහු ආරක්ෂ කළ ආකාරය මෙයට කදිම නිදසුනකි.ඔහු ඇයගේ ස්ථානය සැම විට ආරක්ෂා කරමින් ඇයගේ උදව්ව අමතක නොවී ඇයගේ මිත්‍රවරියන් හා ඥාතීන්ව ගව්රවය කරන්නෙක්ව සටියේය.

- ඇය හා සමඟ නබි (සල්) තුමානන් කළ පොරොන්දුව ඔහු කෙසේ ආරක්ෂා කළා යන්න ආයිෂා (රලි) තුමිය මෙසේ පැහැදිලි කළාය :

නබි (සල්) තුමානන් අධිකව ඇයගෙන කතා කරනු ඇති ඇතැම් අවස්ථාවන්හි ඇයගේ මතකයෙන් එළුවෙකු කපා ඇයගේ මිත්‍රවරියන්ට බෙදා දෙනු ඇත. මෙසේ ඇය ගැනම නබි (සල්) තුමානන් කතාකරන බැවින් මා ඔහුට 'කතීජා හැර ලොවෙහි අන් ස්ත්‍රීන් නොමැත්තේද' යනුවෙන් අසමි එවිට නබි (සල්) තුමානන් 'ඇයමයි සිටියේ, ඇයමයි සිටියේ' යැයි පවසමින් නැවතත් ඇයව මෙනෙහි කරන්නේය.(බුකාරී 3607)



- නජ්ජාෂි යනු ඇබීසීනියවේ රජු ඉස්ලාමයේ ආරම්භ වකවානුවේ මොහු මුස්ලිම් වරුන්ට ආරක්ෂාව දුන්නේය.පසුව යම් කලක ඔහුගේ නියෝජිතයින් පිරිසක් නබි (සල්) තුමානන් මුනගැසීමට පැමැණි විට නබි (සල්) තුමානන් ඔවුන්ට සේවය කර සංග්‍රහය කළේය.එවිට සහාබාවරුන් 'නබි තුමානනී, අප ඔබ වෙනුවෙන් ඔවුන්ව බලාගන්නම්' යැයි පැවසුවෝය.එයට නබි (සල්) තුමානන් 'ඔවුන් මාගේ මිත්‍රයින්ව ගව්රවය කර ඇති එබැවින් මා ඔවුන්ට ප්‍රතිඋපකාර කරන්නෙමි' යැයි පැවසුවේය. (ෂුඅබුල් ඊමාන් 8704).

අල්ලාහ්ගේ අන ලෙස හා ශ්‍රේෂ්ට නබි වරුන් සියල්ලන්වම පිළිපැදීමක් ලෙස අලංකාර ගතිගුණයේ අති ශ්‍රේෂ්ට උදාහරනයන් රැසක් නබි (සල්) තුමානන්ගේ ජීවිතය තුලින් අපට දැකගත හැකිය.

නබි මුහම්මද් (සල්) තුමානන් මදීනාවේ තැනූ මස්ජිදය ශුද්ධ මස්ජිදුන් නබවී නම් වේ. මක්කාවේ ඇති ශුද්ධ මස්ජිදයට පසුව දෙවෙනුව ඇති ශුද්ධ මස්ජිදය මෙයයි. මදීනාවට සංක්‍රමණය කිරීමෙන් පසු නබි (සල්) තුමානන් මෙය තැනුවේය. නබි (සල්) තුමානන් භූමිධානය කරනු ලැබී ඇත්තේද මෙහිය. සෑම වසරකම මිලියන ගනන් මුස්ලිම් වරුන් මොහුගේ මස්ජිද බැහැදැකීම පිණිස පැමිණෙන්නෝය.





# නබි මුහම්මද් (සල්) තුමානන්ගේ ඇතැම් වදන්



නබි (සල්) තුමානන්ගේ වදන් හා පුවත් ප්‍රචාරය කිරීමට,ඒවා හැදෑරීමට හා ග්‍රන්ථාරූඪ කිරීමට මුස්ලිම් ජනතාව අධික ඇල්මක් දක්වා ඇත.ඔහුගේ වදන්හි එක් අක්ශරයක් හෝ විකාත්ති විය නොයුතු බැවින් ඒවා ආරක්ෂා කිරීමට හා එහි අර්ථයන් ආරක්ෂා කිරීමට ඉස්ලාමීය විද්වතුන් ඉමහත්ව වෙහෙසට පත් ඉතා තීක්ෂණ ක්‍රමවේදයන් පත්කර ඇත. එපමණක් නොව,කල්ගෙවී යෑමත් සමඟම නබි වදන් වලට අයත් නොවන්නා ගොතන ලද පුවත්ද තහවුරු නොවූ පුවත්ද මෙයට එකතු කරනු ලැබුනි. එබැවින් එයින් සත්‍යයෙන්ම නබි වදන් කුමක්ද, එයින් සනාථ වී ඇත්තේ කුමක්ද යනාදී දෑ වෙනවෙනවම දැන ගැනීම පිණිස එයට ඉමහත් ක්‍රියාවලියන් සෑම කාලයකදීම ඉස්ලාමීය විද්වතුන් විසින් ඇති කරනු ලැබුනි.

නබි

නබි (සල්) තුමානන් ඇතැම් වදන් පහත සඳහන් වේ.

- 'සෑම ක්‍රියාවක්ම චේතනාවන් අනුවමයි.සෑම මිනිසෙකුටම තමන් චේතනා කළ දෑය' (බුකාරි 1)
- 'යහපත යනු යහක්‍රියාවයි.ඔබගේ මනසෙහි පැකිලීමක් ඇති කරන්නා හා ඔබ කරන කුමන දෙයක් අන් මිනිසුන් දැකීම ඔබ පිළිකුල් කරන්නේද එයයි පාපාය' (මුස්ලිම් 2553).
- 'ලොවෙහි වස්තූන්ගෙන් තුරන් වී සිටින්න, එවිට අල්ලාහ් ඔබව ප්‍රිය කරනු ඇත. මිනිසුන් සතුව ඇති දැයින් ඔබ තුරන් වී සිටින්න, එවිට ඔවුන්ද ඔබව ප්‍රිය කරනු ඇත' (ඉබ්නු මාජහ් 4102).
- මා හා අන් දූතයින්ගේ උපමාව නම්, නිවසක් තැනූ පුද්ගලයකු මෙන්ය. ඔහු නිවස ඉතා අලංකාරයට තනා එක් කෝනයක පමණක් ගඩොල් ගලක ප්‍රමාණයක් හිස්ව තැබුවේය. මිනිසුන් මෙම ගොඩනැගිල්ල දැක බැලීමට වටවෙමින් පැමිණෙන විට මෙය දැක මවිතයට පත් වූ නමුත් හිස්ව තිබූ එම ස්ථානය දැක ' මෙම අවසාන ගඩොල් ගලත් තැබිය යුතු නොවේද' යැයි පැවසුවෝය.එම ගඩෝල මමයි.නබි වරුන්ගේ මුධාව මමයි.(බුකාරි 3342)
- 'කවුරුන්ගේ දිවෙන් හා අතින් අන් මුස්ලිම් වරුන් අනතුරු නැති වන්නේද ඔහුය නියම මුස්ලිම් වරයාය.අල්ලාහ් තහනම් කළදැයින් ඈත් වන්නාය සත්‍ය සංක්‍රම කරන්නාය. (බුකාරි 10).
- 'ඔබ කොතැන් සිටියද අල්ලාහ් ට බිය වන්න.පවක් වූ විට එය මකා දැමිය හැකි පිනක් ඉන් පසුව කරන්නී.මිනිසුන් සමඟ අලංකාර ගතිගුනෙන් ආශ්‍රය කරන්න' (අත් තිර්මිදී 1987)
- 'කවුරුන් මුස්ලිම් නොවන්නෙකුට අසාධාරනය කරන්නේද, නැතිනම් ඔහුගේ හැකියාවට ඉහලින් ඔහුට වැඩ පවරන්නේද, නැතිනම් ඔහුගේ කැමැත්ත නොමැතිව ඔහුගෙන් යමක් ගන්නේද ඔහුට එරෙහිව කියාමත් දිනයේ මා තර්ක කරනනේමි' (අබූ දාවූද් 3052).



'අපගේ බාලයින්ට කරුනාව නොදක්වා වැඩිහිටියන්ට ගව්රවය නොකරන්නා අප සතු කෙනෙකු නැත. (අත් තිර්මිදී 1920)



"

'විශ්වාස කරන තුරු ඔබලා ස්වර්ගයට පිවිසිය නොහැකිය.ඔබ එකිනෙකා අතර සෙනෙහසින් කටයුතු කරන තුරු ඔබට නිසි ලෙස විශ්වාස සළ නොහැකිය. කුමක් කළ විට ඔබලාට සෙනෙහසින් කටයුතු කළ හැකිවේද යන්න මා ඔබලාට දන්වන්නද? ඔබලා අතර සලාම් පැවසීම පතුරවන්න' මුස්ලිම් 54)

- 'දයාව දක්වන්නන්ට පරම දයාබරයා දයාව දක්වන්නේය.එබැවින් පොළවෙහි සිටින්නන්ට ඔබ දයාව දක්වන්න, අහසෙහි සිටින්නා ඔබට දයාව දක්වනු ඇත' යැයි මුහම්මද් (සල්) තුමානන් පවසා ඇත.(අබූ දාවූද් 4941)
- 'කවුරුන් යම් මුඃමින් වරයකුගේ දුකක් ලිහිල් කරන්නේද කියාමත් දිනායෙහි අල්ලාහ් ඔහුගේ එක් දුකක් ලිහිල් කර දෙන්නේය.කව්රුන් අපහසුතාවයේ සිටින්නාගේ අපහසුතාවය පහසු කරන්නේද අල්ලාහ් ඔහුට ලොවෙහි හා ආකිරා දෙකෙහිම (ඔහුගේ අපහසු තාවයන්) පහසු කර දෙන්නේය. යමෙකුගේ අඩුපාඩුවක් කවුරුන් වසන්නේද අල්ලාහ් ඔහුගේ අඩුපාඩු ලොවේ හා අකිරා දෙකෙහිම වසනු ඇත.යම් ගැත්තෙකු සිය සොහොයුරාගේ උදව්වෙහි සිටින කාලය පුරා අල්ලාහ් ඔහුගේ උදව්වෙහි සිටී.දැනුම හැදෑරීම පිණිස කවුරුන් යම් මගක ගමන් කරන්නේද ඔහු ස්වර්ගයට යෑමේ මග අල්ලාහ් ඔහුට පහසු කරන්නේය.කවරුන්ගේ (යහ) ක්‍රියාවන් ප්‍රමාධ වන්නේද ඔහුගේ කුලය ඔහුව සිග්‍ර කරන්නේ නැත. (මුස්ලිම් 2699)
- 'කවුරුන් රවටන්නේද ඔහු අපගෙන් සතු කෙනෙකු නොවේ. (අත් තිර්මිදී 1315)
- 'මුඃමින්වරුන් තමන් එකිනෙකා අතර ආදරයෙන් හා සෙනෙහසින් කටයුතු කිරීමෙහි උදාහරනය නම් එක් ශරීරයක් මෙන්ය.ශරීරයේ එක් අවයවයක් වේදනාවෙන් පෙලෙන විට ශරීරයේ අනෙක් සෑම අවයවයක්ම ඇහැරී උන හැදී වේදනාව දරති.(මුස්ලිම් 2586)
- 'ඔබ සියල්ලන්ම භාරකරුවන්ය.ඔබගේ භාරකාරත්වය ගැන ඔබ සියල්ල අසනු ලබයි.නායකයා භාරකරුවෙකි.(ඔහුගේ එම භාරකාරත්වය ගැන) ඔහු අසනු ලබයි. සැමියා සිය පවුලේ භාරකරුවෙකි.(ඔහුගේ එම භාරකාරත්වය ගැන) ඔහු අසනු ලබයි.බිරිඳ සිය සැමියාගේ නිවසට භාරකාරියෙකි.(ඇයගේ එම භාරකාරත්වය ගැන) ඇය අසනු ලබයි.දැනගන්න, 'ඔබ සියල්ලන්ම භාරකරුවන්ය.ඔබගේ භාරකාරත්වය ගැන ඔබ සියල්ල අසනු ලබයි.(බුකාරී 4892).

- 'ඔබලාගේ ශ්‍රේෂ්ටයා තමන්ගේ බිරිඳට ශ්‍රේෂටයාය. මා මාගේ බිරියට ශ්‍රේෂ්ටයි.(අත් තිර්මිදී 3895)
- 'දිනක් එක් මිනිසෙකු පිපාසයෙන් පැලී සිටිය විට එක් ළිඳක් අසල ගියේය.එවිට එහිදී දැඩි පිපාසය හේතුවෙන් තරපෙමින් පස් කයින් සිටී බල්ලෙකු ඔහු දුටුවේය.එවිට එම මිනිසා 'මාහට ඇති වී ඇති ආකාරයේ පිපාසයක් මෙම බල්ලාටද ඇති වී ඇත' යැයි පැවසා ළිඳට ගොස් මොහුගේ පාවහනට වතුර පුරවා එම බල්ලාට ජලය පෙව්වේය.අල්ලාහ් මොහුගේ ක්‍රියාව අගය කර ඔහුගේ සෑම පාපායක්ම සමා කළේය'එවිට සාහාබාවරුන් 'අපගේ සතුන් සිව්පාවුන් විශයෙහි පවා අපට කුසල් තිබේද?' යැයි විමසූ විට 'තෙත්සහිත අක්මාව ඇති සෑම දෙයකම කුසල් ඇත' යැයි නබි (සල්) තුමානන් පිළිතුරු දුන්නේය.
- 'වංචනිකයින්ගේ සළකුනු තුනකි.ඔහු කතා කරන විට බොරු පවසන්නේය. ඔහු පොරොන්දු වූ විට කඩ කරන්නේය.ඔහුව විශ්වාස වූ විට රවටන්නේය' (බුකාරී 33)
- 'යම් පුද්ගලයකුගේ ඉස්ලාමයේ ඇති අලංකාරවලින් එකක් නම් එහුට අවශ්‍ය නැති දෑ අත්හැරීමයි.(අත් තිර්මිදී 2317)
- 'සෑම කරුනකම මෘදු බව අල්ලාහ් ප්‍රිය කරන්නේය' (බුකාරී 5678)
- 'කවුරුන් මෘදු බවින් සහතික කරනු ලබන්නේද ඔහුට සෑම යහපතක්ම තහනම් කරනු ලබයි.(මුස්ලිම් 2592)

## නබි මුහම්ද් (සල්) තුමානන්ව ශුද්ධ කුර්ආනය කෙසේ වර්ණනා කර ඇත්තේද?

නබි (සල්) තුමානන්ගේ ශ්‍රේෂට ගුණාංග යන් ශුද්ධ කුර්ආනය පැහැදිලි කර ඇත. පහත සඳහන් ශුද්ධ කුර්ආන් වැකිය ඒවා පැහැදිලි කරයි :

- මුස්ලිම් වරුන්ට පමණක් නොව, මුළු විශ්වයටම නබි (සල්) තුමානන් ආශිර්වාදයක් වේ.

(ඕ මුහම්මද්!) ඔබව ලෝවැසියාට ආශීර්වාදයක් ලෙසින් මිස අප නොඑවුවෙමු. (සූරා අන්බියා)

- ඔහු ඉමහත් ගුණාංග ඇත්තාය.

තවද නිශ්චය වශයෙන්ම ඔබ ඉතා උසස් යහගුණ ඇත්තෙකි. (සූරා කලම් 4)

- නබි (සල්) තුමානන් සෑම මිනිසුන්ගේම යහගම හා දැඩි ආශාවෙන් සිටී යමෙක් අයහමගෙහි ගිය විට ඔහු අධිකව දුකට පත් වනු ඇත.ඔහුගේ කටයුත්ත හා වගකීම ප්‍රචාරය කිරීම පමණක් හා හයමග දීම අල්ලාහ් ගේ වගකීම යැයි සිතා සැනසිල්ලට පත් වන්නේ නැත.

එහෙයින් (ඕ මුහම්මද්!) ඔහු මත භාණ්ඩාගාරයක් පහළ කළ යුතු නොවේද? නැතිනම් ඔහු සමග එක් මලාඉකාවරයෙකු පැමිණිය යුතු නොවේද? යැයි ඔවුන් පැවසීම නිසා ඔබට වහී මගින් පහළ කරන දෙයින් අතැමක් ඔබ අත් හැරිය හැකිය.ඔබගේ සිත එමගින් පීඩිත විය හැකිය.ඔබ අනතුරු අඟවන්නෙකු පමණි.තවද අල්ලාහ් සෑම දෙයක් මතම භාරකරුවාය (සූරා හූද් 12).

තවද අල්ලාහ් සිතුවහොත් ඔවුන් හවුල් නොකරන්නෝය (තවද) ඔබව ඔවුන් මත රැකවලෙකුවද අප (පත්) නොකළෙමු. තවද ඔබ ඔවුන්ගේ භාරකරුවෙකුද නොවේ (සූරා අන්ආම් 107)

(ඕ මුහම්මද්!) 'මමද ඔබ මෙන්ම මනුෂ්‍යයෙකු පමණි.ඔබගේ විශ්වාධිපතියා එකම විශ්වාධිපතියාය යැයි මා හට වහී පහළ වේ එහෙයින් කවුරුන් තම රබ්ව හමු වීමට ආශා කරන්නේද ඔහු යහ ක්‍රියා කර තම රබ්ගේ නැමදුමට කිසිකෙනෙකුව සමාන නොකරත්වා 'යැයි ඔබ පවසන්න (සූරා කහ්ෆ් 110).

- සෑම විටම අන් අයට සමාව දීමට කාරණා සොයා ඔවුන්ගේ වැරදි සමා කිරීමට තැත් කරයි. (ඕ මුහම්මද්!) අල්ලාහ් ඔබට සමාව දෙත්වා (යුද්ධයට නොපැමිණි) ඔවුන් අතුරින් සත්‍යය කියනවුන් (කවුදැයි) ඔබට පැහැදිලි වී මුසාවාදීන්ව ඔබ දැන ගන්නා තුරු ඔවුන්ට ඔබ අනුමැතිය දුන්නේ ඇයිද? (සූරා අත් තව්බාහ් 43)
- ඔහුගේ සතුරන්ට පවා අල්ලාහ්ගෙන් සමාව අයදින්නෙකු ලෙස නබි (සල්) තුමානන් සිටියේය. පසුව අල්ලාහ් එය තහනම් කළේය.

(ඕ මුහම්මද්!) ඔබ ඔවුන් වෙනුවෙන් සමාව අයදිනු නැතිනම් අයැද නොසිටිනු (එහි වෙනසක් නැත) ඔබ ඔවුන් වෙනුවෙන් සැත්තෑවරක් සමාව අයැදුවද නිශ්චය වශයෙන්ම අල්ලාහ් ඔවුන්ව සමා නොකරන්නේමය. ඒ අල්ලාහ් ව හා ඔහුගේ දූතයාව ඔවුන් ස්ථිරවම ප්‍රතික්ෂේප කළහ හෙයිනි. (මෙවන්) පාපතර සමූහයාව අල්ලාහ් ඍජු මාර්ගයෙහි යවන්නේ නැත (අත් තව්බාහ් 80).

- විශ්වාසිකයින් යම් අපහසුතාවයට පත්වන විට එහි නබි (සල්) තුමානන්ද අපහසුතාවයට පත්වේ. (විශ්වාසිකයනි) ස්ථිර වශයෙන් ඔබ(ගේ යහපත) කෙරෙහි ඉමහත් තන්හාව ඇත්තාවූද ඔබ හිරිහැර විඳීම ඔහුට ඉමහත් කණස්සලක් ගෙන දෙන්නාවූද විශ්වාසිකයින් සමග ඉමහත් කරුණාවද දයාවද ඇත්තාවූද එක් දූතයෙක් ඔබ අතරින්ම (ඔබ වෙත) පැමිණ සිටින්නේය. (සූරා අත් තව්බහ් 128)
- ඇතැම් අවස්ථාවන්හි මිනිසුන් ඔහුගේ නිවසේ දීර්ඝ වේලාවක් රැඳී සිටීම නිසා මොහුට එය අපහසු තාවයක් විය. එනමුත් ලැජ්ජාව නිසා නබි (සල්) තුමානන්ට මෙය පවසාගත නොහැකි විය.

විශ්වාස කළවුනි! ආහාර සඳහා ඔබට අනුමැතිය දෙනු ලැබුවොත් මිස එය පිළියෙල කරනු ලැබීම අපෙක්ෂා නොකරන්නන් ලෙසින් (වුවද) වක්තෘවරයාගේ නිවසට නොපිවිසෙන්න. එසේ වුවද ඔබට ඇරියුම් කරනු ලැබුවහොත් එවිට පිවිසෙන්න. පසුව ඔබ ආහාර ගෙන අවසන් වුවහොත් සල්ලාපයෙහි කැමැත්ත දක්වන්න (එහි රැඳී නොසිට) විසිරී යන්න. මෙය (එනම් එහි රැඳී සිටීම) වක්තෘවරයාට හිරිහැර ගෙන දෙන්නක් විය. එහෙයින් ඔහු ඔබට (මෙය කීමට) ලැජ්ජා වෙන්නේය. නමුත් අල්ලාහ් සත්‍යය කීමට ලැජ්ජා නොවන්නේය. තවද (වක්තෘවරයාගේ බිරියන් වන) ඔවුන්ගෙන් යමක් ඉල්ලා සිටින විට ඔබ තිරයකට ඔබ්බෙන් සිටීම ඔවුන්ගෙන් එය අසන්න. මෙය ඔබගේ හදවතවලට හා ඔවුන්ගේ හදවත්වලට ඉතා පවිත්‍ර වන්නේය. තවද අල්ලාහ් ගේ දූතයාට හිරිහැර කිරීම ඔබට නුසුදුසුය. ඔහුගේ බිරියන් ඔහුගෙන් පසු ඔබ විවාහ කර ගැනීමද කිසි විටෙක නොකළ යුතුය. නිශ්චය වශයෙන්ම අල්ලාහ් වෙත එය දැවැන්ත (පාපයක්)ව තිබෙන්නේය (සූරා අහ්සාබ් 53).

- නබි (සල්) තුමානන් මෘදු හිත් ඇත්තෙකුව සිටී නිසා සහාබාවරුන් සමග ඉතා සුහදව කටයුතු කළේය. ඉතා කඩිනම් අවස්ථාවෙහි පවා සිය සහාබාවරුන්ගේ මතයන් අසන්නෙකුව සිටියේය.

(ඕ මුහම්මද්!) අල්ලාහ් ගේ ආශීර්වාදය නිසාම ඔබ ඔවුන් සමග මෘදුව ඇසුරු කරන්නේය. තවද වචනයෙන් දරුණු අයෙකු ලෙසින් හෝ අනුකම්පාවෙන් තොර හදවත් ඇත්තෙකු ලෙසින් ඔබ සිටී තිබුනහොත් ඔවුන් ඔබගෙන් වෙන් වී ගොස් තිබෙනු ඇත. එහෙයින් ඔවුන්ට සමා වී ඔවුන් වෙනුවෙන් ( අල්ලාහ් ගෙන්ද) සමාව අයදිනු. තවද (ඇතැම්) කටයුතුවලදී ඔවුන් සමග සාකච්ඡා කරනු. යම් කටයුත්තක් ඔබ තීරණය කළහොත් (පසුව) අල්ලාහ් වෙතම (එය පවරා ඔහු මත පූර්ණ) විශ්වාසය තබනු. නිශ්චය වශයෙන්ම අල්ලාහ් (තමන් වෙත පූර්ණ) විශ්වාස තබන්නන්ව ප්‍රිය කරන්නේය. (සූරා ආලු ඉම්රාන් 159)



# ශුද්ධ කුර්ආනය ඉස්ලාමයේ නිරන්තර ආශ්චර්යයයි



ලොවෙහි අධිකව බෙදා හරින ලද හා අධිකව විකුණනු ලබන උසස් ග්‍රන්ථය වන ශුද්ධ කුර්ආනය යනු කුමක්ද?

## ශුද්ධ කුර්ආනය මුස්ලිම් වරුන් පහත සඳහන් වී ඇති අනුව විශ්වාස කරන ශුද්ධ ග්‍රන්ථයයි.

- මිනිසාගේ යහමගක්ව හා ආලෝකයක් ලෙස අල්ලාහ් විසින් සිය දූතයා වන නබි මුහම්මද් (සල්) තුමානන්ට පහළ වූ ග්‍රන්ථයයි.
- පහළ කරනු ලැබූ අවසාන දිව්‍යමය ග්‍රන්ථයයි.
- ප්‍රකෘත්ති හා විකෘතියන්ගෙන් ආරක්ෂා කරනු ලැබූ ග්‍රන්ථයයි.
- එහි අන්තර්ගත රීතීන් පිලිපැදීම තුලින් කුසල් ඇතිවෙනවා මෙන්ම එය පාරායනය කිරීම හා මනනය කිරීමෙහිද කුසල ඇති වනු ඇත.


නබි (සල්) තුමානන්ගේ වයස අවුරුදු 40ක් පරිපූර්ණ වූ පසු ජිබ්රිල් නම් මලක් වරයා විසින් ශුද්ධ කුර්ආනය පහළ වීම ආරම්භ විය.ශුද්ධ කුර්ආනායහි පහළ වූ ප්‍රථම වැකිය ‘ඔබගේ රබ්ගේ නාමයෙන් පාරායනය කරන්න’ යන්නයි.

පසුව විවිධ අවස්ථාවන්ට අනුව වසර 23ක කාලයක එය වෙන්වෙන්ව පහළ විය.

> ශුද්ධ කුර්ආනායහි පහළ වූ ප්‍රථම වැකිය ‘ඔබගේ රබ්ගේ නාමයෙන් පාරායනය කරන්න’ යන්නයි
> පසුව විවිධ අවස්ථාවන්ට අනුව වසර 23ක කාලයක එය වෙනවෙන්ව පහළ වියි

ශුද්ධ කුර්ආනය පරිච්ඡේද 114ට බෙදී ඇත එවාහි ශයිලයන් එකින් එක වෙනස් වේ. එක් අලංකාරය හා ආරාබි ව්‍යක්තභාවය එක හා සමානව උසස්ම ආකාරයේ තිබේ. ඒ සියළු වැකියන් තුලින් අරමුණු වි ඇත්තේ මිනිසාගේ යහමග හා අල්ලාහ් ව පමණක් නැමදිය යුතු යන්නයි.

## ශුද්ධ කුර්ආනය කථා කරන ප්‍රධාන පැතිකඩ.



1- අල්ලාහ් ගේ ඒකදේවවාධය තහවුරු කර ඔහුට සමානයන් ඇති කරන්නන් විසින් ඇති කරනු ලැබූ සැකයන් දුරු කිරීම.

2- පෙර සමූහකයින්ගේ හා දූතයින්ගේ වෘත්න්ත.

3- අප අවට ඇති මැවීම, විශ්වයේ පැවැත්ම හා අල්ලාහ් විසින් අපට ලැබී ඇති විවිධ දායාදයන් දෙස බලා සත්‍යය වටහා ගත යුතු යැයි අල්ලාහ් ගේ ඇරයුම.

4- අල්ලාහ් ගේ විධාන හා අනෙක් ඉස්ලාමීය රීතීන් පැහැදිලි කිරීම්.

5- සත්‍ය මුඃමින් වරයා සතුව තිබිය යුතු ගුණාංගයන් පැහැදිලි කිරීම හා අප්‍රසන්න ගතිගුනෙන් ඈත් වී සිටිය යුතු යන අවවාධය.

6- අවසාන දිනය පිළිබඳ විස්තර හා එහි යහපත් හා අයහපත් උදවීන්ට ලැබෙන කුලිය පිළිබඳ වූ විස්තර.

7- නබි (සල්) තුමානන්ට හා සහාබාවරුන්ට ඇති වුනු සිදුවීම් තුලින් මුඃමින් වරුන්ගේ විශ්වාසය වර්ධනය කිරීම්.

ශුද්ධ කුර්ආනයේ විශේෂත්වයෙන් සමහරක් ඉහත සඳහන් වී ඇත.



## ශුද්ධ කුර්ආනය ආරක්ෂා කිරීමේ ආශ්චර්යය.

ශුද්ධ කුර්ආනය මිනිසාගේ සිත්හි ආරක්ෂා කරනු ලබයි යනුවෙන් හා එය ලේඛනයන්හිද ආරක්ෂා කරනු ලබයි යැයි ශුද්ධ කුරාන්හි සඳහන් වී ඇත.මේ දෙආකාරයටම ශුද්ධ කුර්ආනය අදවන තුරු ආරකෂා වී ඇත.ශුද්ධ කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරිමෙමේදී, සෑම වැකියක්ම කෙතරම් ලේඛන ගත වූ සාක්ෂි තිබුනද, එය නබි (සල්) තුමානන්ගෙන් අසා මනනය කළවුන්ගේ සාකෂි දෙකකින් තහවුරු වන තෙක් ඒවා සටහන් කරනු නොලබති. එසේම යම් වැකියක් කෙතරම් මනනය කළවුන්ගේ සාක්ෂි තිබුනද, එය නබි (සල්) තුමානන්ගෙන් අසා ලියාගනු ලැබූ සාක්ෂි දෙකකින් තහවුරු වන තෙක් එය සටහන් කරනු නොලබේ.ශුද්ධ කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ කමිටුවේ සාමාජිකයින් සියල්ලන්ම 'හාෆිල්' හෙවත් ශුද්ධ කුර්ආනය මුළුමනින්ම මනනය කළවුන්ව තිබියදීත් එහි තහවුරුභාවය අධික කිරීම පිණිස මොවුන් මෙසේ සාක්ෂා තිබිය යුතු යැයි කොන්දේසි තැබුවෝය.


එනමුත් ඉන්ජීල් ග්‍රන්ථයේ ඇති විකෘත්තියන් පිළිබඳ පැවසීමේදී, ඔවුන්ගේ විද්වතුන් පවසන්නේ එසේ මාරු වීම් සිදු වීම සාධාරන දෙයක් යැයිය.සටහන් කරන්නන් අධිකව සිටී නිසා හා කල් ගත වීමේදී එසේ විකෘති සිදු වීම පළිගත හැකි කරුනක් යැයි ඔවුන් පවසති.

එසේම ශුද්ධ කුරාආනයට එවැනි කිසිඳු වෙනසක් හෝ ඇති නොවී සියවස් 14 කම සමානව තිබෙන්නේ කෙසේද? මන්දයත් මෙහි සෑම අකුරක්ම අල්ලාහ් ආරක්ෂා කරන බව අල්ලාහ් ම එහි වගකීම භාරගැන ඇති යන්න එයි සත්‍යයි.අල්ලාහ් වහී මගින් නබි (සල්) තුමානන්ට කුමක් පහළ කළේද, එය මුස්ලිම් වරුන් ඒ ආකාරයටම කිසි අඩු හෝ වැඩි කිරීමක් නොමැතිව සටහන් කර මනනය කළෝය.මුස්ලිම්වරුන්ට තමන් අතර ඇතැම් මත භේදයන් තිබුනද, ශුද්ධ කුර්ආන්හි එක් වචනයක් පිළිබඳව හෝ ඔවුන් අතර කිසිඳු මත භේදයන් නැත.

එබැවින් ශුද්ධ කුර්ආනය පරම්පරා බොහෝමයක් පසුව අප වෙත පැමිණ ඇත. ඉහල ඝනයේ ආකාරයට ශුද්ධ කුර්ආන්හි වචන හා අර්ථයන් ආරක්ෂා කරනු ලැබී ඇත.චීනයේ එක් කොනක හෝ අප්‍රිකාවේ යම් රටක ශුද්ධ කුර්ආනය සියවස් 14කට පෙර ලියනු ලැබූ ශුද්ධ කුර්ආනය සමඟ සසඳ බැලුවොත් ඒ අතර කිසිම වෙනසක් නොතිබේ.එය ඔබ ඉන්දුනේසියාවේ කුඩා දරුවෙකුගෙන් සවන් දුන්නද නැතිනම් මුස්ලිම් විද්වතෙකු ගෙන් ඇසුවද ඒ සියල්ල එක හා සමාවනව තිබෙනු ඇත.ශුද්ධ කුර්ආනය අසත්‍යයක යැයි ශබ්ද නගන ඕනෑම කෙනෙක් ශුද්ධ කුර්ආනය අසත්‍ය කිරීමේ අබියොගය එදත් අදත් කවදත් විවෘත්තයි.ශුද්ධ කුර්ආනය ආරක්ෂා කිරීම පිළිබඳ අල්ලාහ් මෙසේ පවසා ඇත :

මෙය අල්ලාහ් නොවන්නෙකු වෙතින් (පැමිණියේ), නම් එහි අනේක පටහැනිතා ඔවුන් දකිනු ඇත.(සූරා අන් නිසා 82)

නිශ්චය වශයෙන්ම අපම දික්රය (නම් කුර්ආනය) පහළ කළෙමු. තවද අපම එය ආරක්ෂා කරන්නන්ද වෙමු.(සූරා හිජ්ර්:9)



## ශුද්ධ කුර්ආනයේ ඇති අධ්‍යාත්මික ආශ්චර්යයන්:

ශුද්ධ කුර්ආනය හිස් හදින් කියවන්නා එය තමන්ට සෘජුවම කථාකරන බව එය කියවන්නාට හැඟේ.ඔහුගේ සිතුවිල්ල ශුද්ධ කුර්ආනය පෙරම දැනගෙන තිබේ දැයි ඔහුට හැඟේ.

විවිධාකාර සංස්කෘතියට අයත් හා විවිධ චින්තනයට අයත් උදවීන් ශුද්ධ කුර්ආනය පාරායනය කරති.ඔවුන් සියල්ලන්ගේම සිතෙහි ඇති ආරවුල් ශුද්ධ කුර්ආනය නිරවුල් කර ඔවුන්ගේ සිත්හි ඇති ප්‍රශ්නය දැන එයට පිළිතුරුද සැපයීම යනු පුදුම සහගත කරුණකි.

මෙසේ මිනිසාගේ මනස කියවා එහි ඇති රහස්, එහි ඇති දුර්වලතා දැන ගැන ප්‍රථම වාථාවෙහිම සත්‍යය පිළිගැනීමට බාධා වන කරුණු පැහැදිලි කර දීමේ ශයිලයක් ශුද්ධ කුර්ආනහි අඩංගු වී ඇත.

යමෙකු ශුද්ධ කුර්ආනය කියවීමේදී ශුද්ධ කුර්ආන්හි ඇති පෙර ජනසමූහයිගේ වෘතාන්ත කියවා ඔවුන්ගේ චින්තනයන් හා බුද්ධිය කෙසේ තිබුනේ දැයි පැහැදිලි වී පසුව ඔවුන්ගෙන් කවුරුන් අයහමග ගියේ යන්න හා කවුරුන් ජය ලැබුවේ යන්න වටහා ගනී. පසුව ඒ අතර තමන් කොතැන සිටින්නේද යන්න ඔහු සිතයි. මෙසේ ඔහු කියවමින් සිටින විට ටික ටික ඔහුට නොදැනුවම ඔහුට අල්ලාහ් ගේ වදන්හි සත්‍යතාබාවය මනසට වැටහෙනු ඇත.එබැවින් අවසානයෙහි ශුද්ධ කුර්ආනය මිනිසාට තමන් තුල ඇති අඩුපාඩුන් පෙන්වා දෙන කන්නාඩියක් බවට පත් වනු ඇත.එමගින් ඔහු තමන්ව සෙමින් සෙමින් අල්ලාහ් වෙත සමීප කර අවසානයෙහි අල්ලාහ් හැර අන් දෙවියෙකු නැත යැයි ඔහු සාකෂි දරයි.

ඔහු බලා පොරොත්තු සුන් වී ජීවිතයෙහි කකිරුනු තත්වයක සිටින්නේ නම්, ඔහු පහත ශුද්ධ කුර්ආන් වැකිය පාරායනය කරන විට එය තමන්ටම කතා කරන බව ඔහුට වැටේහේ.

(ඕ මුහම්මද්!) 'මාගේ ගැත්තනි! (ඔබ අතුරින්) කවුරුන් හෝ සීමාව ඉක්මවා තමන්ටම හානි ඇති කර ගත්තද අල්ලාහ් ගේ දයාවෙහි විශ්වාසය සුන් කර නොගන්නි.නිශ්චය වශයෙන්ම අල්ලාහ් සියළු පාපයන් සමා කරන්නේයි.නිශ්චය වශයෙන්ම ඔහු සමාවන්නාය පරම දයාබරයාය යැයි පවසන්න.(සූරා:අස් සුමර් 53).

ඔහු ආදරය හා සෙනෙහස නැති වි සිටින්නෙකු නම් ඔහුගේ සැනසීමට මෙම ශුද්ධ කුර්ආන් වැකිය සෘහෙනු ඇත.

(ඕ මුහම්මද්!) මාගේ ගැත්තන් ඔබ වෙතින් මා පිළිබඳ ඇසුවහොත් නිශ්චය වශයෙන්ම (මා ඔවුන්ට ඉතා) සමීපව සිටින්නෙකි (යැයි ඔවුන්ට පවසන්නී) එක් අමතන්නෙකු මා ඇමතූ විට ඔහුගේ ඇමතුමට මා පිළිතුරු දෙමි.එබැවින් ඔවුන් මා විශ්වාස කර මට පිළිතුරු දෙනු මැනවි. (එවිට) ඔවුන් යහමගට පත් විය හැකිය.(සූරා: බකරාහ් 186).

සිය ජීවිතයේ අපහසු තාවයන් බොහෝමයකට මුහුන දී පීඩාවට පත් වූවන්ට පහත දීර්ඝ අලංකාර වැකිය අප්‍රමාණ නිදහසක් මනසට ගෙන දේ.

අල්ලාහ් කිසිවෙකුට ඔහුගේ ශක්තිය ඇතුලත මිස අසීරුතාවයන් දෙන්නේ නැත.ඔහු ඉපැයූ කුසල ඔහුටම ප්‍රයෝජනවත් වේ.එසේම ඔහු ඉපැයූ අකුසල ඔහුටම (විනාශය ගෙන දෙන්නේ)ය.ඕ අපගේ රබ්! අප (ඔබගේ යම් අණක්) අමතක කළද, එහි අප වැරැද්දක් ඇති කළද, ඔබ අපව ග්‍රහණය නොකරනු මැන.ඕ අපගේ රබ්! අපට පෙර විසූවන් මත පැටවූවා සේ බර අප මත නොපටවනු මැන.ඕ අපගේ රබ්! කුමක් ඉසිලීමට අපට ජවය නැත්තේද එ(වැනි දෙ)ය අප මත නොපටවනු මැන.(අපගේ පාපයන්) අප කෙරෙන් මකා දමනු මැන.අප ක්ෂමා වනුද මැන.අපට ආශීර්වාද කරනු මැන.ඔබමය අපගේ රැකවලා. එහෙයින් ප්‍රතික්ෂේප කරන්නන් (අභිබවා) ඔවුන් මත (ජය ලැබීමට) අපට උපකාරද කරනු මැනව' යයි කීහ.(සූරා:බකරහ් 286).

මධ්‍යස්ත මතදාරීන්ට ශුද්ධ කුරආනය කෙතරම් දුරට බලපා ඇතිද යන්න පිළිබඳව 'දුරාන්ත් විල්' ඔහුගේ ග්‍රන්ථයේ පවසා ඇත:

> විල් ඩුරාන්ට් පවසයි:
>
> 'අතීතයෙහි මෙන්ම අප ජීවත් වන මෙම වර්ගමානයේ පවා විවිධ ආකාරයේ අප්‍රමාණ මිනිසුන් ශුද්ධ කුර්ආනය විශ්වාස කර ඇත. මෙයට කාරනාව වූයේ මෙහි ඇති ප්‍රතිපත්තීන් සයළු දෙනා විසින් පිළිගත හැකි වීම නිසාය. එය ඉතා සැහැල්ලු මෙන්ම එකිනෙක ගැටීමෙන් දුරස් වූවකි'

අතීතයෙහි මෙන්ම අප ජීවත් වන මෙම වර්තමානයේ පවා විවිධ ආකාරයේ අප්‍රමාණ මිනිසුන් ශුද්ධ කුර්ආනය විශ්වාස කර ඇත.මෙයට කාරනාව වූයේ මෙහි ඇති ප්‍රතිපත්තීන් සයළු දෙනා විසින් පිළිගත හැකි වීම නිසාය. එය ඉතා සැහැල්ලු මෙන්ම එකිනෙක ගැටීමෙන් දුරස් වූවකි.විකෘතියන්ගෙන් නිදහස් වූවක් හා පිළිම වන්දනාවෙන් ආරක්ෂා වූවකි.ජීවිතයෙහි අපහසු තාවයන් දරාගනිමින් කිසි පසුබෑමක් හෝ පැමිණිල්ලක් තොරව දයර්‍යයෙන් මුහුන දිය යුතු යැයි ඉස්ලාමය උගන්වා ඇති ධර්මය පැහැදිලිව හඳුනා දී එහි සීමාවන්ද පෙනවා දී ඇත.කිසිම යුදෙව්වෙකුට හෝ කිතුනුවෙකුට පහත ශුද්ධ කුර්ආන් වැකිය ප්‍රතික්ෂේප කිරීමට කිසිම බාධකයක් නොලබයි..

'නැගෙනහිර හා බටහිර දෙසට මුහුණ හැරවීම (පමණක්) කුසල් කිරීමක් වනු නොමැත.එනමුත් කුසල් කරන්නා කවරෙක්ද යත් කවුරුන් අල්ලාහ්වද, අවසාන දිනයද , මලාඉකාවරුන්ද, පුස්තකයන්ද, දූතයන්ද විශ්වාස කර ඥාතීන්ටද , අනාථයින්ටද, දුගීන්ටද හා මගීන්ටද යාචකයන්ට හා (වහළුන්) නිදහස් කිරීමට (තම) වස්තුව කෙරෙහි කැමැත්ත තිබෙන විටම එය වැය කර සලාතය ඉටු කර සකාතය දෙන්නේද ඔවුන්ද, ගිවිසුමක් ඇති කළේ නම් එය පරිපූර්ණ කරන්නන් හා දුගී බවෙහිද රෝගී බවෙහිද දුෂ්කර තත්ත්වයෙහිද ඉවසිලිව සිටින්නන්ය.සත්‍යවන්තයින් මොවුන්මයි.බියබැතියන්ද මොවුන්මයි' (සූරා: බකරහ් 177).



# ශුද්ධ කුර්ආනය පැමිණියේ කොතනින්ද?



# මුස්ලිම්

මුස්ලිම් වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වන ශුද්ධ කුර්ආන් පුස්ථකය හා ඔවුන්ගේ දුතයා වන මුහම්මද් නබි (සල්) තුමානන් පිළිබඳව මුස්ලිම් ජනයින් පවසන දේ විශ්වාස කළ හැක්කේ  කෙසේද යන ප්‍රශ්නය බොහෝ දෙනෙකුට ඇති විය හැකිය.

ශුද්ධ කුර්ආනය ලොවට කියා දෙනු ලැබුවේ අකුරු නොදත් අරාබි පුද්ගලයකු විසින් යන්නෙහි.ඉතිහාසඥයින් අතර කිසිඳු මත භේදයක් නැති භය වන සියවසේ මක්කා නගරයේ උපත ලැබූ නමින් මුහම්මද් බින් අබ්දුල්ලාහ් වේ.මෙම ඉතිහාසට ඇති ප්‍රසිද්ධ සාක්ෂිය අන් කිසිම සාක්ෂියකට සම කළ නොහැකිය.මෙය ඔහු විසින් ලියනු ලැබූ ග්‍රන්ථයක් නොව, අල්ලාහ් විසින් මොහුට දෙනු ලැබූ ශුද්ධ වදන් මොහුගේ වගකීම වූයේ මෙය මිනිසුන්ට කිසිඳු අඩු හෝ වැඩි කිරීමක් නොමැතිව දන්වා සිටීම පමණක් යන්න මෙම ග්‍රන්ථයෙහිම පැහැදිලිව සඳහන් වී ඇත.

ඉස්ලාමයේ දූතයා විසින්ම ගොතනු ලැබූවක්ව හෝ ශුද්ධ මිනිසුන්ගෙන් මොහු මෙය හදාරා පසුව මොහුගේ නමින් මෙය ප්‍රචාරය කළා විය නොහැකිද?

> එසේ මුහම්මද් රැවටීමක් කිරීමට පතන්නේ නම් ඔහු පවසන සෑම වදනක්ම ශුද්ධ වූ අල්ලාගේ වදන් යැයි නොපවසා කුර්ආනයේ වදන් පමණක් ශුද්ධ වූ අල්ලාහ්ගේ යැයි ඔහු නොපැවසුවේ මන්ද?

ශුද්ධ කුර්ආනය සෘජුවම මදක් හෝ නොහදාරා, එහි අර්ථ කිසිවක් නොදැන නබි මුහම්මද් (සල්) තුමානන්ගේ ජීවිත චරිතය නොදත් සෑම කෙනෙකුටම ඇති වන ප්‍රශ්න මේවාය.

අපට දන්නා දෙයක් නම් යම් කිසි කෙනෙකු අනෙක් පුද්ගලයන්ගේ වචන, අර්ථයන් හා කථා සොරකම් කර තමන්ගේ නමින් ඒවා සකසන විට එය තමන් විසින් ලියන ලද යැයි පවසති. එමෙන්ම නබි (සල්) තුමානන්ද මෙය තවත් කෙනෙකුගෙන් සොරකම් කළ වචනයක් නම් මේවා ඔහුගේ වචන යැයි නොපවසා අල්ලාහ් ගේ වචන යැයි පවසන්නේ මන්ද?.

එසේ මුහම්මද් රැවටීමක් කිරීමට පතන්නේ නම්, ඔහු පවසන සෑම වදනක්ම ශුද්ධ අල්ලාගේ වදන් යැයි නොපවසා කුර්ආනයේ වදන් පමණක් ශුද්ධ අල්ලාහ්ගේ යැයි ඔහු නොපැවසුවේ මන්ද?

මෙය ඔහුම ගොතා පසුව අල්ලාහ් ගේ වචන යැයි පවසනවා යැයි සිතන්නේ නම්, මෙහි තමන්ගේ ගෞරවය, ආඩම්බරය, හා තමන්ගේ වර්ණනාවන් රාශියක් තබිය යුතු නොවේද? මෙයට පටහැනිව ඔබට ශුද්ධ කුර්ආන්හි අධිකව දක්නට ඇත්තේ නබි තුමානන් තරවටු කරනු ලැබීම, මොහුට සිදු වූ වැරදි ඉස්ම කර දීම හා මොහුට අවවාධ කරනු ලැබීම වැනි දෑය.

ශුද්ධ කුර්ආනය පාරායනය කරන්නන්ට පැහැදිලි වන කරුනක් නම් එය මුහම්මද් (සල්) තුමානන්ගේ පවුල් ජීවිතයේ විශයන් පවා ඔහුව තරවටු කර ඔහුට එහිදී උපදෙස් දී ඇත යන්නයි. එපමණක් නොව, ඇතැම් අවස්ථාවන්හි ඔහුගේ නායකත්වයේ සිදු වුනු වැරදි පවා නිවැරදි කිරීම මෙන්ම ඔහුගේ ඇරයුමෙහි සිදු වූ ඇතැම් ක්‍රමයන් පවා නිවැරදි කරනු ලැබී ඇත.

වරක් නබි මුහම්මද් (සල්) තුමානන් කුරයිශ් වරුන්ගේ ඇතැම් ප්‍රධානීන්ට ඉස්ලාමයට ඇරයුම් කරමින් සිටිය විට එක් අන්ධ සහාබිවරයෙක් නබි (සල්) තුමානන්ව හමු වීමට පැමිණියේය.නබි (සල්) තුමානන් තුමානන් කුමක් කරමින් සිටිනවා යන්න මොහු දැන සිටියේ නැත. 'නබි තුමනි, අල්ලාහ් ඔබට උගන්වා ඇති දැයින් මාහට උගන්වන්න' යැයි කිහිප වරක් පවසමින් තදින් පැවසුවේය. එවිට නබි (සල්) තුමානන්ගේ මුහුන කොපයෙන් පිරී රත් විය.මොහුට මදක් ඉවසා සිටිය නොහැකිද යැයි සිතා පසුව කොපයෙන් මොහුට කිසි පිළිතුරක් නොදී නබි (සල්) තුමානන් ගියේය.මෙම සිද්ධිය ශුද්ධ කුර්ආනයේ නොමැකෙන තිහාසයේ සඳහන් කළේය.මෙහි සිදු වූ සෑම අවස්ථාවක්ම ශුද්ධ කුර්ආන් පැහැදිලි

කර නබි (සල්) තුමානන්ගේ වැරද්ද පෙන්වා දී ඔහුට තරවටු කර මෙවැන්නක් මන් ඉදිරියෙහි සිදු විය නොයුතු බැවින් එහිදී වහී පහළ විය. මෙම සිදුවීම එක් පරිපූර්ණ පරිච්ඡේදයක අඩක් පමණ මෙම සිදුවීම පිළිබඳව කථා කරයි.මෙම වැකය පහළ වීමෙන් පසු එම අන්ධ සහාබි වරයා පැමිණෙන සෑම මොහතකදීම නබි (සල්) තුමානන් 'කවුරුන් නිසා මාගේ දෙවියා මාව තරවටු කළේද ඔහුව මා සාදරයෙන් පිළිගනිමි' යැයි පවසා සිය ඇතිරිල්ල ඔහු වෙනුවෙන් හෙලයි.

එම සිදුවීමෙහි ශුද්ධ කුරආන් වැකිය :

1. ඔහු මුහුණ ඇඹුල් කර ගත්තේය. (තවද එය) හරවා ගත්තේය. 2. ඔහුවෙත එම අන්ධ තැනැත්තා පැමිණි විට (ඔහු එසේ කළේය) 3. (ඕ මුහම්මද් ඔබ වෙත පැමිණි එම) තැනැත්තා සුපවිත්‍ර වනු ඇත යැයි ඔබ දන්නේද? 4. නැතහොත් ඔහු (ඔබගේ දෙසුම) සිහි කර ගැනීම මගින් (එම) දෙසුම ඔහුට ප්‍රයෝජනවත් වන්නට තිබුනි. 5. (එසේ තිබෙන විට දෙසුමෙහි) අවශ්‍යතාවය කවුරුන් නොසලකන්නේද 6. ඔහු වෙත ඔබ යොමු වී සිටින්නෙහිය. 7. තවද ඔහු (ඉස්ලාමය පිළිනොගෙන) සුපවිත්‍ර නොවුවහොත් එය (පිළිබඳ වගකීම) ඔබ මත නොවේ 8. එනමුත් කවුරුන් ඔබ කරා (ඕනෑකමින්) යහුසුලුව පැමිණියේද 9. (තවද කවුරුන්) අල්ලාහ් ට බිය වන්නෙකුව (පැමිණියේද) 10. ඔහු විෂයයෙහි ඔබ අනවධානයෙන් සිටින්නෙහිය. 11. එසේ නොවේ. මන්ද යත් මෙ(ම කුර්ආන)ය උපදෙසකි. (සූරා:අබස 1-11).

මෙවැනි දෑ රුසක් ශුද්ධ කුර්ආනහි සඳහන් වී ඇති අයුරු බලන විට, අප කාටත් පැමණෙන සැකය නම් කිසිවිටෙක මකා දැමිය නොහැකි ආකාරයට යමෙකු තමන්ගේ වැරදි තමන්ම ප්‍රචාරය කරයිද යනුවෙන්ය.

තමන්ව අසත්‍ය කිරීම පිණිස ඇතැම් ප්‍රශ්න ඉදිරිපත් කර එයට පිළිතුරු දෙන මෙන් නබි (සල්) තුමානන් අසනු ලැබූ සමහර අවස්ථාවන්හි සිය පවුල නිර්දෝශී යැයි ඔප්පු කළ යුතු අවස්ථාවන්හි නබි (සල්) තුමානන්ට වහී ප්‍රමාධ වූ අවස්ථාවන්ද තිබේ.

මෙයට උදාහරණයක්:

නබි (සල්) තුමානන්ට හිරිහැර කරමින් සිටි කුරයිශ් වරුන් නබි (සල්) තුමානන්ව අසත්‍ය කිරීම පිණිස ග්‍රන්ථයේ අයවලුන්ගෙන් උදව් පැතුවෝය.

එවිට පුස්ථකයේ අයවලුන් අරාබිකරයේ සිටින්නන්ට නොදන්නා හා දෙවියාට පමණක් දන්නා කරුනු තුනක් නබි (සල්) තුමානන්ගෙන් අසන්න යැයි කුරියිශ් වරුන්ට පැවසුවේය.පසුව 'ඔහු මෙවාට පිළිතුරු දුන්නේ නම් ඔහු දූතයෙකි. ඔහු පිළිතුරු නොදුන්නේ නම් මොහු නබි වරයෙකු නොවේ' යැයි ඹුවුන්ට පැවසුවෝය.ඒ අනුව කුරයිෂ් වරුන් නබි (සල්) තුමානන් ගෙන් එම ප්‍රශ්න තුන ඇසූ විට නබි (සල්) තුමානන් අල්ලාහ් තමන්ගේ සතුරන් ඉදිරියෙහි තමන්ව අවමන් නොකරනු ඇත යන විශ්වාසයෙන් 'මා හෙට ඔබට දන්වන්නම්' යැයි පැවසුවේය.



මුහම්මද් (සල්) තුමානන්ට දින කිහිපයක් වහී පැමිණීම නතර විය. පසුව ඔහුගේ සතුරන් ඔවු අසලින් යන සෑම අවස්ථාවකදීම පිළිතුරු නොදුන් බැවින් නබි තුමානන්ව විහිලු කරන්නට විය.මෙය දරාගත නොහැකි වූ නබි (සල්) තුමානන් දැඩි ලෙස ශෝකයට පත් විය.එහෙත් දින පහලවකින් පසුව නබි (සල්) තුමානන්ට එම ප්‍රශ්නයන්හි පිළිතුරු හා වහී ප්‍රමාධ වීමේ හේතුව පහළ විය.එනම් කිසිම කරුණක් 'මා කරමි' යැයි අල්ලාහ්ගේ නාමයා හා ඔහුගේ පැතීම නොසඳහන් කර පැවසිය නොයුතු යැයි අල්ලාහ් ඔහුට ඉගාන්වුවේය.එනම් යමක් පැවසීමේදී 'ඉන් ෂා අල්ලාහ් ' අල්ලාහ් පැතුවොත් යැයි පැවසිය යුතුයි.වහී ප්‍රමාධ විමට හේතුව නබි (සල්) තුමානන් ඉන්ෂා අල්ලාහ් නොපවසා 'මා හෙට දන්වමි' යැයි කීමයි.සූරා කහ්ෆ් පරිච්චේදයේ වැකියක අල්ලාහ් මෙය පැහැදිලි කර ඇත.

(ඕ මුහම්මද්) කිසිදු දෙයකට 'නිශ්චිත වශයෙන්ම මා එය හෙට කරන්නෙමි' යැයි ඔබ කිසිසේත්ම නොපවසන්න. 24.(අල්ලාහ් සිතුවේ නම් හැර යන අරුත ඇති) 'ඉන්ෂා අල්ලාහ් ' යැයි හැර (අනෙකක් නොපවසන්න) තවද ඔබට (එය) අමතක වූයේ නම් (සිහිපත් වූ විගසම) ඔබගේ රබ්ව මෙනෙහි කරන්න.තවද 'යහ මගින් මෙයටත් වඩා සමීප දෙයට මා හට මග පෙන්වන්නට මාගේ රබ් මට ප්‍රමාණවත්ය.යැයි ඔබ පවසන්න. (සූරා: කහ්ෆ් 23-24).

## කුර්ආනයට විටින් විට ඇති වන චෝදනා :

නබි (සල්) තුමානන්ගේ ජීවිතය දෙස බැලූ විට ඔහු සත්‍ය වන්තයෙක් යැයි පැහැදිලි වනු ඇත යන්න විස්මිත සත්‍යයකි.

අකුරු නොදත් නබි (සල්) තුමානන් ජීවත් වුයේද අකුරු නොදත් පිරිසක් අතරේය.ඔහු ඔවුන් කරන යහ ක්‍රියා හා ඔවුන්ගේ අනෙකුත් සභාවන්හි ඔවුන් සමඟ සහභාගි වේ ඔහුද සාමාන්‍ය මිනිසුන් මෙන් ඔහුගේ හා තමාගේ

> සෑම දූතයින්ගේ සතුරන්ම සිය දූතයා අසත්‍ය කිරීමට කළ චෝදනා පරාජයට පත් වූ විට ඔවුන් අවසානයේදී පැවසූ චෝදනාව ඔවුන් භූතියම් කරුවන් හෝ උන්මත්තකයින් යනුවෙනි.

පවුල වග බලා ගැනීමේ කාර්‍යයෙහි නියැලී සිටීයි.ඔහු එඬේරුවෙකුව හා කුලී ව්‍යාපාරිකයකුව සිටියේය.ඔහුට කිසිම විද්වතුන් සමඟ කිසි සම්භන්දයක් නොතිබුනි.මෙසේ වසර හතලියක් ගත වී ගියේය.පසුව එක් දිනකදී ආරාබි වරුන් කිසිවෙකුට නොදන්නා දෑ මොහු දැන්වීමට ආරම්භ කළේය.ඔවුන්ගේ මුතුන් මිත්තන්ගෙන් මොවුන් නොදැන සිටි දෑ, පවරන්නන්ගේ වෘතාන්ත, මැවීම් හි ආරම්භය, පෙර දූතයින්ගේ වෘතාන්ත හා මුළු ජීවිතයම සම්බන්ධ අනෙක් සෑම රීතීන් විස්තර කිරීමට ඔහු ආරම්භ කළේය.

නබි (සල්) තුමානන්ගේ සතුරන්ට මෙම සත්‍යය ප්‍රථම වාථාවෙහිම වැටහෙනු. නමුත් එය පිළිගැනීමට ඔවුන්ගේ ගර්වය අවසර දුන්නේ නැත.ඉන් පසුව සම්බන්ධ නැති බොරු චෝදනා රැසක් නබි (සල්) තුමානන්ට පැවරීමට ඔවුන් ආරම්භ කළෝය.

ශුද්ධ කුර්ආනය නිසි ලෙස කියවා එය වටහා ගත්තවුන් කිසිවෙකු ශුද්ධ කුර්ආනය නබි (සල්) තුමානන්ගේ ගෙතීමක් යැයි පැවසීම ඉතා අපහසු කරුණකි.ඔහු මුළුමනින්ම ජීවත් වූයේ අරාබි වරුන් අතර බැවින් ඔහු තවත් කෙනෙකුගෙන් මෙම ශුද්ධ කුර්ආනය ඉගැන නොගත් යන්න ඉතා පැහැදිලි කරුණකි.එහෙයින් ඔවුන්ටම බොරු යැයි පැහැදිලි කරුණකි නමුත් ඔවුන් නබි (සල්) තුමානන්ට චෝදනා කර ඇත.තමන් නිවැරදි යැයි ඔවුන්ට තේරුනු විට වෙනත් චෝදනාවක් පවසන්නට වූහ.එනම් මෙය තවත් කෙනෙකුගෙන් ලබා ගත් දෙයක් නොව,මොහුම මෙය ගොනු කර ඇත යැයි පවසන්නට වූහ.පොදුවේ අරාබි වරුන් කවි කීම හා කිතිකාවන් හි අති

දක්ෂයින්ය.අකුරු නොදත් මුහම්මද් කවි වරුන්ව පවා මවිතට පත් කරන්නා වදන් පවසන්නේ නම් මෙය ඔහු විසින් කළ හැකි දෙයක් නොව යැයි ඔවුන්ට නැවතත් සත්‍යය පැහැදිලි වුනු.නමුත් ගර්වය නිසා ඔවුන්ට එය පිළිගත නොහැකි විය.පසුව මෙම ශුද්ධ කුරානය නබි (සල්) තුමානන් හීනෙන් දැකපු දෙයක් යැයි පැවසුවෝය.මෙයත් අසත්‍ය යැයි ඔවුන්ට වැටහෙන විට මොහු හූනියම් කරුවෙකු, කිවියෙක්, උන්මත්තෙකු යනුවෙන් එකක් පසු තවෙකක් ලෙස චෝදනා රැසක් පවරමින්ම සිටියෝය.

කෙසේ වෙතත් ඔවුන් පැවසූ කාරණා වෙනස්ව තිබුනද එහි අරමුණ වූයේ සත්‍ය යැයි තහවුරු වූ මුහම්මද්ව අසත්‍ය චෝදනා පැවරීමය.මීට පෙර මූසා (අලයි) තුමානන් හූනියම් කරුවෙකු යැයි මිනිසුන් චෝදනා නොකළෝද? ඊසා (අලයි) තුමානන් උනමත්තකයකු යැයි චෝදනා නොකළෝද?

සෑම දූතයින්ගේ සතුරන්ම සිය දූතයා අසත්‍ය කිරීමට කළ චෝදනා පරාජයට පත් වූ විට ඔවුන් අවසානයේදී පැවසූ චෝදනාව ඔවුන් හූනියම් කරුවන් හෝ උන්මත්තකයින් යනුවෙනි.පොදුවේ මිනිසුන් තරකයක් කර ඔවුන්ගේ තර්කය පරාජය වන විට කෝපයට පත් වී මාතෘකාවෙන් ඔබ්බට ගොස් කිසි සම්බනධයක් නැති දෑ පැවසීම පොදු දෙයකි.

## මෙම ශුද්ධ කුර්ආනය අපද සුභදතාවයෙන් බැලිය යුතු නොවේද?

මිනිසාගේ බුද්ධියෙහි අසීරු දෑ පවා සිතෙහි මවා ගැනීමේ හැකියාව අල්ලාහ් පත් කර ඇත. එබැවින් පොදුවේ මිනිසාගේ බුද්ධිය මැවුම් දෙවියෙකු සිටින බව දනී. එසේ නම් එම දෙවියා යුක්ති ගරුක විය යුතයි.ඔහුගේ යුක්ති සහගතබව පරිපූර්ණ කිරීමට මරණින් මතු ජීවතයක් තිබිය යුතුයි.ලොවේ ජීවිතයෙහි සිදු වන බොහෝ අසාධාරණයන්ට සාධාරණයක් ඉටු කිරීමට හා යහක්‍රියාවන්ට නිසි කුලිය දීමට නම් මරනින් මතු තවත් ජීවිතයක් අවශ්‍යයි.



ඊමාන් හෙවත් අල්ලාහ් ව විශ්වාස කිරීමෙහි ක්‍රමය ශුද්ධ කුර්ආනය පැහැදිලි කර ඇති බව එය කියවන්නාට පැහැදිලි වනු ඇත.එසේම, එහු මැවීම් ආරම්බ කළේ කෙසේද, එවා අවසාන වන්නේ කෙසේද, සුවර්ගය හා එහි ඇති දෑ කුමක්ද, නිරය හා එහි බයානකත්වය කෙසේද, එවාහි ඇති දොරටු හා එයට පැවරී ඇති මලාඉකා වරුන්ගේ ගණන වැනි දෑ ශුද්ධ කුර්ආන්හි අල්ලාහ් පැහැදිලි කර ඇත.කුමන කාරණයායක් මත මේ සියල්ල පැහැදිලි කර තිබෙන්නේද?


එක්කෝ මේ සියල්ල මනක්කල්පිත අසත්‍යය විය යුතුයි, නැතිනම් නිසි ලෙස දැනුම මගින් පමණක් තේරිය හැකි සත්‍යයක් විය යුතුයි.

පුස්ථකයන්හි සදහන් වී ඇති බොහෝ කරුණු නවීන විද්‍යායා මගින් තහවැරු වී ඇති සැඟවුනු කරුණු ඇතැමක් නවීන කාලයේ විද්‍යාවට එකඟ වී ඇත.

## සමහර විට එය නැවත සකස් කරන ලද ග්‍රන්ථයක් කිය හැකිද?

ශුද්ධ කුර්ආනය ගොනු කිරීම පිණිස ඔහු අන් නබි වරුන්ගේ පුස්ථකයන් තුලින් උපුටා සකස් කර තිබෙන්නට සුළු ප්‍රමාණයේ හෝ හැකියාවක් තිබිය යැකි යැයි අප මදක් නිරීක්ෂණය කළ යුතුයි.

ඇත්තෙන්ම මුහම්මද් (සල්) තුමානන් මෙන්ම ඔහුගේ ජනසමූහයාද අකුරු නොදත්තවුන්වම සිටියෝය.පෙර නබි වරුන්ගේ පුස්ථකයන් පිළිබඳ ඔවුන්ට කිසි දැනුමක් තිබුනේද නැත.නබි (සල්) තුමානන් පුස්ථකයේ ජනයින්ව හමු වී ඇත්තේ ඔහුගේ බාලවියේදී ඔහුගේ ඇතැම් ඥාතීන් සමඟ ගමනෙහි යෙදී සිටී සමහර අවස්ථාවලදී පමණී.එනමුත් එකල පුස්තකයේ ජනයින් තමන්ගේ තනතුරු



ආරක්ෂා කරගැනීම පිණිස ග්‍රන්ථයේ ඇති දැනුම සඟවමින් සිටී යුගයක් යන්න ඉතිහාසයෙන් තහනුරු වූ කරුණකි.

එබැවින් ශුද්ධ කුර්ආනයට පෙර පුස්ථකයන් තුලින් උපටා ගත් දෙයක් වීමට සුළු ප්‍රමාණයක් හෝ හැකියාවක් නැත.මෙයට තවත් සාදකයක් නම්, පෙර පුස්ථකයන්හි ඇති ඇතැම් වෘතාන්ත ශුද්ධ කුර්ආන්හි තිබුනද එය 100% එයට සමාන වී නැත.මන්දයක් ශුද්ධ කුර්ආනය අල්ලාහ් පහළ කළ කාරනාවන්හි එකක් නම් පෙර පුස්ථකයන්හි එම විද්වතුන් විසින් විකෘති කරන ලද දෑ පැහැදිලි කර එහි සත්‍යය පැහැදිලි කිරීමයි.තවද එහි සඳහන් වී නොමැති කරුණු රාශියක් ශුද්ධ කුර්ආන්හි සඳහන් වී ඇත.එම ග්‍රන්ථයන්හි පරිපූර්ණ නොවූ වෘතාන්තයන්හි අවසානය,පුස්ථකයේ ජනයින් විසින් වසන් කරන ලද කරුණු, ඔවුන් විශ්වාස කරමින් සිටී ඇතැම් වැරදී ප්‍රතිපත්තීන්, ඔවුන් විසින් චෝදනාවට ලක් වූ ඇතැම් නබි වරුන්ගේ නිදොස් බව වැනි කරුණු රැසක් ශුද්ධ කුර්ආනයේ පමණක් සඳහන් වී ඇත.මෙසේ තිබියදී මුහම්මද් (සල්) තුමානන් ඔවුන්ගේ ශිෂ්‍යයෙකු වීමට ඉඩකඩ තිබේද??

## ඉතිහාසික සථ්‍යය:

මද්‍යස්ථව සවේශණය කරන සෑම කෙනෙකුම මෙසේ සිතා බැලිය යුතුය : මුහම්මද් යනු පුද්ගලයා අරාබි වරයෙකු නොවේද?.

ඔහුගේ අරාබි ජනයාට ආඩම්බර පෑමට තිබුනේ ඔවුන්ගේ සාහිත්‍යය හා කතිකත්වය හැර අන් කිසිවක් නොමැති බව හා ඔවුන්ගේ ජීවිතයම ගෙවුනේ රැස්වීම්හි හා උත්සවයන්හි සිය ගෝත්‍රය උසස් කර අන් ගෝත්‍රිකයින්ට පිළිතුරු දෙන්නාවූ කවි ගෙතීමෙන් පමනක් යැයි ඉතිහාසය අපට පවසා නොමැතිද?

ඔවුන්ගෙන් යමෙක් කවියක් කියා එය මග නැවැත්වුහොත් එහි ඉතිරි කොටස ඔහුගේ ශෛලයෙන්ම තවත් කෙනෙකු පරිපූර්ණ කර ඔහුගේ කවියටට පිළිතුරුද දෙති.ඔවුන්ගේ ස්භාවයන්හි තිබුනු තරඟයද මෙයයි.මෙසේ කවි හා කතිකාවන්හි ඔවුන්ව ඉක්ම වීමය කිසිම කෙනෙකු ලොවෙහි බිහි වී නැත.

මෙපමණ ශ්‍රේෂ්ඨ කවියන් ඉදිරියෙහි මුහම්මද් නම් වූ කවියක් මිස අකුරක් කියවීමට හෝ ලිවීමට පවා නොහැකි මොහු විසින් ශුද්ධ කුර්ආනය මෙන් පුස්ථකයක් නැතිනම් එයට සමාන වන එක් කොටසක් හෝ පැවසිය යුතු යන අභියෝගය ඔවුන්ට තබනු ලැබූ විට ඔවුන් සිකිවෙකුට මෙයට පිළිතුරු දිය නොහැකි විය.ඔවුන්ට හැකි වූයේ නිශ්ශබ්ද වීම හෝ අසම්බන්ධ තරග කිරීම පමණී.

මෙම අභියෝගය ඔවුන්ට ඉදිරිපත් කිමේදී තමන් මෙයින් පරාජය වූයේ නම් ඔහුගේ දූතත්වය අසත්‍ය කරනු ලැබී පරාජය වේ යැයි මදක් හෝ බිය වී ඔවුන්ට මෙම අභියෝගය ඉදිරිපත් නොකර සිටියාද?

ඔහුගේ ජනයාගේ නිපුණත්වය දැන සිටී මුහම්මද් (සල්) තුමානන් මෙම අභියෝගය ඔවුන් හමුවේ තැබීමට මදක් හෝ බිය වූයේ නැත.ඔහු තැබූ මෙම අභියෝගය ඔවුන්ට පමණක් සීමාවූවක් නැත.අදටත් ශුද්ධ කුර්ආනය අසත්‍ය කිරීමට ඇති අභියෝගය විවෘතයි.එනම් ශුද්ධ කුරාආනය මෙන් පුස්ථකයක් හෝ එයට සමාන වන එක් පරිච්චේදයක් ගෙන ඒමයි.

තමන් පවසන දෙයෙහි පරිපූර්ණ විශ්වාසයක් ඇත්තෙකු විසින් දෙනු ලැබූ මෙම අභියෝගයට ඉදිරිපත් වීම අවදානම් සහිත යැයි ඔහුගේ ගෝත්‍රික කුරයිෂ් වරුන්ට පැහැදිලි විය.ඔවුන් කිසි කෙනෙකු ශුද්ධ කුර්ආනය මෙන් යමක් හෝ කොටසක් ගොනු කළ යුතු යැයි උත්සහ දැරුවේ නැත.අතීතයේද, වර්තමානයේද හා අනාගතයේදීද නොසැලෙන සථ්‍යය මෙයයි.කවුරුන් මේ සඳහා උත්සහයක් දැරුවේද ඔවුන් පරාජයට පත් වූවා පමණක් නොවේ, ඔහුගේ ගෝත්‍රිකයින් විසින්ම ඔහු අවමං කරනු ලැබී සමාජයේ සෙල්ලමක් හා විහිලුවක්ව ඔහු විය.

## ශුද්ධ ෆාතිහා පරිච්ඡේදය:

ශුද්ධ කුර්ආනයේ ශ්‍රේෂ්ටතම පරිච්ඡේදය හා මුස්ලිම් වරුන් සිය සලාතයේ නැවත නැවත පාරායනය කරන පරිච්ඡේදයයි එහි අර්ථයෙහි සාරාංශය පහත සඳහන් වේ:

### සූරා ෆාතිහාවේ අර්ථය

| | |
|---|---|
| දයාබර පරම දයාබර අල්ලාහ් ගේ නාමයෙන් | අල්ලාහ්ව ගව්රවය කිරීම පිණිස විනය ගරුක ඔහුගේ නාම යෙන් මාගේ පාරායනය ආරම්භ කරමි සෑම කරුණාක්ම ඉක්මවා යන කරුණාව ඇත්තා ඔහුය |
| සියළු ප්‍රශංසා විශ්ව රක්ෂක අල්ලාහ්ටමය | අල්ලාහ් ගේ භාහිර හා අභ්‍යන්තර දායාදයන්, ඔහුගේ ක්‍රියවන් හා ගුණාංගයන් සියල්ල මගින් මා අල්ලාහ්ව ප්‍රශංසා කරමි ඔහු මැවුම් කරුවාය.විශ්වයේ සෑම මැවීමක්ම පාලනය කර ඔවුන්ට ආශිර්වාද කරන්නා ඔහුය. |
| දයාබර පරම දයාබර | කරුණාව යන වචනයට ඇතුලත් විය යුතු සෑම වරගයේ කරුණාවක්ම හිමියා අල්ලාහ්ය.ඔහුගේ කරුණාව මෙම මුළු විශ්වයේම පැතිරී ඇත. එමෙන්ම ඔහුගේ විශේෂ කරුණාව සෑම මුඃමින්වරුන්ටම පැතිරී ඇත. |
| තීන්දු දිනයේ අධිපති | විනිශ්චය දිනයේ පාලකයා සහ රජා ඔහුය. |
| ඔබටම නමදිමු ඔබගෙන්ම උපකාර පතමු | ඕ් අපගේ දෙවියානනි, අප ඔබව පමනක් නමදිමු.කිසිම ආකාරයේ නැමදුමක අප ඔබ හැර අන් කෙනෙකුව ඔබ සමඟ හවුල් නොක-රමු.අපගේ සෑකාර්‍යයන්හිම අප උදව් පතන්නනේ ඔබගෙන්මයි.අනු ප්‍රමානයකට හෝ ඔබ නොවන අන් කෙනෙකුට ශක්තියක් නැත |
| අප සෘජු මඟ ගමන් කරවනු මැන | සෘජු මග අපට පෙන්වා එය පැහැදිලි කර එහි අපව යොමු කර ඔබව අප යමුවන තෙක් එහි අපව ස්ථිර කරනු මැන. |
| ඔබ ආශීර්වාද කළවුන්ගේ මඟෙහි (අප ගමන් කරවනු මැන) | ස්ථිර බවින් හා යහමගින් ඔබ කවුරුන්ට ආශිර්වාද කර ඇත්තේද එවැන් සත්‍යය වටහා ගත් නබි වරුන් හා සැදැහි වන්තියන්ගේ මගයි එයයි. |
| ඔබගේ උදහසට ලක් වූවන්ගේ මඟ හෝ නොමඟ ගියවුන්ගේ (මග) නොව | ඔබ කෝපයට හා අතෘප්තියට පත්වූවන්ගේ මගින් අපව ඈත් කර ආරක්ෂා කරනු මැන.මන්දයත්, ඔවුන් සත්‍යය දනිමින්ම එය පිළිනොගත්හ.තවද සත්‍යය වටහා ගැනීමෙහි මැලිකමක් දක්වා නොමග ගියවුන්ගේ මගින්ද අපව ආරක්ෂා කරනු මැන |
| ආමීන් | ඕ අල්ලාහ් අපගේ ප්‍රාර්ථනාව පිළිගනු මැන. |

## සෑම කෙනෙකුටම අවසාන වදනක් :

මේ සියල්ලටම පසුව දැන් ඔබට ඉතිරි වී තිබෙන්නේ, ශුද්ධ කුර්ආනය පිළිබඳව ඔබගේ තීරනය දැන් රැඳී ඇත්තේ ඔබට සරිලන ශුද්ධ කුර්ආන් පරිවර්ථනයක් ගෙන එය ඔබම කියවා දැනීමෙහිය.

ශුද්ධ කුරාආනය සථ්‍යයැයි පැවසීමට ඇති ඉමහත් සාදකය නම් අප එය කියවා නිරීක්ෂණය කිරීමෙන් පසු අපගේ මනසට දැනෙන ප්‍රථිපලයයි.මෙය ශුද්ධ කුර්ආන්හි අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත :

නිශ්චය වශයෙන්ම අප (මෙම) පුස්තකය පහළ කර එය ඔවුන් මත පාරායණය කරනු ලැබීම ඔවුන්ට ප්‍රමාණවත් නොවේද? නිශ්චය වශයෙන්ම එහි අල්ලාහ් ගේ දයාවද විශ්වාස කරන සමූහයාට සිහිපත් කිරීමක්ද ඇත.(සූරාඃඅන්කබූත් 51).

තවත් ස්ථානයක අල්ලාහ් මිනිසාගෙන් මෙසේ ප්‍රශ්න කරයි.

ඔවුන් මෙම කුර්ආනය නිරීක්ෂණය නොකරන්නෝද? නැත්නම් ඔවුන්ගේ හදවත්වල එය සඳහා වන අගුල් (දමා) තිබේද? (සූරාඃමුහම්මද් 24).







# ඉස්ලාමයේ ඇති නැමදුම් හා එවායේ යථාර්තය



## අපගේ නැමදුම අල්ලාහ්ට අවශ්‍යද?

අල්ලාහ්ට අපි කරන කිසිම නැමදුම් ක්‍රියාවලියක් අවශ්‍ය වන්නනේ නැත.මේ සියල්ල පත් කර ඇත්තේ මිනිසාගේ අවංකබව පරීක්ෂා කිරීමටයි.මෙහිදී පෞද්ගලික ක්‍රියාවන් මෙන්ම සමාජ සේවාවන්ද අඩංගු වේ.එබැවින් නැමදුම් කිරීම අල්ලාහ්ගේ ප්‍රයෝජනයට නොව,එය මිනිසා සහ ජින් වරුන්ගේ පරීක්ෂනයක් ලෙසය.

## අපගේ නැමදුම අල්ලාහ් ට අවශ්‍යද?

අල්ලාහ්ට අප කරන කිසිම නැමදුම් ක්‍රියාවලියක් අවශ්‍ය වන්නනේ නැත. මේ සියල්ල පත් කර ඇත්තේ මිනිසාගේ අවංකබව පරීක්ෂා කිරීමටයි.මෙහිදී පෞද්ගලික ක්‍රියාවන් මෙන්ම සමාජ සේවාවන්ද අඩංගු වේ. එබැවින් නැමදුම් කිරීම අල්ලාහ්ගේ ප්‍රයෝජනයට නොව,එය මිනිසා සහ ජින් වරුන්ගේ පරීක්ෂණයක් ලෙසය.

අල්ලාහ් ශුද්ධ කුර්ආන්හි මෙසේ පවසයි.

56 තවද ජින්වරුන් හා මිනිසුන්ව මා නමදින්නට මිස මා මැවුවේ නැත.57 ඔවුන්ගෙන් කිසිදු සැපයීමක් මා පැතුවේ නැත.ඔවුන් මට ආහාර දිය යුතුය යැයි මා නොකීවෙමි.58 නිශ්චය වශයෙන්ම (සියළු අවශ්‍යතාවයන්) සපයන්නා. ශක්තිමත් බලවතා(සූරා:අස් දාරියාත්56-58).

සලාතය ඉටු කිරීමට ඇති නියම දිශාව මක්කාවද නැතිනම් වෙනත් දිශාවක්ද යන්නෙහි මිනිසුන් අතර කලබල තාවයක් ඇති විය.මදීනාවට පැමිණ විට බයිතුල් මක්දිස් දෙස සලාතය කරමන් සිටී නමුත් පසුව එය මක්කාවට යැයි මාරු කරනු ලැබීම එයට හේතු විය.එවිට අල්ලාහ් විශ්වාසය රැඳී ඇත්තේ දිශාවන්හි නොව,නිසි ලෙස අල්ලාහ්ව නැමදී මිනිසුන්ට යහපතින් ප්‍රයෝජන වීමෙහි යැයි අල්ලාහ් පැහැදිලි කළේය.

නැගෙනහිර හා බටහිර දෙසට මුහුණ හැරවීම (පමණක්) කුසල් කිරීමක් වනු නොමැත.එනමුත් කුසල් කරන්නා කවරෙක්ද යත් කවුරුන් අල්ලාහ් වද, අවසාන දිනයද, මලාඉකාවරුන්වද, පුස්තකයන්ද, දූතයන්ද විශ්වාස කර ඥාතීන්ටද, අනාථයින්ටද, දුගීන්ට හා මගීන්ටද යාචකයන්ට හා (වහළුන්) නිදහස් කිරීමට (තම) වස්තුව කෙරෙහි කැමැත්ත තිබෙන විටම එය වැය කර සලාතය ඉටු කර සකාතය දෙන්නේද ඔවුන්ද, ගිවිසුමක් ඇති කළේ නම් එය පරිපූර්ණ කරන්නන් හා දුගී බවෙහිද රෝගී බවෙහිද දුෂ්කර තත්ත්වයෙහිද ඉවසිලිව සිටින්නන්ය.සත්‍යවන්තයින් මොවුන්මයි. බියබැතියන්ද මොවුන්මයි.(සූරා:බකරහ් 177).

වන්දනාමාන සඳහා දෙනු ලබන වෙහෙස අල්ලාහ්ට නොව, එය සිය ප්‍රයෝජනය යැයි අල්ලාහ් ශුද්ධ කුර්ආන්හි පවසා ඇත.(සූරා:අන්කබූත් 6).




> සලාතය ඉටු කිරීමට ඇති නියම දිශාව මක්කාවද නැතිනම් වෙනත් දිශාවක්ද යන්නෙහි මිනිසුන් අතර කලබල තාවයක් ඇති විය. එවිට අල්ලාහ් විශ්වාසය රැඳී ඇත්තේ දිශාවන්හි නොව, නිසි ලෙස අල්ලාහ්ව නැමදී මිනිසුන්ට යහපතින් ප්‍රයෝජන වීමෙහි යැයි අල්ලාහ් පැහැදිලි කළේය.

## ඉස්ලාමයේ කුළුණු :

එනම් ඉස්ලාමයේ ඉතාමත් ප්‍රධානම වන්දනාවන්.




අල්ලාහ්ව හදවතින් විශ්වාසය ඇති කොට පසුව එය මුවින් උච්චාරන කර අවංකව අල්ලාහ්ට හා ඔහුගේ දූතයා පිළිපැදීමයි.එනම් නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යනුවෙන් හා නබි මුහම්මද් (සල්) තුමානන් ශුද්ධ අල්ලාහ්ගේ දූතයා යැයි සාක්ෂි දරමි යැයි පැවසීමයි.(32 වන පිටුව බලන්න)




අනිවාර්යය සලාතයන් ඉටු කිරීම.

(100 වන පිටුව බලන්න)




සුදුස්සන්ට සකාත් දීම.

(104 වන පිටුව බලන්න)




ශරීර හා මුදල් ශක්තිය ඇත්නම් ඔවුන් හජ් වන්දනාව ඉටු කිරීම.

(106 වන පිටුව බලන්න)




රමලාන් මාසෙහි උපවාසය රැකීම.

(108 වන පිටුව බලන්න)

## පැවරුම් හා පරීක්ෂණයන් තබා ඇත්තේ මන්ද?

අල්ලාහ් අපට ආහාර කිරීම පිණිස මුඛය දත් මවා පසුව ඔහුම උපවාසය රකින මෙන් පවසයි අලංකාරයන් හා ආශාවන් මවා පසුව ඔහුම බැල්ම ආරක්ෂා කර පතිවත රකින මෙන් පවසා ඇත අපට ශක්තිය දී පසුව අනුන්ට අපරාධ කිරීම තහනම් කර ඇත මෙවැනි ප්‍රශ්නයන් විවිධාකාර ලෙස ඇතැම් මිනිසුන්ගේ සිත්හි මතු වේ

ඉස්ලාමයේ බැල්මෙහි මෙහි යථාර්ථය මෙසේය,මෙසේ හැකියාවන් හා එම හැකියාව සීමා කිරීම මගින් අල්ලාහ් අපව පරීක්ෂා කරනවා මිස අපව අපහසු තාවයට පත් කර නැත එබැවින් අප අපේ ශරීර ශක්තිය හා හැකියාවන් අපගේ පාලනය යටතේ තබා එය නිසි වේලාවන්හි, නිසි ස්ථායන්හි හා නිසි ආකාරයෙන් භාවිතා කළ යුතුයි ඒවාට පටහැනි වීම නොවේ.

එබැවින් මිනිසාගේ උසස් බව රැඳී ඇත්තේ ඔහු සිය හැකියාව හා ශක්තිය පාපයන් මගින් කෙසේ පාලනය කර ඒවා තමන්ට හා අන් මිනිසුන්ට ප්‍රයෝජනය වන ආකාරයට යොමු කරන්නේ කෙසේද යන්නෙහින්ය අල්ලාහ් අපව මවා ඇත්තේද මෙය නිසාය.


මේ බව අල්ලාහ් ශුද්ධ කුර්ආනහි මෙසේ පවසා ඇත :

මුසු වූ ශුක්‍ර බිඳුවකින් නිශ්චය වශයෙන්ම මිනිසාව මැව්වේ අපය. ඔහුව පරීක්ෂා කරනු පිණිස ඔහුව අසන්නෙක්වද බලන්නෙක්වද කළෙමු. 3. (පසුව) නිශ්චය වශයෙන්ම අප ඔහුට මාර්ගය පෙන්වූයෙමු. (මේ පිළිබඳ ඔහු) ස්තූතිවන්තයෙකුව හෝ ගුණමකුවෙකු (ලෙසින් විවිධාකාර)ව සිටින්නේය. (සූරා: අල් ඉන්සාන් 2-3).

ඇතැම් අවස්ථාවන්හි අපහසුතාවයන් හා ශෝකය මගින්ද අල්ලාහ් මිනිසාව පරීක්ෂා කර ඉන් පසු අප අල්ලාහ් සමඟ කෙසේ කටයුතු කරන්නෙමුදැයි අල්ලාහ් බලන්නේය මෙම ඝනයේ පරීක්ෂණය ගැන අල්ලාහ් ශුද්ධ කුර්ආන්හි මෙසේ සඳහන් කර ඇත

155 බියද, කුසගින්න වස්තූන්, ජීවිත (වලට හානි ඇති වීම) හා ඵලදාව අඩුවීම වැනි දේවලින් අප ඔබ නිශ්චය වශයෙන්ම පරීක්ෂා කරන්නෙමු ඉවසීමෙන් සිටින්නන්හට ඔබ සුබාරංචි පවසන්නී 156 (ඕ මුහම්මද්!) ඔවුන් කෙබන්දන්ද යත් ඔවුන්ට යම් විපතක් ඇති වූ විට 'නිශ්චය වශයෙන්ම අප (රබ් වන්නේ) අල්ලාහ්ටමයි තවද නිශ්චය වශයෙන්ම අප ඔහු වෙතම නැවත යන්නන් වෙමු' යැයිද පවසති (සූරා: බකරහ් 155-156)

එබැවින් මෙම ලව්කික ජීවතය යනු අල්ලාහ් සම්බනධව අප තුල ඇති විශ්වාසයේ ශක්තිය අප පෙන්නුම් කරීමටයි මෙම සත්‍යය වටහා ගැනීමේ හැකියාව අල්ලාහ් සෑම මිනිසෙකුටම දී තිබුනද අල්ලාහ් කිසිවෙකුට එම යහමගින්ම ගමන් කළ යුතු යැයි බල කර නැත. ඒවා තමන්ගේ සිය කැමැත්තට අනුවම අල්ලාහ් තබා ඇත කෙසේ වෙතත් වැරදි කිරීම මිනිසාගේ ස්වාභයෙන්ම තිබෙන දෙයක් හෙයින් ඔහු එක වර සෑම පාපායක්ම අත් හැර යහමග පැමිණෙන්නේ නැත එනමුත් එම වැරදි අත් හැරිය යුතු බැවින් පාපොච්චාරනයේ දොරටුව අල්ලාහ් සෑම විටම විවෘතව තබා ඇත මිනිසාගේ පාපය පළිබඳ නබි මුහම්මද් (සල්) තුමානන් මෙසේ පවසා ඇත:'ඔබලා පාප කරන්නේ නැතිනම් අල්ලාහ් ඔබව විනාශ කර පාප කරන පිරිසක් අල්ලාහ් මවනු ඇත ඔවුන් සිය පාපය වෙනුවෙන් අල්ලාහ් ගෙන් සමාව අයදී අල්ලාහ් ඔවුන්ට සමාව දෙනු ඇත. (මුස්ලිම් 2749)



"එබැවින් මිනිසාගේ උසස් බව රැඳී ඇත්තේ ඔහු සිය හැකියාව හා ශක්තිය පාපයන් මගින් කෙසේ පාලනය කර ඒවා තමන්ට හා අන් මිනිසුන්ට ප්‍රයෝජනය වන ආකාරයට යොමු කරන්නේ කෙසේද යන්නෙහිය.



“සලාතයේ අන්තර්ගත වී ඇත්තේ අල්ලාහ්ව ප්‍රශංසා කර ඔහුව සිතින් සුවිශුද්ධ කිරීමේ ක්‍රියාවන් හා ප්‍රකාශනයන් වේ.

# සලාතය

මුස්ලිම් වරුන් එකම දිශාවකට මුහුනලා සියල්ලන්ම සීරුවෙන් සිට එකවරම රුකූඃ හා සුජූද් වැනි සලාතයේ කරුණු කරන ඔවුන්ට එහිදී ලොවෙහි කිසිම සම්බන්ද නොතිබෙන්නාක් මෙන් සිටී.මෙයින් ඔබ විස්මයට පත් වී මෙහි යථාර්තය කුමක්ද යන්න ගැන ඔබ සිතා බලන්නේ නැතිද?

මුස්ලිම් වරුන්ගේ මෙම සලාතය කුමක්ද?

සලාතය ඉස්ලාම්හි විශේෂ ස්ථානයක් ලබයි.මන්දයත් අල්ලාහ්ට යටහත් වී ඔහුට සමීප වීමේ ප්‍රධානතම වන්දනාව සලාතයයි.අල්ලාහ් සිය නබි වරයාට ආරම්භයේ කළ විදානයද මෙයයි.

(අල්ලාහ්ට) සමීප වී (ඔහුටම) සිර පහත් කරන්න.(සූරාඃඅලක් 19)


නබි (සල්) තුමානන් මෙසේ පවසා ඇතඃ'ඉස්ලාමය කුළුනු පහක් මත ගොඩ නැගී ඇත.නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත යනුවෙන් හා මුහම්ද් අල්ලාහ්ගේ දූතයා යැයි සාක්ෂි දැරීම, සලාතය ඉටු කරීම (බුකාරී 8)

මුස්ලිම්වරයාගේ සලාතයට හිමි කුසල්හි ප්‍රමානය රැඳී ඇත්තේ ඔහු සලාතය කරන විට කෙතරම් ආකාරයට සිය චින්තනය භාවිතා කරන්නේද ඒ අනුවයි.එනම් සලාතය කිරීමේදී ශුද්ධ අල්ලාහ්ගේ මතකය හැර අන් කිසිවක් නොතිබිය යුතුයි.සලාතය කිරීමේදී තමන් අල්ලාහ්ට සමීප වනවා යන්න හැගිය යුතුය.මෙම නිසාමයි නබි (සල්) තුමානන්ට ඉතාමත් ප්‍රියජනක නැමදුම ලෙස සලාතය විය.

සලාතය හා සම්න්ධ වූ වැකියන්හි අල්ලාහ් 'සලාතය ඉටු කරන්න' යැයි නොපවසා 'සලාතය ස්ථාපිත කරන්න' යනුවෙන් පවසා ඇත.එනම් හුදෙක් ශරීරයෙන් පමනක් එහි අනිවාර්යය කටයුතු කිරීම පමණක් නොව,එහිදී සිය මනසද මුළුමනින්ම අල්ලාහ්ගේ මතකයෙන් පිරී තිබිය යුතුයි.මෙසේ සලාතය කිරීම මගින් මුස්ලිම්වරයාට අන් සෑම යහපතක් කිරීමට පහසු වෙනවා මෙන්ම පාප හා නීච ක්‍රියාවන්ගෙන් තමන්ව ආරක්ෂා කිරීමටද පහසු වනු ඇත.මෙම අල්ලාහ් ශුද්ධ කුර්ආන්හි පැහැදිලි කර ඇත. (සූරාඃඅන්කබූත් 45)

සලාතය යනු ශාරිරික ව්‍යායාමක් කවුරුන් සිතන්නේද ඔහුට සලාතයේ ඇති මහගු බව අතපසු වනු ඇත. සලාතයේ අයුරු දෙස බැලූ විට අපට එහි අරමුණ පැහැදිලි වනු ඇත.සලාතයේ අන්තර්ගත වී ඇත්තේ අල්ලාහ්ව ප්‍රශංසා කර ඔහුව සිතින් සුවිශුද්ධ කිරීමේ ක්‍රියාවන් හා ප්‍රකාශනයන් වේ.සලාතය කරන්නා සිය දෑත් ඔසවා උසුරන ප්‍රථම වදන 'අල්ලාහු අක්බර්' අල්ලාහ් අති ශ්‍රේෂ්ටයි යනුවෙන්ය.පසුව ඔහු කරන සුජූද් හා රුකූ වලදී අල්ලාහ්ගේ ඉමහත්භාවය පවසා මිනිසාට කිසි ශක්තියක් නැත යන්න පිළි ගැනීමයි.ඔහු පවසන්නේ 'සුබ්හාන රබ්බියල් අලීම්' ඉමහත් මාගේ දෙවියා සුවිශුද්දයි' යනුවෙන්ය.තවත් අවස්ථාවන්හි 'සුබ්හාන රබ්බියල් අහ්ලා' ශ්‍රේෂ්ට මාගේ දෙවියා සුවිශුද්දයි. යනුවෙන්ය.තවත් විටක අල්ලාහ්ව ප්‍රශංසා කර සිය අවශ්‍යතාවයන් ශුද්ධ අල්ලාහ්ගෙන් අසා ප්‍රාර්ථනා කරයි.මේ ආකාරයෙන් මුළු සලාතයෙහිම මුස්ලිම් වරයාට ඇත්තේ ශුද්ධ අල්ලාහ්ගේ මතකය පමණී.

දයිනිකව පස්වේල් සලාතය ඉටු කළ යුතු යැයි අල්ලාහ් මුස්ලිම් වරුන්ට අණ කර ඇත.මෙය පොළවේ ඕනෑම ස්ථානයක කිරීමට අනුමැතිය තිබුනද, මුස්ලිම් වරුන්ට තමන් තුල ඇති සමගිය ශක්තිමත් කිරීම පිණිස හා ඔවුන් එකිනෙකා අතර මෙලොව හා එලොව කරෙහි උදව් කර ගැනීමේ හැගීම් ඇති වීම පිණිස මෙම සලාතය මස්ජිදයන්හි ඉටු කිරීම ඉතා අනර්ඝයි.



මස්ජිදුල් හරාම් යනු මුස්ලිම්වරුන්ගේ ඉතාමත් ප්‍රධාන මස්ජිදයයි.ඝන චතුරස්‍රය හැඩයට ඉබ්රාහීම් (අලයි) තුමා විසින් මවන ලද කඃබාව පිහිටා ඇත්තේ එහිය.මුස්ලිම් වරුන් කොතැන් සිටියද සලාතය කිරීමේදී එම දෙසට මුහුනා සිටිය යුතුයැයි ශුද්ධ කුර්ආනය මගින් මුස්ලිම් වරුන් අන කරනු ලැබී ඇත. කෙසේ වෙතත් එය නැමදුමේ දිශාව මිසක් නමදිනු ලබන්නේ අල්ලාහ්ය පමණි.

මීට අමතරව අනිවාර්ය නොවන්නා සලාතයන්හි තමන්ට හැකි අයුරින් වැඩි උනන්දුවක් දිය යුතු යැයිද ඉස්ලාමය මුස්ලිම් වරුන්ට උපදෙස් කරයි

මුස්ලිම් වරුන් කඃබා නම් එම මස්ජියට මුහුනලා සලාතය ඉටු කරයි ඉහත කී පරිදී මෙය නබි වරුන්ගේ පියා වන ඉබ්රාහීම් (අලයි) තුමා විසින් මවන ලද මස්ජිදයයි මෙම මස්ජිදයෙහි හජ් වන්දනාව ඉටු කිරීම පිණිස නබි වරුන් පැමිණ ඇති බව ඉතිහාසයේ සඳහන් වී ඇති මෙම කඃබාව කෙතරම් උසස් උවද මෙය කිසිම ප්‍රයෝජනයක් හෝ පිජාවක් ඇති කළ නොහැකි ගලක් පමනී මුස්ලිම් වරුන් තමන්ගේ සලාතයේදී මේ දෙසට මුහුන ලාන්නේ අල්ලාහ් එසේ අන කර තිබෙන නිසා පමනී

## ශුද්ධ අදාන් :

සලාතය කිරීම පිණිස මුස්ලිම් වරුන්ව මස්ජිදයට කැඳවීමේ ඇරයුමට ' ශුද්ධ අදාන්' යැයි කියනු ලැබේ.

මෙය අල්ලාහ්ව මෙනෙහි කර මුස්ලිම් වරුන්ට සලාතයේ වේලාව දැනුවත් කිරීමේ ක්‍රමයයි.එහි වචන මෙසේය :

1- අල්ලාහු අක්බර්,අල්ලාහු අක්බර්,අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, (අල්ලාහ් අති ශේෂටයි)

2- අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ් (නැමදීමට සුදස්සා අල්ලාහ් හැර අනි කිසිවෙකු නැනි යැයි මා සාක්ෂි දරමි, නැමදීමට සුදස්සා අල්ලාහ් හැර අනි කිසිවෙකු නැනි යැයි මා සාක්ෂි දරමි).

3- අෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහ්, අෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහ් (මුහ්මද් අල්ලාහ් ගේ දූතයා යැයි මා සාක්ෂි දරමි, මුහ්මද් අල්ලාහ් ගේ දූතයා යැයි මා සාක්ෂි දරමි).

4- හයියා අලස් සලාහ්, හයියා අලස් සලාහ් (සලාතය වෙත සීඝ්‍රව එන්න, සලාතය වෙත සීඝ්‍රව එන්න).

5- හයියා අලල් ෆලාහ්, හයියා අලල් ෆලාහ් (ජයග්‍රහනය වෙත සීඝ්‍රව එන්න, ජයග්‍රහනය වෙත සීඝ්‍රව එන්න)

6- අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, (අල්ලාහ් අති ශේෂටයි).

7- ලාඉලාහ ඉල්ලල්ලාහ් (නැමදීමට සුදස්සා අල්ලාහ් හැර අනි කිසිවෙකු නැත).

# සකාත් දීම

ලොවෙහි සෑම කෙනෙකුම උත්සහ දරන්නේ ධනවුත්තන්ගේ ධනයේ කොටසකින් දුප්පතුන්ව ආරක්ෂා කිරීමටයි.මෙය කිරීම මගින් සමාජයේ යහපත් තත්වයක් උදා කර ගත හැකිය. මේ සඳහා නොයෙක් ස්ථානයන්හි නොයෙක් ආකාරයේ උත්සහ දරති.එසේ හා සම්බන්ධව ඉස්ලාමිය ලබා ඇති ක්‍රියා මාර්ග කුමක්ද?

සෑම ධනවතෙකුම සිය අවශ්‍යතාවයට අධික ඇති ධනයෙන් වාර්ශිකව සියට 2.5% ක ප්‍රමාණයක් සකාත් ලෙස දුගී දුප්පතුන්ට වියදම් කළ යුතු යැයි අල්ලාහ් මුස්ලිම් වරුන්ට අණ කර ඇත. මෙය ඉස්ලාමයේ තුන්වන වගකීමයි.

ධනවුතුන් මෙසේ දුප්පතාට වියදම් කිරීම මගින් කුසල් ලැබීම මිස කිසිඳු උසස් බවක් ඔවුන්ට ඇති නොවේ.මෙය සෑම පොහොසතුන්ගෙන් අනිවාර්යයෙන් ලබා දුප්පතාටම අනිවාර්යයෙන් ලැබිය යුතු වගකීමයි.මෙය ලබා ගැනීම තුලින් දුප්පතාට නීචයකු වේ යනුවෙන් නොවේ.

2.5% යන මෙම සුළු ප්‍රමානය මුස්ලිම් ධනවතා අනිවාර්යයෙන් දිය යුතු ප්‍රමාණයයි.මෙයට අමතරව කෙතරම් වියදම් කළාද එවාහි අල්ලාහ්ගෙන් පරිපූර්ණ කුලිය ලැබෙනු ඇත.මේවායේ ඵලය ප්‍රගුන කර ආකිරාවේ මෙන්ම මෙලොවෙහිදීද ඔවුන්ට දැකගත හැකි වේ.

මෙසේ අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කරන්නාට අල්ලාහ් ඉතා අලංකාර උදාහරනයක් ශුද්ධ කුර්ආනයේ මෙසේ පැහැදිලි කර ඇත :

තම ධනය අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කරන්නන්ගේ නිදසුන එක් බීජයක නිදසුන මෙනි.එය කරල් හතක් පැළ කර එම සෑම කරලකම බීජ සියයක් ඇත.තවද අල්ලාහ් තමා පතන්නන්ට (මෙයටත් වඩාද) වැඩි කර දෙන්නේය.නිශ්චය වශයෙන්ම අල්ලාහ් අති විශාලයාය. සමනාව දන්නායි (සූරා- බකරහ් 261)



ධනවුතන් මෙසේ දුප්පතාට වියදම් කිරීම මගින් කුසල් ලැබීම මිස කිසිඳු උසස් බවක් ඔවුන්ට ඇති නොවේ. මෙය සෑම පොහොසතුන්ගෙන් අනිවාර්යයෙන් ලබා දුප්පතාටම අනිවාර්යයෙන් ලැබිය යුතු වගකීමයි.මෙය ලබා ගැනීම තුලින් දුප්පතාට නීචයකු වේ යනුවෙන් නොවේ.

එමෙන්ම සකාද් දීම සිතෙහි සැනසිල්ල හා මනස පවිත්‍ර තිරීමට කාරනා වන බව අල්ලාහ් ශුද්ධ කුර්ආන්හි පවසා ඇත:


(ඕ මුහම්මද්) ඔවුන්ව පවිත්‍ර කර ඔවුන්ව පිරිසිදුව තබන සකාතය ඔවුන්ගෙන් ගනු.(සූරා:අත් තව්බහ් 103).

තවද දුප්පතුන්ට වියදම් නොකර ඔවුන්ට උපහාර නොකර මසුරු වන්නන් අලාභයට පත් වූවන් යැයි අල්ලාහ් පවසයි.මන්දයතා ඔහු මෙසේ සමුරු වීම මගින් දෙලොවෙහිම ජය අතපසු වූවෙකු වන්නේය.(සූරා:මුහම්මද් 38).

ඉස්ලාමයේ මෙම වගකීම ක්‍රියාවට නැංවීම තුලින් සමාජයේ ඇති බොහෝ දෙනෙකුගේ දුක්බර නිවා සෑම සමාජයක්ම සමබර තාවයකට පත් කළ හැකිය.සුදුස්සන්ට සකාත් වස්තූන් ලබා දීම තුලින් ධනය එකම කණ්ඩායමක් තුල පමණක් කැරකීමේ තත්වය ඉවත් වී සෑම කෙනෙකුම එයින් ප්‍රයෝජනය ලබා ගත හැකි තත්වයක් උදා වනු ඇත.මුස්ලිම්වරුන්ගේ ආරම්භ කාලයේ සකාත් දීම නිසි ලෙස ඉටු කිරීම මගින් එකල ධනවතුන්ට ඔවුන්ගේ සකාතය දීමට දුප්පතෙකු සොයා ගම්වටා සැරසුනු යුගයක්ද තිබුනි.

මේ අතුරින් ඉස්ලාමය පිළිබඳ හොඳ අදහස් ඇතිව සිටින්නන්ටද සකාත් ලබා ගැනීමේ අයිතියක් ඇත.මන්දයත් පොදුවේ මිනිසුන් තමන්ට උපකාර කරන්නන්ව ප්‍රිය කරයි.මොවුන් ඉස්ලාමට ඇතුළු වූවද ඔවුන්ද මුස්ලිම්වරුන්ගේ සොහොයුරෙකු මෙන් සලකණු ලැබිය. මෙමගින් ඉස්ලාමයේ සහෝදරත්වය යනු ගොඩනැගිල්ල තව තවත් ශක්තිමත් වේ.එපමණක් නොව, සොරකම්, කොල්ල කෑම හා වංචා වැනි දෑ සමාජයෙන් නැති වීමටද සකාත් ප්‍රධාන කරුණක් වෙනවා නියතයි.

> තම ධනය අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කරන්නන්ගේ නිදසුන එක් බීජයක නිදසුන මෙනි.එය කරල් හතක් පැළ කර එම සෑම කරලකම බීජ සියයක් ඇත. තවද අල්ලාහ් තමා පතන්නන්ට (මෙයටත් වඩාද) වැඩි කර දෙන්නේය.නිශ්චය වශයෙන්ම අල්ලාහ් අති විශාලයාය. සමනාව දන්නාය.



# උපවාසය

අප කවුරුත් අපගේ ශරීරයේ සමබරතාවය තබා ගැනීමට හා සෞඛ්‍යය තත්වය ආරක්ෂා කර ගැනීමට උපවසාය රැකීම හා වද්‍යයවරුන්ගේ උපදෙස් පිළිපදින්නෙමු.මෙසේ කිරීම මගින් සිය සෞඛ්‍යය ආරක්ෂා කිරීම මෙන්ම සිය මනෝ ආශාවන් පාලනය කරගත හැකි යැයි අප විශ්වාස කරන්නෙමු.

මුස්ලිම්වරුන් උපවාසය රැකීම තුලින් මෙයටත් වඩා ඉමහත් ක්‍රියාවලියක යෙදෙති.ඉහත සඳහන් සෑම දෙයක්ම ඔවුන්ට අත් වෙනවා සමඟ මෙය අල්ලාහ්ගේ අණ පිළිපැදීමක් නිසා කුසල්ද හිමිවේ.

උපවාසය රැකීම ඉස්ලාමයේ සතර වන අනිවාර්‍යයි.ශක්තිය දරන සෑම කෙනෙකුම උපවාසය රැකීම අනිවාර්‍යයි.එනම් උපවාසය රැකිය යුතු රමලාන් මසෙහි සූර්‍යයාගේ උදා වීම සිට බැසයන කාලය දක්වා ආහාර පාන ගැනීම, සංසර්ගයේ යෙදීම වැනි දැයින් වැලකී සිටිය යුතුයි. රමලාන් මස යනු ඉස්ලාම් කැලන්ඩරයට අනුව ඇති නමවන මාසයයි.

> කවුරුන්ගේ ගතිගුන උපවාසය මගින් නිසි නොවන්නේද ඔහු සිය උපවාසයෙන් ප්‍රයෝජන ලබා නැති බව නබි (සල්) තුමානන් දැනුවත් කර ඇත.

උපවාසය රැකීම අපට මෙන්ම පෙර ජනසමූහයන්ටද අනිවාර්‍යය කරනු ලැබී ඇති බව ශුද්ධ කුර්ආන්ය පැහැදිලි කරයි.එවායේ ආකාරයන් විවිධාකාර වුවද උපවාසයේ අරමුන වූවේ අල්ලාහ්ට බියබැති වී ඔහුව පමණක් නැමදුම් කිරීම තහවුරු කිරීමයි.(සූරා බකරා:183)

උපවාසය මගින් කෙසේ අල්ලාහ්ට බියබැති කෙනෙකු වන්නේදැයි ප්‍රශ්නයක් ඇති විය හැකියි එනම් මුස්ලිම්වරයා උපවාසය රකින විට ඇතැම් අනුමැතිය ඇති දෑ පවා ඔහු වැලැක් වී සටී මෙමගින් ඔහු තම සිතෙහි පාලකයා වන්නේය.රමලාන්හි දහවලෙහි අනුමැතිය ඇති දැයින් වැලැක් වී සිටින්නේ නම් අනෙක් කාලයන්හි තහනම් කරනු ලැබූ දැයින් වැලැක් වී සිටීම පහසු වනු ඇත.එසේ නොවන්නේ නම් ඔහු උපවාසය අල්ලාහ් පවසා ඇති ආකාරයට රැකී නැත යැයි පැහැදිලි වේ.කවුරුන්ගේ ගතිගුන උපවාසය මගින් නිසි නොවන්නේද ඔහු සිය උපවාසයෙන් ප්‍රයෝජන ලබා නැති බව නබි (සල්) තුමානන් දැනුවත් කර ඇත.මේ පිළිබඳව නබි මුහම්මද් (සල්) තුමානන් මෙසේ පවසයි:‘උපවාසය රකින විට කවුරුන් පාප සහිත වචන හා ක්‍රියා අත් නොහරින්නේද, ඔහු ආහාර පාන අත් හැරීමෙන් අල්ලාහ්ට කිසිඳු අවශ්‍යතාවයක් නැත’(බුකාරී 1804).

> උපවාසය රැකීම අපට මෙන්ම පෙර ජනසමූහයන්ටද අනිවාර්‍යය කරනු ලැබී ඇති බව ශුද්ධ කුර්ආන් පැහැදිලි කරයි.එවායේ ආකාරයන් විවිධාකාර වුවද උපවාසයේ අරමුන වූවේ අල්ලාහ්ට බියබැති වී ඔහුව පමණක් නැමදුම් කිරීම තහවුරු කිරීමයි.

උපවසාය මගින් ඇති වන තවත් ප්‍රයොජනයක් නම්, මුස්ලිම්වරයාට දුප්පතාගේ කුසගින්නෙහි වේදනාව වටහා ගත හැකිවේ.



> ඉස්ලාමය මුස්ලිම්වරුන්ට උපවාසය අනිවාර්ය කිරීම මගින් දුප්පතාගේ කුසගින්න ඔවුන්ට මතක් කරයි.

# හජ් වන්දනාව

සෑම ආගමක්ම තමන්ගේ වැඳුම් පිළිවෙත පෙන්වීම සඳහා ඇතැම් වන්දනා ගමන් ඇත.මේ අතර ලොවේ ඉතාමත් අදික පිරිසක් විසින් කරනු ලබන වන්දනා ගමන වන්නේ හජ් වන්දනා ගමනයි.එයට වාර්ෂිකව මිලියන තුනටත් අධික මුස්ලිම්වරුන් හජ් වන්දනාව සඳහා ශුද්ධ භූමිය මක්කාවට යති.

මුස්ලිම්වරුන්ගේ හජ් වන්දනාව යනු කුමක්ද?

ඉස්ලාමයේ ප්‍රධාන වගකීම්වලින් හජ් පස්වන ස්ථානය ගනී. ශරීර හා ධනයේ සම්පතෙහි ශක්තිය ඇත්තන්ට මෙය ජීවිතයෙහි එක් වතාවක් අනිවාර්ය වේ.

ඉස්ලාමයේ අනෙකුත් වන්දනාවන් මෙන්ම හජ් වන්දාවේදීද වර්ණ කුල බේද සියල්ල සැඟවී යනු ඇත.සෑම කෙනෙකුම එකම වර්ණයේ හා එකම ආකාරයේ වස්ත්‍රය පැළඳී ඔවුන් සියල්ල මෙසේ පවසයි:



‘ලබ්බයික අල්ලාහුම්ම ලබ්බයික.ලබ්බයික ලා ෂරීක ලක ලබ්බයික.ඉන්නල් හම්ද වන් නිඃමත ලක වල් මුල්ක්.ලා ෂරීක ලක්’

(මා ඔබගේ අනට යටත් වූවෙමි ඕ අල්ලාහ් මා ඔබගේ අනට යටත් වූවෙමි මා ඔබගේ අනට යටත් වූවෙමි ඔබට කිසි සමානයක් නැත.මා ඔබගේ අනට යටත් වූවෙමි නිත්‍ය වශයෙන්ම ප්‍රශංසාව, ආශිර්වාදය හා පාලනය යිමි ඔබටමයි).

හජ් යනු ඊමානය හා සම්බන්ධ වු එක්තරා ක්‍රියා හා ප්‍රකාශයනයෙන් සමන්විත වූ වන්දනාවකි.මෙහි අරමුණ වන්නේ අල්ලාහ්ව මෙනෙහි කර ඔහුට බිය බැති වී ගැත්තාගේ අපොහොසත්බව අල්ලාහ්ට පෙන්වා සිය අවශ්‍යතාවයන් හා සමාව අල්ලාහ්ගෙන් අයදීමයි.

නබි (සල්) තුමානන් එක් හදීසයක මෙසේ පවසා ඇත : කඃබාව වටේ කැරකීම හා හජ්හි (සෆා මර්වා අතර) දිවීම පත් කරනු ලැබී ඇත්තේ අල්ලාහ් මෙනෙම් කිරීම තහවුරු කිරීමටයි.(ඉබ්නු අබී ෂයිබහ් 15334).



හජ් වන්දනාවට මක්කාවට පැමිණෙන්නා ඔහුගේ දයිනික වස්ත්‍රය ගලවා ඉහ්රාම් වස්ත්‍රය පැළඳ සියල්ලන්ම එක හා සමානව අල්ලාහ්ට අවනත වන්නෝය.



# ඉස්ලාමයේ බැල්මෙහි පවුල

# පවුලක්

පවුලක් යනු එකම නිවසක විවිධ ආකාරයෙන් සමන්විත සාමාජිකයින් යන අර්ථය දේ.


මේ සාමාජිකයින්ම සිය වගකීම ඉටු කිරීමට නියලී සිටීම නිසා ඔවුන්ගේ සතුට අහිමි වන බව සිතති.මෙසේ ඔවුන්ට පවුල් ජීවිතයේ බර පමණක් ඉතිරි වී සතුට අහිමි වීමට හේතුව කුමක්ද?

නවීන කාලයේ මේවාට පිළිතුරු තිබුනද ඒවා සෑම කෙනෙකුටම අදාල වන්නේ නැත. ඇත්තෙන්ම පවසනවා නම්, ඒවා යම් පෞද්ගලික විසඳුම් හෝ තාවකාලීන විසඳුම් මිස සමාජයේ සෑම කෙනෙකුට හෝ සදාකාලීන විසඳුම් නොවේ.

සියවස් 21ට පෙර ඉස්ලාමය මේ සියල්ලටම නිසි විසඳුම උගන්වා දී ඇත.පවුලේ සෑම සාමාජිකයින්ගේම වගකීම් පැහැදිලි කර ඇත.මන්දයත් සෑම කෙනෙකුම තමන්ගේ වගකීම නිසිලෙස ඉටු කිරීමෙන් පවුල් අතර ප්‍රශ්න ඇති නොවේ.සෑම සාමාජිකයින්ම නිසි ලෙස කටයුතු කිරීම මගින් පවුල් ජීවිතය අලංකාර වේ.සෑම පවුලක්ම අලංකාර වීම තුලින් මුළු සමාජයම පරිපූර්ණ වේ.

## පවුලේ සතුට රැකීමට ඉස්ලාමය යොදා ඇති ක්‍රමවේධ අප්‍රමාණයි :

**1**



### විවාය කර පවුල් ජීවිතය ආරම්භ කිරීම ඉස්ලාමය අනිවාර්ය්‍ය කර ඇත.

- විවාහය ඉස්ලාම් අනිවාර්ය්‍ය කර ඇත්තේ එය පෙර නබිවරුන්ගේ සුන්නතයක් බැවින් හා එය එක් නැමදුමක් බැවිනි.ඇතැම් සහාබාවරුන් විවාහ නොකර අඛන්ඩ උපවාසයේ යෙදී රාත්‍රිය පුරා ඇහැරී පරිපූර්ණයෙන්ම නැමදුමෙහි නියලනවා යැයි පැවසූ විට නබි (සල්) තුමානන් මෙසේ පැවසුවේය:‘මම උපවාසය රකිනවා මෙන්ම උපවාසයේ නොයෙදීද සිටිමි රාත්‍රියෙහි (කොටසක්) සලාතයද කර (තවත් කොටසක්) නිදාගන්නෙමි. මා විවාහ කර ගන්නෙමි.එබැවින් මාගේ පිළිවෙත අත්හරින්නා මගෙන් කෙනෙකු නොවේ’ (බුකාරී:4776)
- විවාවහය පහසු කර විවාහ කරන්නට පතන්නාට අල්ලාහ්ගේ උදව් ඇත යැයි නබි (සල්) තුමානන් පවසා ඇත. එක් හදීසයක නබි (සල්) තුමානන් මෙසේ පැවසූහ: ‘තුන්දෙනෙකුට උදව් කිරීම අල්ලාහ්ගේ වගකීමයි.පතිවත රැකීමට විවාහය කරන්නා’(අත් තිර්මිදී).
- ආදම්ගේ පුතාට අල්ලාහ් පෙන්වා ඇති දායාදයන් හා සාදකයන් ශුද්ධ කුර්ආන්හි අල්ලාහ් පැහැදිලි කරන විට ඔහු මෙසේ පවසයි :ඔබ සැනසීම ලබනු පිණිස (ඔබගේ) බිරියන්ව ඔබ වෙතින්ම ඔබ වෙනුවෙන් ඔහු මවා ඔබ අතර ආදරය හා දයාව ඇති කර තිබීමද ඔහුගේ සාධක අතුරින් වේ.(සූරා:අර් රූම් 21).
- තරුණයින් සිය පතිවත ආරක්ෂා කර ඔවුන්ගේ ආශාවන් ඉස්ලාමයේ අනුමැති ආකාරයෙන් ඉටු කර සිත්හි සන්සුන් බව ලබා ගැනීම පිණිස විවාහ කළ යුතු යැයි ඉස්ලාම් දැඩිව පවසා ඇත.

"

ආදම්ගේ පුතාට අල්ලාහ් පෙන්වා ඇති දායාදයන් හා සාදකයන් ශුද්ධ කුර්ආන්හි අල්ලාහ් පැහැදිලි කරන විට ඔහු මෙසේ පවසයි :

ඔබ සැනසීම ලබනු පිණිස (ඔබගේ) බිරියන්ව ඔබ වෙතින්ම ඔබ වෙනුවෙන් ඔහු මවා ඔබ අතර ආදරය හා දයාව ඇති කර තිබීමද ඔහුගේ සාධක අතුරින් වේ..



## 2

### ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂයටම ඉස්ලාම් පරිපූර්ණ අයිතිය හා ගෞරවය ලබා දී ඇත.

මව හා පියා දෙදෙනාට සිය දැවන් රැක බලා ගැනීමේ වගකීම ඉස්ලාමිය දී ඇත. මෙය නබි (සල්) තුමානන් හිදීසයක මෙසේ පැහැදිලි කළේය:ඔබ සියල්ලන්ම වගකීම් ඇත්තන්ය.ඔබ ඔබගේ වගකීම් පිළිබඳව විමසනු ලබයි.නායකයා වගකීම් ඇත්තාය. ඔහු ඔහුගේ වගකීම පිළිබඳව විමසනු ලබයි. පුරුෂයා සිය පවුලේ වගකීම් දරන්නාය.ඔහු ඔහුගේ වගකීම පිළිබඳව විමසනු ලබයි.සිය ස්වාමියාගේ නිවසෙහි වගකීම ස්ත්‍රියට පැවරී ඇය ඇගේ වගකීම පිලුදබඳව විමසනු ලබයි. සිය ස්වාමියාගේ දේපලේ වගකීම දරන්නා සේවකයාය.ඔහු සිය වගකීම පිළිබඳව විමසනු ලබයි. (බුකාරී:853).



## 3

### දෙමව්පියන්ට ගෞරවය කර ඔවුන්ව රැකබලා ඔවුන්ගේ මරණය තෙක් ඔවුනන්ට අවනත විය යුතු යැයි ඉස්ලාම් දිරිගන්වා ඇත

දරුවන් කෙතරම් වැඩුනද ඔවුන් සිය දෙමව්පියන්ට ගරුකර ඔවුන්ට අවනත වීමේ වගකීම ඉවත් වන්නේ නැත.තමාගේ නැමදුම හා දෙමව්පියන්ට නිසි ලෙස සැලකීම යන කරුණු දෙක අල්ලාහ් අල්කුර්ආනහි එකට සඳහන් කර ඇත:

(ඕ මුහම්මද්!) ඔහු හැර අන් කිසිවෙකුට නොනමදින ලෙසද දෙමව්පියන්ට යහපත කරන ලෙසද ඔබගේ රබ් අණ කරයි.ඔවුන් දෙදෙනා හෝ ඔවුන්ගෙන් කෙනෙකු ඔබ වෙත සිටිනා අතර මහළු වියට පත් වුවහොත් (ඔවුන් නිහඬ කරනු පිණිස) ඔවුන්ට 'ඡ්ඡ්' යයි (හෝ) නොකියන්නී.ඔවුන් (ඔබ වෙතින්) පළවාද නොහරින්නී.(තවද) ඔවුන්ට (නිතර) ගරුසරු වදනක්ම පවසන්න (යැයිද ඔහු අණ කරයි) (සූරා: ඉස්රා 23).



> ක්‍රියාවෙන් පමණක් නොව,කුඩා වචනයකින් නැතිනම් ශබ්දයකින් හෝ දෙමව්පියන්ට දුකක් ඇති කිරීම ඉස්ලාමිය අවවාද කර ඇත

## 4

**දරුවන්ගේ වගකීම ආරක්ෂා කර ඔහුන් අතර සමානව කටයුතු කරන මෙන්ද ඉස්ලාම් අනිවාරයය කර ඇත.**

'තමන් වියදම් කළ යුත්තන් නාස්ති කිරීම මිනිසාගේ පවට සෑහේ' යැයි නබි (සල්) තුමානන් පවසා ඇත. (අබූ දාවූද් 1692)

ස්ත්‍රී දරුවන්ට වියදම් කිරීම නබි (සල්) තුමානන් අධිකව දිරිගන්වා ඇත: 'කවුරුන් ස්ත්‍රී දරුවන් භාරගෙන ඔවුන්ව අලංකාරයෙන් හදා වඩා ගන්නේද ඔවුන් ඔහුව නිරයෙන් ආරක්ෂා කරන තිරයක් වන්නෝය. (බුකාරී:5649)

## 5

**ඥාතින් සම්බන්ධතාව රැක ගැනීම මුස්ලිම්වරයාගේ වගකීමයි.**

දෙමව්පියන් දෙදෙනාගේම පාර්ශවයෙන් ඇති සිය ඥාතීන්ට උපකාර කළ යුතුයි.මන්දයත් මෙය ශ්‍රේෂ්ට කුසල් සහගත නැමදුමකි.එයට පටහැනිව ඥාතීන්ගෙන් වෙන් වී සිටීම මහා පරිමාණයේ පවක් යැයි ඉස්ලාමිය පවසා ඇත:ඥාතීන් සම්බන්දතා කඩ කරන්නා ස්වර්ගයට නොපිවිසේ' යැයි නබි (සල්) තුමානන් පවසා ඇත.(මුස්ලිම් 2556).



# ස්ත්‍රීන්ට ඉස්ලාමය දී ඇති ස්ථානය



නවීන

නවීන කාලයේ දැන්වීම් සඳහා භාවිතා වන ආකර්ෂණීය වස්තුවක් ලෙසද,පිරිමියාගේ ආශාව ඉටු කර දිය යුතු වස්තුවක් මෙන් ස්ත්‍රීන් භාවිතා කරනු ලබති.

පෙර කාලයන්හිද ස්ත්‍රීන්ට නිසි ගෞරවය දෙනු ලැබී ඇත යැයි අප අදහස් නොකරන්නෙමු.ඔවුන් සෑම වකවානුවෙහිම විවිධ ආකාරයේ අවශ්‍යතාවයන්ට භාවිතා කරනු ලැබී ඇත.

ස්ත්‍රීන් කෙතරම් අපහාසයට පත් කරනු ලැබුවද ඔවුන්ට මෙම අපහාසයේ දොරටුවෙන් පිට වීමක් කිසි විටෙක තිබුනේ නැත.

වසර 1400ට පෙර ඉස්ලාමය පැමිණි විටද ස්ත්‍රීන් අපහාසයට ලක් වෙමින් තිබුනි.ඔවුන්ගේ අසාධාරණය වලක්වා ඔවුන්ගේ අයිතීන් රැකගැනීමේ පියවර ඉස්ලාම් ආරම්භ කළේය.එමගින් සත්‍රීන්ට ගෞරවය ලැබීමට ආරම්භ විය.

ඔවුන්ට අවේනික ඇතැම් රීතීන් පැහැදිලි කරන්නාවූ එක් පරිච්චේදයක් 'අන් නිසා' (ස්ත්‍රීන්) යැයි නම් කෙරී ඇත.සිල්වත් ස්ත්‍රීන් බොහෝ දෙනෙකුගේ වෘත්තාන්ත ශුද්ධ කුර්ආන්හි සඳහන් වී ඇත.එපමණක් නොව,තවත් එක් පරිච්චේදයක් ස්ත්‍රියෙකුගේ නමින්ම හඳුන්වනු ලැබී ඇත.එය ඊසා (අලයි) තුමාගේ මව මර්යම් වේ.

ස්ත්‍රීන්ව ආශාවට හා අවශ්‍යතාවයට පමණක් බැලීමේ බැල්ම ඉස්ලාමය මාරු කර ඔවුන්ව අල්ලාහ් කුමක් සඳහා මවා ඇත්තේද එය පැහැදිලි කර දුන්නේය. ඔවුන් වස්තූන් නොව මානවයාය, ඔවුන් රාත්‍රියේ සාහාකියන් නොව මුළු ජීවිතයේ සාහකයින් වේ,ඔවුන් හුදෙක් කාමය ඉටු කරන වස්තුවක් නොව ආදරය හා සෙනෙසහ දිය හැකි තැනැත්තිය යැයි ඉස්ලාම් ලොවට පෙනවා දුන්නේය.

## ස්ත්‍රීන්ව ඉස්ලාම් ගෞරවය කර ඇති බව පැහැදිල කර ඇති ඇතැම් රීතීන් :

- සිය ස්වාමියා තෝරාගැනීමේ අයිතිය ස්ත්‍රීන්ට ඇත.දරුවන් හදාවඩා ගැනීමේ භාරයේ පරිපූර්ණ අයිතියක් ස්ත්‍රීන්ටද ඇත.නබි (සල්) තුමානන් මෙසේ පවසා ඇත:සිය ස්වාමියාගේ දේපලේ වගකීම දරන්නා සේවකයාය.ඔහු සිය වගකීම පිළිබඳව විමසනු ලබයි. (බුකාරී 853).
- විවාහයෙන් පසු ඇය සිය නම ස්වාමියාගේ නමත් සමඟ එකතු කර එය මාරු කළ යුතු යැයි අනිවාර්‍ය නොකර ඇගේ පියාගේ නමම තබා ගැනීමේ අයිතිය ඇයට ඇත.
- කිසිවකුගේ රැකවරණයක් නොමැති දුර්වල ස්ත්‍රීන්ට උදව් උපකාර කිරීම ඉමහත් කුසල් සහගත කරුණක් යැයි නබි (සල්) තුමානන් එක් හදීසයක පවසා ඇත:වැන්දඹු ස්ත්‍රීන්ට හා දුගීන්ට උදව් කරන්නා අල්ලාහ්ගේ මාර්ගයේ වෑයම් කරන්නා මෙන්,නිදි මරා නැමදුම් කරන්නා හා අඛණ්ඩව උපවාසය රකින්නා මෙන්ය' (බුකාරී 5661).

> ඉස්ලාමය ස්ත්‍රීන්ට නිසි තැන නොදී ඔවුන්ව අපහාස කරනු ඇත යන්න ඇතැමුන්ගේ මතයයි.එසේ නම් බ්‍රිතානය වැනි රටවල් වල අලුතින් ඉස්ලාමය වැළඳ ගන්නන්ගෙන් සියයට 75 ස්ත්‍රීන්යයි.මොවුන්ගෙන් බොහෝ දෙනෙකු ඉස්ලාමයට පිවිසීමේ තීරනය කර ඇත්තේ ස්ත්‍රීන් හා පවුල් සම්බන්දව ඉස්ලාමයේ නීති රීතීන් හැදෑරීමෙන් පසුවයි.
>
> INDEPENDET 6-11-2011





- නොයෙක් කරුණු වලදී සත්‍රීන්ට හා පුරුෂයින්ට සමාන අයිතිය පවරා ඇත.පොදුවේ ගනුදෙනු කිරීමෙහි ස්ත්‍රීන්ට පුරුෂයින් මෙන් සමාන අයිතියක් ඇත.එක් හදීසයක නබි (සල්) තුමානන් මෙසේ පවසයි :‘ස්ත්‍රීන් පැරුෂයින්ගේ කොටසකි’ (අබූ දාවූද් 236).
- මව දියනිය හා බිරිඳ වැනි වියදම් කිරීම අනිවාර්ය්‍ය වන ස්ත්‍රීන්ට මසුරු කම් නොමැතිව පුරුෂයින් වියදම් කිරීම අනිවාර්ය්‍යයි.
- උරුම වස්තුවෙන් නිසි කොටසක් ස්ත්‍රීන්ට හිමිවේ.ඇතැම් අවස්ථාවන්හි ඔවුන්ට පුරුෂයින් මෙන්ම සමාන කොටසක් ලැබේ. විටක ඇගේ කොටස අඩු වෙනවා මෙන්ම තවත් අවස්ථාවන්හි ඇගේ කොටස පුරුෂයින්ට වඩා අධිකද වේ.පුරුෂයින් ස්ත්‍රීන්ට වියදම් කිරීම අනිවාර්යය නමුත් ස්ත්‍රීන් වියදම් කිරීම අනිවාර්යය වන අවස්ථා ඉතා දුර්ලභ වූවද උරුම වස්තුවෙන් ඇයට කොටසක් දීම තුලින් ඇයට ඉස්ලාමය ගෟවරවය කර බව පැහැදිලි වේ.ඉස්ලාමය කිසි විටෙක කිසිම කෙනෙකුට අසාධාරනයක් නොකරන සමබර මාර්ගයකි.

> උරුම වස්තුවෙන් නිසි කොටසක් ස්ත්‍රීන්ට හිමිවේ.ඇතැම් අවස්ථාවන්හි ඔවුන්ට පුරුෂයින් මෙන්ම සමාන කොටසක් ලැබේ.විටක ඇගේ කොටස අඩු වෙනවා මෙන්ම තවත් අවස්ථාවන්හි ඇගේ කොටස පුරුෂයින්ට වඩා අධිකද වේ.

## විශේෂ අවදානමක් යොමු කල යුතු යැයි ඉස්ලාම් පවසන ස්ත්‍රීන්:

**මව :** කෙනෙකු නබි (සල්) තුමානන් වෙත පැමිණ ‘මා අධිකව අලංකාරව කටයුතු කළ යුත්තේ කවුරුන් සමගද?’ යැයි ඇසුවේය.එයට නබි (සල්) තුමානන් ‘ඔබගේ මව’ යැයි පැවසුවේය.‘ඉන් පසු කවුරුන්ද’ යැයි ඔහු නැවතත් ඇසුවේය.එවිටත් නබි (සල්) තුමානන් ’ඔබුගේ මව’ යැයි පැවසුවේය.නැවතත් ඔහු ‘ඉන් පසු කවුරුන්ද?’ යැයි ඇසූ විටද ‘ඔබගේ මව’ යැයි නබි (සල්) තුමානන් පිළිතුරු දුන්නේය.ඔහු සතර වන වතාවට ඇසූ විට නබි (සල්) තුමානන් ‘ඔබගේ පියා’ යැයි පැවසුවේය.(බුකාරී 5626).

**දියනිය :** නබි (සල්) තුමානන් ස්ත්‍රී දරුවන් විශයෙහි මෙසේ පවසා ඇත: කවරුන්ට ස්ත්‍රී දරුවන් තිදෙනෙකු තිබී ඔවුන්ගේ විශයේ ඉවසා ඔවුන්ට ආහාර පාන සපයා ඔහුගේ හෙයාවට අනුව ඔවුන්ට ඇඳුම් පැළඳුම් සපයන්නේද ඔහුට ඔහුගේ දැරියන් නිරයෙන් ආරක්ෂකයක් වන්නේය’ (ඉබ්නු මාජා 3669).

**බිරිඳ :**‘ඔබලාගේ උතුම් පුද්ගලයා සිය බිරිඳට උතුම්ව සිටින්නාය.මා මාගේ බිරිඳන්ට උතුම් වන්නෙමි’ යැයි නබි (සල්) තුමානන් පවා ඇත.(අත් තිර්මිදී 3895).



> ඉස්ලාමයේ බැල්මෙහි ස්ත්‍රී පුරුෂයින්ගේ සම්බන්දතාවය කිසි ගැටුමක් නොමැති පරිපූර්ණයි.මුස්ලිම් සමාජය ගොඩනැගීමෙහි ඔවුන් එකිනෙකා එක්ව සිටිය යුතුයි.

## මොවුන් දෙපිරිස අතර කිසි ගැටලුවක් තිබිය නොහැකිය:

ස්ත්‍රී පුරුෂ අතර ආරවුලක් ඇති වීම අවශ්‍ය කරුණක් නොවේ.ඔවුන් අතර මත බේද ඇති වී තර්ක වී එකා අනෙකාගේ අඩුපාඩු හෙලි කිරීම නුසුදුය.

ස්ත්‍රීන් පුරුෂයින්ගේ එක් අඩකි.ඇය පුරුෂයින්ගේම තවත් කොටසකි.එසේ නම් ඔවුන් අතර මතබේදයක් තිබිය යුත්තේ මන්ද? ඉස්ලාමයේ බැල්මෙහි ස්ත්‍රී පුරුෂයින්ගේ සම්බන්දතාවය කිසි ගැටුමක් නොමැති පරිපූර්ණයි. මුස්ලිම් සමාජය ගොඩනැගීමෙහි ඔවුන් එකිනෙකා එක්ව සිටිය යුතුයි.

ඔවුන් අතර ඇති සම්බන්දතාවය ශුද්ධ කුර්ආනහි මෙසේ සඳහන් වී ඇත. ඔබ ඔවුන්ට වශ්ත්‍රයක් හා ඔවුන් ඔබට වශ්ත්‍රයක් වෙත (සූරා:බකරාහ් 187)

පුරුෂයින් ස්ත්‍රීන් තුල යම් අඩුපාඩුන් දකින්නේ නම් එය ඔහුට ඇතැම් විට අධිකව පෙනෙන්නේ ඔහුට ඇති අධික ශක්තිය නිසාය.මෙසේ ඔවුන් දෙදෙනාව අල්ලාහ් වෙනස් ආකායට මවා ඇත්තේ පවුලේ සමබර තාවය රැකීමටයි.එසේම ඇයද පුරුෂයා තුල ඇතැම් අඩුපාඩුන් දැකිය හැකිය.මෙම අඩුපාඩුන් සමාජයේ තිබිය යුතුමයි.

ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවම අල්ලාහ් එක හා සමානව මවා ඇත්තේ නම් එය අල්ලාහ්ගේ මැවීමට නිසි අර්ථයක් ගෙන නොදේ.

නබි (සල්) තුමානන්ගේ කාලයෙහි ඇතැම් පුරුෂයින් සත්‍රීන්ට සුවිශේෂි කරුණු තමන්ටත් තිබිය යුතු බවද ඇතැම් ස්ත්‍රීන් පුරුෂයින්ට සුවිශේෂි කරුණු තමන්ටත් තිබිය යුතු යැයි ප්‍රිය කළ විට පහත ශුද්ධ කුර්ආන් වැකිය පහළ විය :

ඔබගෙන් ඇතැමුන්ට වඩා තවත් ඇතැමුන්ව අප උසස් කර තිබීම ගැන ඔබ (ද එසේ වීමට) තන්හාව ඇති නොකරග න්නී.පුරුෂයින් ඔවුන් ඉපැයූ දෙයෙහි ඔවුන්ට (හිමි) කොටස ඇති (එමෙන්ම) ස්ත්‍රීන්ට ඔවුන් ඉපැයූ දෙයෙහි ඔවුන්ට (හිමි) කොටසද ඇති තවද අල්ලාහ් වෙතින් ඔහුගේ ආශීර්වාදය යදින්නී (අන් නිසා 132).

සෑම කෙනෙකුටම තම තමන්ට හිමි විශේෂාංගයන් හා අයිතීන් ඇත. ඉස්ලාමයේ අරමුණ ස්ත්‍රීන් හෝ පුරුෂයින් පමණක් පරිපූර්ණ කිරීමට නොව, මුළු සමාජයම යහපත් කිරීමයි.




“ කෙසේ වෙතත් බොහහෝ සමාජිකයින් විශේෂයෙන්ම හොඳ ශිෂ්ඨාචාරයක් ඇත්තවුන් ස්ත්‍රී පරුෂයින් අතර යම් නීතීන් තිබිය යුතු යැයි විශ්වාස කරති.එසේ නොමැති නම් මිනිසාගේ ජීවිතය විනාශයට ලක් වී මිනිසාට හා සතුන් අතර කිසි වෙනසක් නොතිබේ යැයි ඔවුන් පවසති.



## ස්ත්‍රී හා පුරුෂයා අතර ඇති බැඳීම :

ස්ත්‍රී පුරුෂයින් අතර ලිංගික ඇසුරුමෙහි කිසිඳු නීතියත් නොතබා දෙපාර්ශවගේ කැමැත්තෙන් ඕනෑ ආකාරයක සම්බන්ධයක් නීත්‍යානු කූලයැය.ලොවෙහි අදික දෙනෙකු පවසයි.තවත් පිරිසක් පරිපූර්ණයෙන් නිරුවත් වීමෙහි හෝ සමලිංගිකයේ පවා වරදක් නොමැති බව පවසයි. තවත් පිරිසක්, ස්ත්‍රීන්ව නොමැතිව පුරුෂයින්ව මුළුමනින්ම හෝ යම් අංගයක් පමණක් වැසිය යුතු යැයි පවසයි.

කෙසේ වෙතත් බොහහෝ සමාජිකයින් විශේෂයෙන්ම හොඳ ශිෂ්ඨාචාරයක් ඇත්තවුන් ස්ත්‍රී පුරුෂයින් අතර යම් නිතීන් තිබිය යුතු යැයි විශ්වාස කරති.එසේ නොමැති නම් මිනිසාගේ ජීවිතය විනාශයට ලක් වී මිනිසාට හා සතුන් අතර කිසි වෙනසක් නොතිබේ යැයි ඔවුන් පවසති.

## ස්ත්‍රී පැරුෂයින් අතර සම්බන්ධතාවයෙහි ඉස්ලාමයේ බැල්ම :

ඉස්ලාමයට අනුව ස්ත්‍රී පුරුෂයින්ගේ සම්බන්ධතාවය කාලය හා භූගෝලීය සාදකයන් අනුව මිනිසා විසින් පත්කරනු ලැබූ නීතිමයක් නැත.එය සෑම කාලයටම සෑම ස්ථානයකටම සරිලන පරිපූර්ණ නීතිමාලානකි.එය අල්ලාහ් ශුද්ධ කුරානෙහි පහල කෙර මුහම්ද් (සල්) තුමානන් එය මිනිසුන්ට උගන්වා ඇත.

මෙම සම්බන්ධතාවයෙහි ස්වභාවය පුරුෂයාගෙන් ස්ත්‍රියට ඇති වන ස්ථානයන් අනුව මාරු වේ මෙවාහි යම් විස්තර පහත සඳහන් වී ඇත.

## ස්ත්‍රීන් හා සම්බන්ද වන විට පුරුෂයා පහත චරිතයන්හි එක් චරිතයක් විය හැකිය :

1- පුරුෂයා ඇයගේ සැමියා වීම :

මොවුන් දෙදෙනා අතර ඇති බැඳිමට අල්ලාහ් පවසා ඇති තවත් වර්ණනාවක් නැත. ඔවුන් එකා අනෙකාගේ වස්ත්‍රය යැයි අල්ලාහ් පවසා ඇත.ඔබ ඔවුන්ට වශ්ත්‍රයක් හා ඔවුන් ඔබට වශ්ත්‍රයක් වෙත (සූරා:බකරහ් 187)

2- ඔහු ඇයගේ මහ්රම් පුද්ගලයකු වීම :

මහ්රම් යනු බැඳුන් ඥාතීත්වය නිසා සදාකාලීනව විවාහ කිරීමට අනුමැතිය නැත් පිරිසයි.පුරුෂ පාර්ෂවයෙන් ඔවුන් 13 දෙනෙකි.එනම් පියා, සීයා, පුතා, සහෝදරයා, බාප්පා,මාමා,සොහොයුරන්ගේ පුතුන් මුනුපුරා වැනි අය වේ.යම් ස්ත්‍රියක් මොවුන් ඉදිරියෙහි පැමිනෙන විට පරිපූර්ණ හිජාබය නොමැතිව පැමිණිය හැකිය.

3- ඔහු ඇයට අන්‍ය පුරුෂයකු වීම :

අන්‍ය පුරුෂයින් යනු මහ්රම් නොවන්නා පුද්ගලයන් වේ.අන්‍ය පුරුෂයින් සමඟ ස්ත්‍රීන් කටයුතු කිරීමේදී සැලකිය යුතු රීතීන් ඉස්ලාමය විසින් පත් කරනු ලැබී ඇත. එමගින් ඇයගේ ගෞවිරවය ආරක්ෂා කර ඇයට ඇති විය හැකි හිරිහැරයන්ගෙන් ඇය ආරකෂා විය හැකිය.මිනිසාට කුමක් යහපත යන්න ඔහුගේ මැවුම් කරුවා මනාව දන්නේය.

(සියල්ල මැවූ) මැව්ලිකරු එය නොදන්නේද? ඔහු සූක්‍ෂමව දන්නාය. සංවේදියාය. (සූරා:මුල්ක් 14).

### අන්‍ය පුරුෂයින් ඉදිරියේ ස්ත්‍රීන් හිජාබය පැළඳිය යුත්තේ මන්ද?

- ස්ත්‍රිය ඇයගේ ගෞවිරවය හා පතිවත රකිමින් සමාජයේ හා සඟරවන්හි ඇයගේ පණිවිඩය ප්‍රචාරය කිරීමට නම් ඇය හිජාබය පිළිපැදිය යුතුයි.
- සමාජයේ පවිත්‍රතාව ආරක්ෂා කිරීමට.
- ඇය සමඟ ගනුදෙනු කරන්නගේ බැල්ම ආරක්ෂා වී ඔහුගේ පතිවර රැකීමටද එය කාරණාවක් වේ.එබැවින් ඔහුට ඇය සමඟ සාමාන්‍ය පුරුෂයින් සමඟ ගනුදෙනු කරන්නාක් මෙන් ගනු දෙනු කළ හැකිය.මන්දයත් ඇය වින්දනයන් පරිපූර්ණ කිරීම සඳහා පමණක් පළවනු ලැබී නැත.

## ස්ත්‍රී පුරුෂයින් අතර වීමේදී සැළකිය යුතු ඇතැම් කරුනු :

1- බැල්ම හෙලීම

දෙපාර්ශයම තමන්ගේ බැල්ම අනෙකාගෙන් ආරක්ෂා කළ යුතු යැයි අල්ලාහ් අන කර ඇත.මන්දයත් පතිවත ආරක්ෂා කිරීම හා බැඳීම රැඳි ඇත්තේ බැල්ම ආරක්ෂා කිරීමෙහිය.මේ බව අල්ලාහ් ශුද්ධ කුරආන්හි මෙසේ පවසයි :

30 (ඕ මුහම්මද්!) විශ්වාසිකයින්ට ඔවුන්ගේ දසුන ඔවුන් පහත් කර ගන්නා මෙන්ද ඔවුන්ගේ රහස් අවයවය රැක ගන්නා මෙන්ද ඔබ පවසන්නී.මෙය ඔවුන්ට ඉතා පවිත්‍රය.නිශ්චය වශයෙන්ම අල්ලාහ් ඔවුන් කරන දෙය ගැන සංවේදියාය. 31.වද විශ්වාසවන්ත ස්ත්‍රීන්ට ඔවුන්ගේ දසුන ඔවුන් පහත් කර ගන්නා මෙන පවසන්න. (අන් නූර් 30-31).

2- විනීතව හා අලංකාර ගතිගුනෙන් හැසිරීම :

ව්‍යාපාර හා දැනුම් සම්බන්ද කරුනු බොහෝමයකදී ස්ත්‍රී පුරුසයින් දෙදෙනා එකට කටයුතු කිරීමට සිදු වේ.මේ සෑම අවස්ථාවකදීම ඔවුන් දෙදෙනා එකිනෙකා අතර විනීතව හා අසීලාචාරයන් ඇති විය හැකි සෑම කරුනකින් දුරුස් වී සිටිය යුතුයි.

3- හිජාබය පිළිපැදීම :

හිජාබය අනිවාර්‍ය වී ඇත්තේ ස්ත්‍රියට මිස පුරුෂයාට නොවේ.මන්දයත් ආකර්ෂණය ඇත්තේ ස්ත්‍රීන් තුලයි.සෑම කාළයකදීම අධිකව අපයෝජනයට ලක් වන්නේ ස්ත්‍රීන් ලෙස අපට දක්නනට හැක්කේ එනිසායි.

ඉස්ලාමයේ හිජාබයට තබා ඇති සීමාව නම් ස්ත්‍රිය අන්‍ය පුරුෂයින් ඉදිරියෙහි සිය සිරුරෙහි මුහුන හා අත්ලයන් හැර අන් සියලු අවයවයන් වසා ගැනීමයි. ශුද්ධ කුර්ආන්ය මෙසේ පවසයි :

පිටතට පෙනෙන කොටස හැර ඔවුන්ගේ රූව ඔවුන් හෙළි නොකරත්වා (සූරා:අන් නූර් 31).



"ඉතිහාසයේ ඉතාමත් ප්‍රසිද්ධ ස්ත්‍රිය වන මර්යම් මෑනිය පැළඳ සිටින වස්ත්‍රය ඉස්ලාමයේ පවසන හිජාබයට ඔබිත බව හිජාබයට විරුද්ධ වන්නන් බොහෝ දෙනෙකු නොදන්නා කරුනකි.



# ආහාර පානයන්හි ඉස්ලාමයේ නීති



# ඉස්ලාමය

ඉස්ලාමය හඳුනාගන්නට පැමිණෙන්නන් සඳහා අසන ප්‍රථම ප්‍රශ්නය නම්, ඉස්ලාමය ඌරා හා මද්‍යසාර තහනම් කර ඇත්තේ මන්ද යන ප්‍රශ්නයයි.

ඉස්ලාමය හඳුනාගන්නට පැමිණෙන්නන් සඳහා පැමිනෙන ප්‍රථම ප්‍රශ්නය නම්, ඉස්ලාමය ඌරා හා මද්‍යසාර තහනම් කර ඇත්තේ මන්ද යන ප්‍රශ්නයයි.

මෙහි පිළිතුර දැන ගැනීම පිණිස වැදගත් කරුණක් වටහා ගත යුතුයි :

ලොවේ ඇති සියළු දැයින් ප්‍රයෝජන ගැනීමට ශුද්ධ කුර්ආනය අවසර දී ඇත. පහත ශුද්ධ කුර්ආන් වැකිය මේ බව සඳහන් කරයි :

"පොළොවෙහි ඇති සියල්ල ඔබ වෙනුවෙන් මැවුවේ ඔහුමය.පසුව ඔහු අහස දෙසට යොමු වී එය අහස් හතක් ලෙසින් සැකසුවේය.තවද ඔහු සියලු දේ ගැන දන්නාය" (සූරාඃ බකරහ් 29).

එබැවින් පොළවෙහි ඇති සයළු ආහාර පාන අනුභව කිරීමද නීත්‍යානුකූලයි.කෙසේ වෙතත්, අපවිත්‍ර දෑ මිනිසාගේ සෞඛ්‍යයට අහිතකර දෑ වැනි දේවල් පමනක් ඉස්ලාමය තහනම් කර ඇත.මේ අතරින් මද්‍යසාර හා ඌරා තහනම ගැන දැනගැනීම ඔබට වැදගත් වන්නට හැකිය.

## ඌරාඃ

ඌරා පිළිබඳ දැනුමක් නොතිබුනු කාලසීමාවෙහිම එය තහනම් කළ පැහැදිලි වැකි ශුද්ධ කුර්ආනයේ පහළ විය.ඌරාව අනුභව කිරීම තහනම් වැකිය පරන ගිවිසුමෙහි පැහැදිලිවම සඳහන් වී ඇති බැවින් මෙය මුස්ලිම්වරුන්ට පමනක් තහන්ම වූ දෙයක් මෙන් ඇතැමුන් ප්‍රශ්න කිරීම පුදුමු සහගත දෙයකි.කිතුනුවන්ද ඌරා තහනම් යැයි අළුත් ගිවිසුමේ තහවුරු කර ඇති පසුවත් එය විකෘති කරනු ලැබී ඇත.

ආදම් තුමානන්ට ස්වර්ගයේ සෑම දෙයක්ම අනුභව කිරීමට අනුමැති දී එක් ගසකින් පමනක් අනුභව කිරීම තහනම් කර ඔහුව පරිකෂා කළ සේ අපටද බොහෝමයක් ආහාර අනුභව කිරීමට අනුමැතිය දී ඇතැම් ආහාර පමනක් තහනම් කර අපගේ විශ්වාසය හා අවනතභාවය පරික්ෂා කිරීමෙහි ඇති වරද තුමක්ද?

ආදම් තුමානන්ට ස්වර්ගයේ සෑම දෙයක්ම අනුභව කිරීමට අනුමැතිය දී එක් ගසකින් පමනක් අනුභව කිරීම තහනම් කර ඔහුව පරිකෂා කළ සේ අපටද බොහෝමයක් ආහාර අනුභව කිරීමට අනුමැතිය දී ඇතැම් ආහාර පමනක් තහනම් කර අපගේ විශ්වාසය හා අවනතභාවය පරික්ෂා කිරීමෙහි ඇති වරද තුමක්ද?



## මත් පැන් හා මද්‍යසාර :

මිනිසුන්ගේ ජීවතය හා සෞඛ්‍ය විනාශ කරන රෝගයට එරෙහිව සටන් වැදීම හා ජනයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම පිණිස නීති හා ක්‍රමවේද තැබීමෙහි සෑම ආන්ඩුවක්ම කැප වෙති.මන්දයත් එක් පුද්ගලයකුගේ වැරදීම එම සමාජයේ අයහමගට කාරණාවක් වනු ඇත.


ජාත්‍යන්තර සෞඛයය ආරක්ෂක අංශයේ ඔක්ස්ෆෝඩ් විශ්ව විද්‍යාලයෙහි හෙලි කර එක් සඟරාවක මෙසේ සඳහන් වී ඇත.

වසරකට මත් ද්‍රව්‍යවලට ගොදුරු වූවන්ගේ ගණන ඒඩ්ස්, මැලේරියා හා ක්ෂය යනාදී රෝගයන්ට ගොදුරු වූවන්ගේ ගණනට වඩා අධිකයි.එසේම ත්‍රස්තවාදය හා අනෙකුත් යුද්ධයට ගොදුරු වන්නන්ගේ ගණනට වඩා තුන් ගුනයකින් අධිකයි.ලෝක සෞඛ්‍යය සංවිධානයන් මගින් තහවුරු වූ ඇතැම් අධ්‍යනයන් පහත දැක්වේ.



මත්ද්‍රව්‍යට ඇබ්බැහි වීම නිසා වාර්ෂිකව මිලියන දෙකහමාරකටත් අධික දෙනෙකු මරනයට පත් වේ.එයින් වයස 15 හා 29 අතර වූ තරුනයින්ගේ ගණන 320000 වේ.





එක් විශ්ව විද්‍යාලයක මත් පැන් වලට ඇබ්බැහි වූ ශිෂ්‍යයන් අන් ශිෂ්‍යයන්ට පහර දී ඇති බව ඇමරිකාවේ එක් සවේශණයක හෙලි වී ඇත.








2001 වන වසරෙහි එස්කොකියාවේ ඇති වූ ප්‍රචන්ඩ ක්‍රියාවෙන් 80% සිදු වී ඇත්තේ මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන් විසින්ය.




ගෝලීය වශයෙන් මත්පැන් බාවිතා කරන්නන් 25% මිනිමැරුම් වලට සම්බන්ධයි.



සෑම ඉහළ සෞඛ්‍යය සංවිධානයක දත්ත සහ වාර්තා, මත්පැන් මගින් ඇතිවන දෛනික බේදවාචක අඩු කිරීම හෝ වැළැක්වීම සඳහා සියළුම රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටියි.

## බ්‍රිතාන්‍යයේ එකම දිනම :

- මත්පැන් හා සම්බන්ධව ප්‍රචණ්ඩකාරී ක්‍රියා මිලියනයක පමණ සිදුවී ඇති අතර, සාමාන්‍යයෙන් ප්‍රචණ්ඩකාරී අපරාධවලින් අඩකට ආසන්න සංඛ්‍යයාවක් මත්පැන් පානය කරන අයගෙන් යැයි සැලකේ.
- මත්පැන් භාවිතය නිසා ඇති වන හදිසි අනතුරු මිලියන 7ක් පමණ වන අතර ඒවා සඳහා වාර්ෂිකව ඩොලර් මිලියන 650ක් පමන වියදම් වේ.
- වාර්ෂිකව මත්පැන් භාවිතයෙන් ඇති වන ප්‍රචණ්ඩ සම්බන්ධව ගෙවන ලද දඩ මුදල්හි ප්‍රමාණය පවුම් බිලියන 8ක් හා 13 අතර වේ.





### මද්‍යසාර හා මත් ද්‍රව්‍ය සමඟ ඉස්ලාමය මතය කෙසේද?

මත් පැන් විසින් පෞද්ගලික හා සමාජිකතව ඇතිවන බලපෑම් හෙළි කිරීම පිණිස ඉස්ලාමයේ ලෝක සෞඛ්‍යය සංවිධානයන්ගේ වාර්තා එන තුරු බලා සිටියේ නැත.මන්දයත් මිනිසාට කුමක් යහපද යන්නා මැවුම් කරුවා මනාව දන්නේය.

ඉස්ලාමය අරාබි වරුන්ට පැමිණෙන විට ඔවුන්ගේ වින්දනයන්ගෙන් ප්‍රධානතම දෑ වූයේ මත් පැන්ය.ඔවුන් එකිනෙකා උඩඟු පාන්නේද මත්පැත් මගින්ය.මත් පැන් ලබා ගැනීම පිණිස ඔවුන් තමන් සතු සියළු වසතූන් පවා වියදම් කිරීමට සූදානම්ව සිටියෝය.එබැවින් මෙය එකවර තහනම් කිරීම ප්‍රායෝගික නොවන බව අල්ලාහ් දන්නේය.

එබැවින් ඉස්ලාමය මෙය ඔවුන්ට තහනම් කිරීම විශයේ ඉතාමත් සූක්ෂම ලෙස කටයුතු කර ඇත.ප්‍රථමයෙන්, මත්පැන් භාවිතයෙහි යම් ප්‍රයෝජනයක් තිබෙනවා මෙන්ම එමගින් ඇතිවන පව ප්‍රබල යැයි පවසා එය එතරම් යහපත් නැත යන කරුණ ඔවුන්ගේ සිත්හි ඇති කළේය.මෙය ශුද්ධ කුර්ආන්හි මෙසේ සඳහන් වී ඇත : (ඕ මුහම්මද්!) මත්පැන් හා සූදුව ගැන ඔවුන් ඔබගෙන් අසති එම දෙකෙහිම ලොකු පවක් හා මිනිසාට ඇතැම් ප්‍රයෝජනද ඇති (නමුත්) එදෙකිහම පව එහි ප්‍රයෝජනයට වඩා අති දැවැන්තයි.(සූරා: බකරහ් 219).

යම් කලක පසු සලාත් කරන අවස්ථාවන්හි පමණක් මෙය තහනම් යැයි පවසා අවසානයේ දී මත් බාවිතය මුළුමනින්ම තහනම් කර මත් බාවිතය ෂයිතාන්ගේ ක්‍රියාව යැයි අල්ලාහ් පැහැදිලි කළේය.එම වැකියෙහි අවසානයෙහි අල්ලාහ් 'ඔබලා මේවා නැවැත්විය නොයුතුද' යැයි ප්‍රශ්න කර ඇත.එවිට මිනිසුන් 'අප නැවැත්වුයෙමු.අප නැවැත්වුයෙමු' යැයි පැවසූහ.අල්ලාහ්ගේ මෙම අණට ඔවුන් කීකරු වූ බැවින් මදීනාවේ පාරෙහි මත් පැන් හැලී තිබෙනු දක්නට තිබුනි.



# පාපය හා පාපොච්චාරනය




# පාපයන්

පාපයන් හා පාපොච්චාරනය යන දෙකම සෑම ධර්මයකටම තිබෙන වැදගත් දර්ශනයකි.එක් එක් ධර්මයේ පතිපත්තීන් අනුව ඒවා වෙනස් වේ.

එනමුත් ඉස්ලාමය පාපය හා පාපොච්චාරනය සමඟ කටයුතු කරන විදිය ඉතා වෙනස්ය.පාපය යනු මිනිසාගේ ස්වභාවයෙහි ඇති දෙයක් හෙයින් යහපත පමනක් කරන මලාඉකාවරෙයකු මෙන් මිනිස දෙස ඉස්ලාමය නොබලයි.ආදම්ගේ සෑම පුත්‍රයකුම වැරදි කරන්නෙකුය යැයි ඉස්ලාමය පවසන නමුත් එම පාපය කිරීමට තමා පෙළඹී තිබීමෙහි වරද තමන් භාර ගත යුතුය එබැවින් පාපය හා පාපොච්චාරනය විෂයයෙහි ඉස්ලාමිය සංකල්පය මෙසේය:

- පාපය හා පාපොච්චාරනය යන කරුනු දෙකම පුද්ගලිකයි යන්න කිසි මත භේදයක් නොමැති කරුනකි.යම් පාපයක වගකීම භාරගත් යුත්තේ තමන් වනවා සේම එය සඳහා සමාව අයැදිය යුත්තේද තමන්මයි. කෙනෙකු ඉපදෙන මොහොතෙහි කිසි පාපයක් නොමැතිව පවිත්‍රව ඉපෙදයි.උදාහරනයක් වශයෙන් ආදම්ගෙන් වැරැද්දක් සිදු වූ විට එහි පාපොච්චාරනය සිදු වූයේ ඔහු විසින්මයි.මිනිසාගේ ආරම්භකයා ඔහුය වැනි හේතු දක්වා ඔහුට පාපොච්චාරනයක් අවශ්‍ය නැත යැයි ඉස්ලාම් පැවසුවේ නැත එහි පාපොච්චාරනය ඔහු විසින්ම කරනු ලැබුනේය.සෑම දූතයෙකුම පවසා ඇත්තේද ශුද්ධ කුරආනය අපට දන්වා ඇත්තේද මෙයයි.(සුරා අන් න්ජ්ම් 36-41)
- පාපොච්චාරනය කිරීම යනු අල්ලාහ් වෙත සමීප වීම පිණිස කරනු ලබන නැමදීම් අතුරින් එක් ඉමහත් නැමදුමකි.මෙයටද කිසිදු ස්ථානයක් හෝ යම් සුවිශේෂී පුද්ගලයකුගේ සම්ප්‍රාප්තය අවශ්‍ය වන්නේ නැත.මෙයද ගැත්තා හා අල්ලාහ් අතරවූ එක්තරා නැමදුමකි. ශුද්ධ කුර්ආනයෙහි සදහන් වී ඇති අල්ලාහ්ගේ ඇතැම් හේතුනාමයන්හි අර්ථය වන්නේ පාපොච්චාරනය පිළිග න්නා,දයාබරයා,පාපය සමා කරන්නා යනුවෙන්ය.එමෙන්ම ස්වර්ගයට පිවිසෙන බියබැතියන්ගේ ගුණාංග යන් පවසන විට ශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:



> ඉස්ලාමයේ දසුනෙහි පාපොච්චාරනයට කළ යුත්තේ ප්‍රථමයන් පාපෙයෙන් මිදී තමා කළ පාපය ගැන පසුතැවිලි වී එම පව නැවතත් නොකරනවා යන ස්ථිර චේතනාවකින් යුතුවය. එමෙන්ම තමා කළ පාපය අන් අයෙකුට අසාධාරණයක් හෝ අලාභයක් ඇති කර තිබුනොත් එවිට ඔවුන්ට සාධාරයක් ඉටු කිරීම අනිවාර්ය වන්නේය.

‘තවද ඔවුන් කෙබන්දන්ද යත්, යම් නින්ද සහගත ක්‍රියාවක් ඔවුන් කළ විටද නැතිනම් (යම් පාපයක් කර) තමුන්ට තමන්ම අපරාධ කරගත් විටද (වහා පසුතැවිලි වී) අල්ලාහ් ව සිහි කරති.තවද සිය පාපයන්ට සමාවද යදිති. අල්ලාහ් හැර පාපයන් සමා කරන්නා (අන්) කවරෙකුද? ඔවුන් කළ දේ(හි වරද) දනිමින්ම එහි (සැමද) නොරඳෙති’ (සුරා ආලු ඉම්රාන් 135).

මෙසේ පාපොච්චාරනය කිරීමෙන් පසුව නැවතත් එම පව කිරීම මගින් පෙර කළ පාපොච්චාරනය අවලංගු වී එම පව මොහුට ලියවෙන්නේ නැත.එනමුත් මෙම පව අළුත් පවක් වන අතර ඒ සඳහා පාපොච්චාරනයක් අවශ්‍යය වේ කෙසේ වෙතත් පාපොච්චාරනය මගින් සමාව ලැබිය හැකිය යන දිරියෙන් නැවත නැවත පව් කිරීම නුසුදුසුයි.

මිනිසෙකුගේ ස්වභාවය පවට නැඹුරු වුවද පව ගැන අවංකව පසුතැවිලි වූ විගස ඔහු අල්ලාහ්ට සමීප වනු ඇත.

එබැවින් මිනිසාට අවස්ථාව ලැබෙන සෑම අවස්ථාවකදීම අල්ලාහ් වෙත සමීප වී ඔහුගෙන් සමාව ඇයදීමට මැලි නොවිය යුතුය.

සිල්වතුන් අතර හා පාපතරයින් අතර වෙනස මෙය යැයි ශුද්ධ කුර්ආනය පවසයි:

නිශ්චය වශයෙන්ම (අල්ලාහ්ට) බියබැතිවන එවැන්නන්ව සාතාන්ගේ (වැරදි) සිතුවිල්ලක් ස්පර්ශ කළ විට, ඔවුන් (අල්ලාහ් ව) මෙනෙහි කරති. එසැනින් ඔවුන් (වැරදි සිතුවිලිවලින් මිදී) අවදි වන්නෝය.202. තවද (සාතාන්වරුන්ගේ) සහෝදරයෝ (වන දුෂ්ටයින්) ඔවුන්ව මංවැරදවීමෙහි ඇදගෙන යති. පසුව (ඔවුන්ගේ එම දුෂ්ඨ කියාවෙහි) කිසිදු අඩුවක් නොකරති. (සුරා අල් අඃරාෆ් 201-202)

> කෙනකු ඉපෙදන මොහොතෙහි කිසි පාපයක් නොමැතිව පිරිසිදුවයි ඉපෙදන්නේ. පෙරටු වූ කිසිදු පවක් මෙම ලොවේ ජීවිතයෙහි මොහු උසුලන්නේ නැත.





# ධර්මය හා බුද්ධිය



# ඉස්ලාම්

ඉස්ලාම් ධර්මය හා එහි ජීවන රටාව බුද්ධියට පටහැනි වන බව ඇතැමුන් සිතති. මන්දයත් ඔවුන්ගේ දසුන අනුව ධර්මයක් යනු මිත්‍යා මත ගොඩ නැගුනු විශ්වාසයකි. අත්දැකීම් හා චින්තනයන් මාර්ගයෙන් නිසි ජීවන පරිපාලනයක් ඇති කළ හැක්කේ මිනිසාගේ බුද්ධියෙන් හා දර්ශනය මගින් පමනි. ඇතැම් අවස්ථාවන්හි ධර්ම විෂයයන් මිනිසාගේ වැටහීමට ගෝචර වන අවස්ථාද තිබෙන බැවින් මෙම මතය වැරදි මතයක් යැයි එකහෙලා පැවසිය නොහැකිය.

## ඉස්ලාම්

ඉස්ලාම් ධර්මය හා එහි ජීවන රටාව බුද්ධියට පටහැනි වන බව ඇතැමුන් සිතති. මන්දයත් ඔවුන්ගේ දසුන අනුව ධර්මයක් යනු මිත්‍යා මත ගොඩ නැගුනු විශ්වාසයකි. අත්දැකීම් හා චින්තනයන් මාර්ගයෙන් නිසි ජීවන පරිපාලනයක් ඇති කළ හැක්කේ මිනිසාගේ බුද්ධියෙන් හා දර්ශනය මගින් පමනී ඇතැම් අවස්ථාවන්හි ධර්ම විෂයයන් මිනිසාගේ වැටහීමට ගෝචර වන අවස්ථාද තිබෙන බැවින් මෙම මතය වැරදි මතයක් යැයි එකහෙලා පැවසිය නොහැකිය.



එමෙන්ම ඇතැම් ධර්ම පුස්ථකයන්හි තිබෙන මිත්‍යා ඉගැන්වීම් හා ප්‍රතිපත්තීන් දෙස බැලූ කල්හි ඒවා ලොවෙහි පැවැත්මට සහමුලින්ම පටහැනි වේ

මෙම මතයෙහි ඇති වැරද්ද කුමක්දයත් ධර්මයන් අතර ඇති වෙනස් නොදැන ඒ සියල්ල එකම කෝණයෙන් බැලීමයි.

මිනිස් බුදධියට ඉස්ලාම් ධර්මය අන් කිසිවකට නොදෙන තැනත් දී ඇති මෙය ඉස්ලාමයේ මූලික පුස්තකය වන ශුද්ධ කුර්ආනය වෙත යොමු වන්නා නියතවශයෙන්ම දැන ගනු ඇත.මෙය දැක ගැනීම සඳහා ඔහු ශුද්ධ කුර්ආනය වැඩි ගැඹුරින් හැදෑරිය යුතුද නොවේ මන්දයත් ශුද්ධ කුර්ආන්හි බොහෝ ස්ථානයන්වල ඔබ වටහා නොගන්නේද? අවබෝධ නොකරන්නේද? කල්පනා නොකරන්නේද? යැයි බුද්ධිය භාවිතා කිරීම දිරිගන්වන වාක්‍ය රැසක්ම ඇත.

> මෙය දැක ගැනීම සඳහා ඔහු ශුද්ධ කුර්ආනය වැඩි ගැඹුරින් හැදෑරිය යුතුද නොවේ.

බුද්ධියට භාවිතා කළ යුතු බව ශුද්ධ කුර්ආනය අණ කර ඇති ස්ථාන ඇතැමක් පහත දැක්වේ:

**1**

බුද්ධිමත් විවෘත මනසැති හා අහංකාරකම, මුරන්ඩුකම, බිය හා අනුවනය වැනි දැයින් නිදහස් වූවන්ට අල්ලාහ් මෙසේ ඇරයුම් කරයි:

'නැත්නම් කිසිදු දෙයක් නොමැතිව ඔවුන් මවනු ලැබුවෝද? නැත්නම් මවන්නෝ ඔවුන්ද?

නැත්නම් අහස් හා පොළොව ඔවුන් මැවුවෝද? නැති ඔවුන් ස්ථිර විශ්වාස නොකරන්නෝමය' (සූරා අත් තූර් 35-36)

**2**

කිසිදු සාධකයක් නොමැතිව අල්ලාහ්ගේ වදන් ප්‍රතික්ෂේප කරන්නන්ට ශුද්ධ කර්ආනය මෙසේ අභියෝග කරයි:

'ඔබ සත්‍යවාදීහු නම් ඔබගේ සාධක ගෙනෙනු' යයි ඔබ (ඔවුන්ට) කියනු. (සූරා අල් බකරා 111)

**3**

අතීතයේ සිදුවූ දෑ තුලින් පාඩම් ගැනීම පිණිස ඒවා සොයා නොබලන්නවුන් ගැන ශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:

'පොළොවෙහි ඔවුන් ගමන් කර (බලා) නැත්තෝද? (එසේ කර තිබුනහොත් සත්‍යය) වටහා ගන්නා හදවත් ඔවුන්ට එමගින් ඇති වනු ඇත.නැත්නම් (සත්‍යය) ශ්‍රවනය කරන සවන් ඔවුන්ට එමගින් ඇති වනු ඇති නිශ්චය වශයෙන්ම (ඔවුන්ගේ) දසුන අන්ධ වී නැත.එනමුත් අන්ධ වී ඇත්තේ හෘදයෙහි ඇති සිත්ය' (සූරා අල් හජ් 46)

**4**

තම චින්තනය භාවතා නොකරන්නන්ට ශුද්ධ කුර්ආනය අවවාද කරයි.හුදෙක් අපගේ බුද්ධිය නිෂ්ඵලව භාවිතා කිරීම ප්‍රමාණවත් යැයි ඉස්ලාමය නොපවසයි.මන්දයත් ඇතැම් අවස්ථාවන්හි යම් දෙයකට ප්‍රිය කිරීම හෝ වෛර කිරීම යන හේතුවෙන් එය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීම කෙරෙහි මිනිසාගේ සිත නැඹුරු විය හැකි බැවින් සිතෙහි ඇති අගුලු ඉවත් කර සත්‍ය වටහා ගත යුතු යැයි ඉස්ලාමය පවසයි.



"අල්ලාහ් මිනිසුන්ට පත් කර ඇති ඔහුගේ ධර්මය මැවීම් සමඟ පටහැනි නොවේ යන්න මුස්ලිමෙකුගේ විශ්වාසයයි. එසේ නම් ප්‍රශ්නයට හා බුද්ධිය ක්‍රියා කිරීමට බිය විය යුත්තේ මන්ද?

සත්‍යය වටහා ගැනීමට බාධාවක් විය හැකි කරුණු යැයි ශුද්ධ කුර්ආනය අනතුරු අඟවන කරුනු:

### මුතුන් මිත්තන් පිළිපැදීම :

වැරදි හා කිසි සාධකයක් රහිතව සිය මුතුන් මිත්තන් පිළිපැදීම තුලින් සත්‍යය වටහා ගැන යහමගට යොමු වීම අපහසු වනු ඇත.'අප පුරුදු වී ඇත්තේ මෙයටයි, අප උපන් දා සිට කරමින් සිටින්නේ මෙය' යැයි පවසා මොවුන්ගේ නොමග යාම මොවුන් සාධාරණීකරණය කිරීමට තැත් කරති.මෙවැන්නන් ගැන ශුද්ධ කුර්ආනය මෙසේ පවසයි:

'අල්ලාහ් පහල කළ දේ පිළි පදින්න' යැයි ඔවුන්ට කියනු ලැබුවහොත් 'නැත! අපගේ පියවරුන්ගෙන් කුමක් අප දැන ගත්තෙමුද එයම අප පිළිපදිමු' යැයි කියති.ඔවුන්ගේ පියවරුන් කිසි දෙයක් නොදැන යහ මග නොලැබූවන් ලෙස සිටියද (එවිටත් මොවුන් අන්ධව එලෙසින්ම අනුගමනය කරතිද? (සුරා අල් බකරා 170)

### මුරන්ඩුකම හා උඩඟුකම.

ඇතැම් අවස්ථාවන්හි තමන්ට සත්‍යය වැටහුනද මුරන්ඩුකම හා උඩඟු කම නිසා එය පිළිගැනීමට කෙනෙකු සූදානම් වන්නේ නැත.ඊර්ෂියාව, සිය තනතුර ආරක්ෂා කර ගැනීම හා තමන්ට ලැබෙන වාසි රැක ගැනීමටද ඇතැමුන් සත්‍යයට නැඹුරු නොවෙති.මේ සම්බන්ධව අල්ලාහ් ශුද්ධ කුර්ආනයේ මෙසේ පවසයි:

'ඔවුන්ගේ හදවත් එය (සත්‍යයක් යැයි) ස්ථිරව දැන සිටි විටම අහංකාරය නිසා අයුක්තිසහගත ලෙසින් එය ඔවුන් ප්‍රතික්ෂේප කළෝය.එහෙයින් (මෙම) කලහකාරයන්ගේ අවසානය කෙසේ වී දැයි (ඕ මුහම්මද්!) ඔබ බලන්න.(සුරා අන් නම්ල් 14)

### වින්දනයන්හි ගැලීම.

තවත් ඇතැමුන්වට ඔවුන්ගේ සැප වින්දනයට සත්‍යය පටහැනි වීම නිසා එය පිළිගැනීමෙන් තමන්ගේ වින්දනයන්ට බාධා වනු ඇති බැවින් එය පිළිගැනීමට සූදානම් වන්නේ නැත.මෙවැන්නෙක් පිළිබඳ ශුද්ධ කුරආනය මෙසේ පවසයි:

(ඕ මුහම්මද්!) අප කවුරුන්ට අපගේ සාධක දී තිබුනෙමුද ඔහුගේ පුවත (යුදෙව්වන් වන) ඔවුන්ට පාරායණය කර පෙන්වන්න.පසුව ඔහු එයින් තමන් ගලවා ගත්තේය.එහෙයින් සාතාන් ඔහු පසු පස ගියේය.එහෙයින් මගවරදවා ගත්තවුන්ගෙන් (කෙනෙකු බවට ඔහු පත්) විය.176. තවද අප සිතා තිබුනහොත් එ(ම සාධක) මගින් ඔහුව උසස් කර තිබෙන්නෙමු එනමුත් ඔහු පොළොවට නැඹුරු වී සිය සිතැගි(වලට වහල් වී එය) අනුගමනය කළේය.එහෙයින් ඔහුගේ නිදසුන එක් සුනඛයෙකුගේ නිදසුන මෙන් වේ ඔබ එය එළවා දැමුවද එය දිව පිටත දමා ගන්නේයි ඔබ එය (නොසලකා) හැර දැමුවද දිව පිටත දමා ගන්නේය.අපගේ වැකි අසත්‍ය කරන සමූහයාට නිදසුන මෙයයි.එහෙයින් ඔවුන් මෙනෙහි කර වටහා ගනු පිණිස (ඕ මුහම්මද්! ඔවුන්ට) ඉතිහාසය විස්තර කරනු.(සුරා අල් අඃරාෆ් 175-176)

කිසිම බලපෑමක් හෝ කොන්දේසියක් සම්බන්ධ නොකර නිදහසේ මිනිසා සිය බුද්ධිය භාවිතා කර විශ්වයේ ඇති මැවීම් හා අනෙකුත් සිදුවීම් දෙස බලා ඉගැනුමක් ගතයුතු යැයි ඉස්ලාමය පවසයි.

තමන් තුලම ප්‍රශ්න කරගැනීමට බොහෝදෙනෙකු බිය වන්නෝය.මන්දයත් ඒවා තමන්ගේ අවශ්‍යතාවයන්ට පටහැනි විය හැකි හෙයිනි.කෙසේ වෙතත් ඉස්ලාම් ධර්මය මිනිසාගේ මැවුම්කරු වන අල්ලාහ් විසින් පහල කරන ලද්දකි.මිනිසාගේ අව්‍යශතා කුමක්ද යන්න අල්ලාහ් මනාව දන්නේයි එබැවින් මිනිසාගේ පැවැත්මට පටහැනි වන දෑ ඉස්ලාමයෙහි තිබිය නොහැකිය. ඇතැම් කරුනු එසේ බාහිරව පෙනුනද එහි අවසාන ප්‍රථිඵලය මිනිසාට යහපතක් වනු ඇත යන්නෙහි.කිසිදු සැකයක් නැතිව පහත ශුද්ධ කුර්ආන් වැකියෙහි ගම්‍යාර්ථය මෙයයි: 'මැවීම හා අණ කිරීම ඔහුටම හිමිය යැයි දැන ගන්නී විශ්වයේ හිමි වන අල්ලාහ් තේජස ඇත්තාය.(සුරා අල් අඃරාෆ් 54)


ඉස්ලාමය සාමයේ ධර්මයි



## මාධ්‍ය

මාධ්‍ය ජාලවල ඉස්ලාමයට විරුද්ධව බොහෝ දේ පැතිරී ඇති බැවින් සාමයට ඉස්ලාමයෙහි සුවිශේෂී ස්ථානයක් තිබේ යැයි දැනගත් විට ඇතැමුන් පුදුමයට පත් වන්නෝය.සාමය (සලාම්) යනු මුස්ලිම්වරයෙකු දිනකට කිහිප වතාවක්ම හඬ නගා කියන්නේය.

# සාමය

සාමය (සලාම්) යනු අල්ලාහ්ගේ අලංකාර නාමයන් අතුරින් එක් නාමයකි.සාමයේ නිවස යන්න ස්වර්ග යේ එක් නමක්ද වේ. මුස්ලිම්වරුන්ගේ ආචාරය සලාම් හෙවත් ශාන්තිය හා සාමය යන වදනින් ආරම්භ වේ. මුස්ලිම්වරැන්ගේ පන්ච කාල නැමදුම අවසන් වන්නේ 'සාමය ඇති වේවා' යන වචනය දෙවරක් ඉසිරීමෙන්ය. එපමණක් නොව ඉස්ලාම් යන වචනෙහි අර්ථය පවා සාමය ඇති කිරීම යන්නයි.



ඉස්ලාමය යනු සාමය ඇති කරන ධර්මයක් මෙන්ම අන් ජීවීන්ට කිසි හිරිහැරයක් වන සේ ජීවත් නොවී සියල්ලන්ගේම අයිතියට ගරු කරන ධර්මයක් යන්න පැහැදිලි වන නබි වදනක් පහත දැක්වේ:



'නියත වශයෙන්ම පූසෙකු මැරෙන තෙක් ගැට ගැසූ හේතුවෙන් එක් ස්ත්‍රියක් නිරයට ඇතුළු වුවාය.ඇය එම පූසාට ආහාර නොදී ඌ පොළොවේ ආහාර සොයා ගැනීමටද ඌව අත නොහැරියාය'(මුස්ලිම් 2242).

එසේම බල්ලෙකුට වතුර දීමෙන් එක් ස්ත්‍රියක් ස්වර්ගයට පිවිසෙ' යැයි නබි තුමානන් පවසා ඇත.(අල් බුකාරි 3280).

> යම් දෙයක් පිළිබඳ කථාකිරීමේදී එහි මූලාශ්‍රයෙහි සඳහන් වී ඇති දැයින්ම ඒ පිළිබද දැනගැන්නට ක්‍රියා කරන්නන් ඉතා අල්පය.

මිනිසාගේ චින්තනය හෝ ධර්මය කුමක් වුවද ඔවුන්ගේ අයිතිය ගරු කිරීම හා සහජීවනය විෂයයෙහි ඉස්ලාමය උදාහරන ගණනාවක්ම පෙන්වා ඇත.(අබූ දාවූද් 3052)

> මුස්ලිම් නොවන්නෙකුට අසාධාරණයක් හෝ හිරිහැර කරන්නාට එරෙහිව හා කෙනෙකුගේ හැකියාවට වඩා වැඩියෙන් වැඩ පවරන මුස්ලිමෙකුට විරුද්ධව කියාමත් දිනයෙහි තමන් පෙනී සිටින බව මුහම්මද් (සල්) තුමානන් පවසා ඇත.

කෙසේ වෙතත් ඉස්ලාමය සාමය කරා මිනිසාව කැඳවන්නා සේම අයුක්තියක් සාධාරණව සිදු වී ඇත්තන්ගේ අයිතිය ඉටු කරන විෂයයෙහි අපරාධකරුවන් සමග කටයුතු කිරීමේදී ඉතා දැඩි ලෙස ක්‍රියා කරයි.ශාන්තිය හා සාමය යන වචනවල මුවාවෙන් සොරුන්ට හා මංකොල්ලකරුවන්ට අවස්ථා දී අසාධාරණ සිදුවූවන්නට ඉඩ දීමක් ඉස්ලාමයේ නැත.

අද සෑම කෙනෙකුම සිය මතය ප්‍රචාරය කිරීමට භාවිතා කරන්නේ මාධ්‍යයයි.එබැවින් සත්‍යයන් බොහෝමයක් අසත්‍යයෙන් වසනු ලැබී පවතී.දර්ශණයක් දෙස බැලීමට තිබෙන්නේ එක කෝණයක් පමණක් නොවේ එමෙන්ම සෑම වෘතාන්තයක් සඳහාම විවිධ වාර්ථා ඇත.එනමුත් යම් දෙයක් පිළිබඳ කථාකිරීමේදී එහි මූලාශ්‍රයෙහි සඳහන් වී ඇති දැයින්ම ඒ පිළිබද දැනගන්නට ක්‍රියා කරන්නන් ඉතා අල්පයි.

කල්පනා කිරීම පිණිස ඇතැම් සත්‍ය කරුනු



## ලොවෙහි වේගයෙන් පැතිරෙන ධර්මය ඉස්ලාමයයි

ඉස්ලාමයට විරුද්ධව මාධ්‍යවල කෙතරම් අපවාද පැතිරුනද මුස්ලිම්වරුන් බොහෝ අතින් දුර්වලව සිටියද ඇමරිකාව යුරෝපය අප්‍රිකාව හා ආසියාව යනාදී ලොවේ සෑම කලාපයකම ඉස්ලාමය සීඝ්‍රයෙන් පැතිරී යනු අපට දැක ගත හැකිය ඉස්ලාමය ගැන මාධ්‍යවල පවසන දෑ ඇත්තද? ඉස්ලාමය බල කිරීමෙන් පැතිරුන ධර්මයක්ද?

මුස්ලිම්වරුන් අන් අයගේ සංස්කෘතියන් හා ඔවුන්ගේ කැමැත්ත ගෞරවය කර ඔවුන්ගේ අයිතියට බාදා නොකිරීම යනාදී කරුනු අන් අය ඉස්ලාමය කෙරෙහි නැඹුරු වීමට තුඩු දී ඇත මෙය මුස්ලිම්වරුන්ට අල්ලාහ් ආඥා වේ එයට වුන් ඇවනත වෙති එපමණී මේ ගැන අල්ලාහ් ශුද්ධ කුර්ආනයේ මෙසේ පවසයි:

(ඉස්ලාම්) ධර්මයේ කිසිදු බලකිරීමක් නැත (ඇයිද යත්) දුර්මාර්ගයෙන් ඍජු මඟ නිශ්චය වශයෙන්ම පැහැදිලිය (සුරා අල් බකරා 256)

## මිනිසුන් ඉස්ලාමය පිළිගත යුතු යැයි ඉස්ලාමය බල කරයිද?


සිය මතය තීරණය කර එය ස්ථාපිත කර තමන්ගේ යහපත තහවුරු කිරීමේ අයිතිය නිදහස හා හැකියාව මිනිසාට ඇත.මේ සඳහා වන උදාහරන ඉතිහාසයේ බොහෝ ඇත.

නිදසුනක් වශයෙන්, පෙර විසුවන් නව රටවල් සොයා නොයෙක් පෙදෙස්වලට සංක්‍රමණය කළ විට ඔවුන්ට නිසි පිළිගැනීමක් තිබුනේ නැත.මෙය සම්බන්ධව දැකපු බැර්ට්ලොමේඩ් නම් වියතා උගතා 'ඔවුන්ව මිනිසුන් යැයි බලනු ලැබුවේම නැත. ඇත්ත වශයෙන්ම ඔවුන් සතුන්ටත් වඩා පහත් ලෙස සළකණු ලැබුවෝය'

A Brief Account of the Destruction of the Indies by Bartolome de las Casas (Jan 1, 2009)

**අලුත් රටවල් පාලනය කරන විට මුස්ලිම්වරුන් එහි කළේ කුමක්ද?**

## ඇන්දලූසියාව මුස්ලිම් ජාතිකයින් සියවස් 8ක් පාලනය කළෝය.



මුස්ලිම් ජාතිකයින් ඇන්දලූසියාව 711 වසර සිට 1492 වන වසර තෙක් පාලනය කළෝයි ලොවෙහි ශිෂ්ඨාචාරයන්ට එක් කේන්ද්‍රස්ථානයක්ව එම රට පැවතියේ මුස්ලිම්වරුන් එය පාලනය කළ යුගයේය.ඉස්ලාමය වැළඳ ගන්නා බව කිසි කිතුනුවෙකුට බල කරනු ලැබූ බවට සාධක නොමැත.එපමණක් නොව, ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ඔවුන්ගේ කේන්ද්‍රස්ථානයන් හා අයිතීන් ආරක්ෂා කරන ලදී.ඉස්ලාමයේ අවතීර්ණයට පෙර යුදෙව්වන්ට සිදු වූ අසාධාරණයන් පවා තුරන් කරනු ලැබුවෙ මුස්ලිම්වරුන් විසින්ය.මේ සියල්ල ඉතිහාසය සාක්ෂි දරයි.

මෙපමණ මුස්ලිම් පාලනය සුහදව තිබුනද මෙම පාලනය අවසන් වීමෙන් පසු එම රටෙහි මුස්ලිම් ජාතිකයින්ගේ සෑම කරුණක්ම තහනම් කරනු ලදුව කවුරුන් හෝ රහසිගතව හෝ ඉස්ලාමය පිළිපදිනවා දැයි සොයා බලා දඬුවම් පමුණුවන්නට පවා කිතුනුවන් ක්‍රියා කළහ.මේ සඳහා රහසිගත කුමන්ත්‍රන පවා සිදු විය.

පසුව මුස්ලිම්වරුන්ව එරටින් පිටමං කරන ලදී.ඇන්දලූසියාවෙන් මුස්ලිම්වරුන් සමග යුදෙව්වන්ද පිටකරනු ලැබීය.මුස්ලිම්වරුන් වෙනත් ඉස්ලාමීය රටවල් කරා සංක්‍රමණය වූ විට ඔවුන් සමග පිටවූ යුදෙව්වන්ට මහජීවනයෙන් යුතුව වාසය කිරීමේ පසුබිම එම මුස්ලිම් රටවලද තිබුනි.

## මුස්ලිම්වරුන් මිස්රය වසර 1400ට වැඩි කාලයක් පාලනය කරමින් සිටියෝය.එනමුත් ඔවුන් කොප්ටික් අරාබින්ට (කිතුනුවන්ව සිටින අරාබින්) පූර්ණ ආරක්ෂාව සැලසූහ.




අමර් බින් ආස් නම් මුහම්මද් තුමාගේ අනුගාමිකයෙකු විසින් ඉස්ලාමයේ ආරම්භ කාලයෙහි මිස්රය සිට පාලනය කරනු ලැබුනි.එවිට මිසර වාසීන්ගේ පැරණි ධර්මය හා පූජනීය ස්ථාන ඉස්ලාමීය පාලකයා විසින් ආරක්ෂා කළා පමණක් නොව, ඔවුන්ගේ ධර්මය තුල ඇති පටහැනිතා නිසා රෝමානුවන් විසින් ඔවුන්ට නියම කර තිබූ අසාධාරණ දඬුවමින්ද ඔවුන්ව මුස්ලිම් පාලකයන් ආරක්ෂා කළෝය.කොප්ටික් අරාබින්ට ඔවුන්ගේ දහම ඇදහීමේ නිදහස මුස්ලිම්වරුන් විසින් සහතික කරනු ලදුව අදත් එහි කොප්ටික් අරාබින් මිලියන 5 කටත් අධික සංඛ්‍යාවක් කිසිදු උපද්‍රවයකින් තොරව වාසය කරති.

## මුස්ලිම්වරුන් ඉන්දියාව අවුරුදු දාහක් පමණ පාලනය කළද එහි 80% මුස්ලිම් නොවන්නන්ය.



මුස්ලිම් ජාතිකයින් ඉන්දියාව අවුරුදු දාහක පමණ කාලයක් පාලනය කළෝය.එම සමෙයහි ඔවුන් 20% පමණක් සිටියද අන් ආගමිකයින්ගේ අයිතීන් ඔවුන් නිසි ලෙස ඉටු කර ඔවුන් වැඳුම් පිඳුම් කිරීමටද අවහිරි වූයේ නැත.සෑම අන්දමින් අපරාධ වලක්වමින් සිටීය.නමුත් කිසි විටෙක අන් ආගමිකයින්ව ඉස්ලාමය වැළඳ ගත යුතු යැයි බල කළා යනුවෙන් හෝ ඉස්ලාමය පැතිරීමට යම් සටනක් සිදු වූවා යැයි යනුවෙන්ද ඉතිහාසයේ සදහන් වී නැත.

## කිසිදු සටනක් හා සේනාවක් නොමැතිව ඉස්ලාමිය ඇතුළු වූ තවත් විශාල රටක.



ඉන්දුනේසියාව මුස්ලිම් ජාතිකයින් වැඩියෙන්ම වාසය කරන රටයි.එහි ජනගහනය මිලියන 250 ටත් අධිකව තිබෙන අතර එහි මුස්ලිම් පතිශතය 87% කි.හිජ්රි හයවනි සියවසෙහි එරටට සංක්‍රමණය වූ මුස්ලිම් ව්‍යාපාරිකයින්ගේ යහගුණ දැක අන් මිනිසුන් ඉස්ලාමය වැළඳ ගත්හ.පසුකලෙහි ඇතැම් සටන් ඇති වූවද මුස්ලිම්වරුන් විසින් කිසි ලේ වැගිරීමක් එහි සිදු වූයේ නැත.



# ඉස්ලාමය හා ඇතැම් මුස්ලිම් වරුන්ගේ තත්වය



# ඉස්ලාම්

ඉස්ලාම් ධර්මය දැනගත් කවුරුත් එය අලංකාර ගිතිගුණ උගන්වා ලොවෙහි යහපත පතුරවා මිනිසුන්ට ප්‍රයොජන වන දෑ කළ යුතු බව දිරි ගන්වන බව හා මිනිසුන් අතර සාමය පතුරවන ධර්මයක් යැයි ඔවුන් වටහා ගනු ඇත. ඉන් පසු ඔවුන් අවට සිටින ඇතැම් මුස්ලිම්වරුන් දැක ඔවුන්ව තමන් හැදෑරූ දැයට පටහැනිව දැක ‘මෙය මොන පටහැනි භාවයක්ද?’ යැයි පවසති. එසේ නම් මොවුන් දැකපු එම පුද්ගලයන් ධර්මයේ සත්‍ය අනුගාමිකයින් විය හැකිද ?

# ඉස්ලාම්

ඉස්ලාම් ධර්මය දැනගත් කවුරුත් එය අලංකාර ගතිගුණ උගන්වා ලොවෙහි යහපත පතුරවා මිනිසුන්ට ප්‍රයොජන වන දෑ කළ යුතු බව දිරි ගන්වන බව හා මිනිසුන් අතර සාමය පතුරවන ධර්මයක් යැයි ඔවුන් වටහා ගනු ඇත.ඉන් පසු ඔවුන් අවට සිටින ඇතැම් මුස්ලිම්වරුන් දැක ඔවුන්ව තමන් හැදෑරූ දැයට පටහැනිව දැක 'මෙය මොන පටහැනිභාවයක්ද?' යැයි පවසති.එසේ නම් මොවුන් දැකපු එම පුද්ගලයින් ධර්මයේ සත්‍ය අනුගාමිකයින් විය හැකිද ?.

ඇත්තෙන්ම මෙය යම් ව්‍යාකූල තත්වයකි.මෙම අවස්ථාවන්හි අප මදක් කල්පනා කාරී වීම අවශයයි.

- මුස්ලිම් යැයි කැඳවුන් ලබන්නා හෝ මුස්ලිම්වරයකු ලෙස වුවත් සෑම කෙනෙකුම 100% ඉස්ලාමය පිළිපදින්නන් යැයි අර්ථය නොවේ.මන්දයත් බොහෝ මුස්ලිම් වරුන් ඉස්ලාමයේ කටයුතුවල අඩුපාඩු ඇති කරනාව මෙන්ම විකෘති දෑ පිළිපදින්නන්ද සිටී.ඇතැම් මුස්ලිම්වරුන්ට ඉස්ලාමයේ නාමය හැර අන් කිසිවක් නොදන්නාවුන්ද සිටී.
- ජනයින්ගේ වැරදි ඔවුන් පිළිපදින ධර්මයට සම්බන්ධ කිරීම නොඋචිතයි.හිට්ලර් අපරාධ කළේ ඔහුගේ ධර්මය නිසා යැයි පැවැසිය නොහැකිය.එසේත් නොමැති නම් කිසිම ආගමක් නොපිළිපදින්නෙකු වැරදක් කළද එමගින් අදේව වාදයට දොස් පැවරීම වැරදියි.මන්දයත් අදෙව්වාද ජෝසප් ස්ටාලින් මිලියන දස ගණනක් මිනිමැරුම් කර ඇත.සෑම කෙනෙකුම කරන වැරදි එය ඔවුන් සතු මිස ඔවුන් පිළිපදින ධර්මයට අදාල නැත.

> "ජනයින්ගේ වැරදි ඔවුන් පිළිපදින ධර්මයට සම්බන්ධ කිරීම නොඋචිතයි.



- ඇත්තෙන්ම ඉස්ලාමයේ විශිෂ්ටත්වය හා මහගු බව පෙන්වන්නා පිරිසක් ලොවේ සෑම ප්‍රදේශයෙහිම සිටිනවා යන්න නිසැකයි.උතුරු ඉන්දියාවේ සිය දකුනු ආස්බානියාව තෙක් සෑම ස්ථානයන්හිම සෑම වකවානුවෙහිම මෙවන්නන්ගේ උදාහණයන් අපට තිබෙන්නේමයි.එබැවින් ධර්මය පිළිපදින්නන් අතරින් දෙආකාරයේම මිනිසුන් සිටින නිසා ධර්මය සැලකිය යුත්තේ එහි අනුගාමිකයින් විසින් නොවේ.

- නවීන කාලයේ වෛද්‍ය පීඨයේ ඇති ප්‍රයෝජනයන් කිසි කෙනෙකු විසින් ප්‍රතික්ෂේප කල නොහැකිය.එනමුත් අසීලාචාරී ඇතැම් වෛද්‍යවරුන් නිසා තමන් වෛද්‍ය නොකරනවා යැයි පැවසීම අන්වනයකි.එමෙන්ම දැනුම හැදෑරීමේ අවශ්‍යාතාවය අප කවුරුත් දනිමු.එනමුත් ඇතැම් පාසැල් හා ගුරුවරුන් සිටිනවා යැයි දැන ගත් විට සිය දරුවා දැනුමෙන් වැළකීම අසාධාරනයකි.එබැවින් සෑම කරුණක්ම සැළකිය යුත්තේ එම කරුණ මගින් මිස ඒවායේ උදාහරණයන් මගින් නොවේ.

- ඉස්ලාමයේ හතුරන් විසින් හා තමන් මුස්ලිම් යැයි පවසන්නන් විසින් ඉස්ලාමයේ හැදෑරීම්වලට පටහැනි කරුණු අප්‍රමාණක් විවරණ වෙමින් තිබුනද ඉස්ලාමයේ සත්‍ය හා පවිත්‍ර හැදෑරුම තවමත් එසේම තිබීම විශ්ම ජනක කරුණකි.

> "දැනුම හැදෑරීමේ අවශ්‍යා තාවය අප කවුරුත් දනිමූ එනමුත් ඇතැම් පාසැල් හා ගුරුවරුන් සිටිනවා යැයි දැන ගත් විට සිය දරුවා දැනුමෙන් වැළකීම අසාධාරනයකි



# නව කෝණයක්


ඔබගේ යහපත සඳහා ඔබ කුමන මගක් තෝරා ගත යුතු යන් කරුණෙහි ඔබ කොපමණ වතාවක් ව්‍යාකූලයට පත් වී තිබෙන්නේද? එසේ නම් ඔබගේ එම ව්‍යාකූලතාවය අදටත් තිබෙනු ඇත.

සෑම මිනිසෙකුටම ඇති ගෞරවය නම් ඔවුගේ යහපත වෙනුවෙන් යම් මගක් තෝරා ගැනීමේදී අන් අයගේ බලපෑමකින් තොරව ඔහුටම එය තීරනය කිරීම අයිතිය තිබීමයි.

යමෙකුගේ ඉලක්කය කරා ගමන් කිරීමේදී ඇති වන අපහසු තාවයන් හා බාධාවන් හා මුහුන දී ඉදිරියටම යන්නාගේ ධෛර්යය අප කවුරුත් අගය කරන්නෙමු.එසේ නම් තමන් පිළිපදින දෑ වැරදි යැයි පැහැදිලි වී තමන්ගේ නිරන්තර ජයෙහි මග තෝරා ගන්නාගේ ධෛර්යය එයටත් වඩා අගයි.මන්දයත් තම අහංකාරයට එරෙහිව සටන් කිරීම ඉතා අපහසු කරුණකි. කෙසේ වෙතත් නිසි මග තෝරා ගත් සැනින් එහි ප්‍රතිඵල ඔහුට ඔහුගේ සිතෙහි දැනෙනු ඇත.

ඉස්ලාමයේ මූලාශණ තුලින්  ඒ පිළිබඳව හැදෑරීමට යම් අවස්ථාවක් ඔබ වෙන් කළා මෙන් ඔබ කියවූ දෑ මදක් ගැඹුරෙන් සිතා බලා පරිවර්තනය කිරීමට පසුබට නොවන්න.

ඉස්ලාම් ධර්මයේ අලංකාරය හා ප්‍රසන්නය ඔබට පැහැදිලි වී ඉස්ලාමයේ සත්‍යය හා විශේෂත්වයන් පිළිගෙන දැනගැනීමට ඔබට අවශ්‍ය නම් මෙන්න ඒ සඳහා ඇති කියවීමේ හා දෙබස් සඳහා ඔබට ඇති අවස්ථාවයි.




GLOBAL MAP





ඔබ අපගේ පොත පරිපූර්ණයෙන් කියවා තිබීම අපට ගව්රවයකි.එමෙන්ම අපට විරුද්ධව හෝ අපේකෂව ඔබට ඇතැම් ප්‍රශ්න තිබෙන්නේ යැයි අප අපේක්ෂා කරන්නෙමු.එබැවින් ඔබගේ පක්ෂ හෝ අපේකෂපාතී ප්‍රශ්නයන් හා ඔබගේ අනෙකුත් මතයන් අපහා සමඟ බෙදා ගන්නට අප ඔබව සාදරයෙන් පිළිගනිමු.

ඉස්ලාම් සම්බන්දව අනෙකුත් කරුණු දැන ගැනීම පිණිස :


LAUNCHING CURiOSiTY JUST SCAN IT.!!

THISISLAM.net

ඔබගේ අත්දැකීම් අප සමඟ බෙදාග ැනීමට

info@modern-guide.com

SENHALI







- ඔබ අවට ඇති මාධ්‍යයන්ගෙන් ඉතා තර්කානුකූල ධර්මය වඩාත් පැහැදිලි රූපයකින් දැකීම අනවශ්‍ය යනුවෙන් ඔබ සිතන්නේද?

- ජාත්‍යන්තර සංඛ්‍යාලේඛන අනුව ඉතා වේගයෙන් වර්ධනය වන හා පුළුල්තම ධර්මය පැහැදිලිවම හැදෑරීමට මොහොතක් වෙන් කිරීම නුසුදුසු යැයි ඔබ සිතන්නේද?

- අන් ආගමිකයින්ගේ සංස්කෘති හා දර්ශන පිළිබඳ දැනුවත් වීමෙහි තෘප්තියක් ඔබ නොලබන්නේද?

- ඉස්ලාම් ධර්මය හා සම්බන්ධ ඔබ දැන සිටින කරුනු සත්‍ය දැයි බැලීම පිණිස ඉස්ලාමයේ සනාථ මූලාශ්‍රයන් වෙත ඔබේ බැල්ම යොමු නොකරන්නේ මන්ද? එසේ ඔබ කළ විට ඔබට ඔබේ බුද්ධියෙන්ම ඒ පිළිබඳ තීන්දුවක් ගත හැකියග

එසේ දැන ගැනීමට ඔබ සූදානම්ව සිටින්නේ නම් මෙම ග්‍රන්ථය ඔබගේ ර්න ගවේෂණායට උපකාරී වනවා නිසැකයි

9 786030 315055

LAUNCHING CURiOSiTY JUST SCAN IT.!!

MODERN GUIDE

THIS IS ISLAM

THISISLAM.info